SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA



# නිවැරදි සමබරතාව පවත්වා ගැනීම

වාර්ෂික වාර්තාව 2019



# නිවැරදි සමබරතාව පවත්වා ගැනීම

ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය හා සංවර්ධනය සහතික කිරීම සඳහා වූ දැඩි අපේක්ෂාවද සමඟ අපගේ කාර්යභාරය මනා ලෙස හඳුනාගනිමින්, වෙනස් වෙමින් පවතින මූල්‍ය වෙළෙඳපොළ හරහා අපි ගමන් කළෙමු. වෙළෙඳපොළ වර්ධනය ඉහළ නැංවීම හා පහසුකම් සැපයීම සහ වෙළෙඳපොළ අඛණ්ඩතාව, විනිවිදභාවය සහ ආයෝජකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම අතර නිවැරදි සමතුලිතතාවයක් ඇති කරමින් ආයෝජකයින්ගේ හා ව්‍යවසායකයින්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි නිවැරදි පරිසර පද්ධතියක් අපි නිර්මාණය කළෙමු.

## මෙහෙවර

"සාධාරණ, කාර්යක්ෂම, ක්‍රමානුකූල හා විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම"

## දැක්ම

"ඵලදායී, කාර්යක්ෂම හා ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනයේ දකුණු ආසියා කලාපයේ ප්‍රමුඛ පෙළේ නියාමකයා බවට පත්වීම"

## අප ගැන

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශ විෂය පථයට අයත් වේ.

# අන්තර්ගතයන්


සභාපතිතුමාගේ සමාලෝචනය | 4-5

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය | 6-12

විස්තීරණ, ක්‍රියාව නැඹුරුවූ, ප්‍රායෝගික සහ මිනියහැකි ප්‍රාග්ධන වෙළඳපොළ උපායමාර්ගයන් | 13

ප්‍රධාන නියාමන සහ සංවර්ධන උපායමාර්ග | 14-15

කොමිෂන් සභා සාමාජිකයන් | 16-21

ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය | 22-23

කළමනාකරුවන් | 24

කාර්ය මණ්ඩලය | 25-27

මෙහෙයුම් සමාලෝචනය | 28-54

අතිරේක තොරතුරු | 55-59

වසරේ කැපී පෙනෙන අවස්ථා | 60-63

**මූල්‍ය ප්‍රකාශන**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විගණකාධිපති වාර්තාව | 66-68

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 69

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 70

සංචිත වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 71

මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 72-73

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන | 74-88

පියවීම් සහතික කිරීමේ අරමුදල

විගණකාධිපති වාර්තාව | 89-90

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 91

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 92

ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 93

මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 94

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන | 95-96

# සභාපතිතුමාගේ සමාලෝචනය



**"මෙම සමාලෝචනයේදී, 2019 වර්ෂයේදී අපගේ කාර්යයන් සහ ඉදිරි වසර සඳහා අපගේ දැක්ම ඉදිරිපත් කිරීමටත් මම මෙය අවස්ථාවක් කර ගනිමි.නියාමන අඩුපාඩු හා ආවරණ පථයන් සැළකිල්ලට ගැනිම, අවදානම් අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම, වෙළෙඳපොළ අතරමැදි ආයතන අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම පසුගිය වසර තුළ අප විසින් සිදු කරන ලද කාර්යයන් අතර ප්‍රධාන වේ."**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ (SEC) සභාපතිවරයා ලෙස මාගේ පළමු වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම සතුටට කරුණකි. ව්‍යාපාරවලට තම අරමුදල් අවශ්‍යතා සපුරාගැනීමේ වැදගත් මූලාශ්‍රයක් මෙන්ම ආයෝජකයින්ට වඩාත් හොඳින් ධනය උත්පාදනය කරගැනීමේ අවස්ථාවන් සළසාදීම ප්‍රාග්ධන වෙළෙඳපොළවල් විසින් සිදුකරන ප්‍රධාන කාර්යභාරයයි. ප්‍රාග්ධන වෙළෙඳපොළ විසින් ඉටු කරනු ලබන මෙම වැදගත් කාර්යභාරය සැළකිල්ලට ගනිමින්, ව්‍යාපාර සහ ආයෝජකයින් යන දෙපාර්ශවයේම ඉල්ලීම් සපුරාලීම සඳහා සුදුසු රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහතික වේ. එබැවින්, අපගේ සේවාව  ලබා දීම සඳහා අප තුළ ඇති කැපවීම පිළිබඳව අප ස්ථිරව සිටින අතරම, ආයෝජක ආරක්ෂාව පිළිබඳව සහතිකවීම සහ දියුණු ප්‍රාග්ධන වෙළෙඳපොළක් පවත්වාගෙන යාමට අවශ්‍ය නම්‍යතාව අතර සමතුලිතතාවයක් පවත්වා ගැනිම අපගේ බලාපොරොත්තුවයි.

මෙම සමාලෝචනයේදී, 2019 වර්ෂයේදී අපගේ කාර්යයන් සහ ඉදිරි වසර සඳහා අපගේ දැක්ම ඉදිරිපත් කිරීමටත් මම මෙය අවස්ථාවක් කර ගනිමි.නියාමන අඩුපාඩු හා ආවරණ පථයන් සැළකිල්ලට ගැනිම, අවදානම් අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම, වෙළෙඳපොළ අතරමැදි ආයතන අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම පසුගිය වසර තුළ අප විසින් සිදු කරන ලද කාර්යයන් අතර ප්‍රධාන වේ.  ඒ අනුව ප්‍රථමයෙන් , 2019 වර්ෂය තුළදී අප විසින් අත්කරගන්නා ලද ප්‍රධාන ජයග්‍රහණ කිහිපයක් ඉස්මතු කිරීමට කැමැත්තෙමි.

## ශක්තිමත් නියාමන රාමුවක්

ප්‍රාග්ධන වෙළෙඳපොළ අඛණ්ඩතාව ශක්තිමත් කිරීම සහ සහතික කිරීම සඳහා නියාමනය අවශ්‍ය බව අප විශ්වාස කරන අතර එය වෙළෙඳපොළ සංවර්ධනයට  බාධාවක් නොවිය යුතුය. ඒ සඳහා නව සුරැකුම්පත් හුවමාරු පනත ප්‍රකාශයට පත් කිරීම ප්‍රමුඛතාවයක් ලෙස සළකනු ලැබුවේ ජාත්‍යන්තර අචාරධර්ම අනුව යමින් වඩා හොඳ හා කාර්යක්ෂම නියාමන රාමුවක් සැපයීම සඳහා ය. නව පනත කෙටුම්පත් කිරීම සඳහා සැළකිය යුතු වැඩ කොටසක් කර ඇති අතර එහි බොහෝ ආචාර විධිවිධාන අඩංගු වේ. කෙටුම්පත් කළ නීති මඟින් වැඩිදියුණු කරන ලද පාලන ප්‍රමිතීන්, මධ්‍යම ප්‍රති පාර්ශ්වයක් ලෙස ක්‍රියා කරන නිශ්කාෂණ ආයතනයක් පිහිටුවීමටත්, අසාමූහිකරණය වූ කොටස් හුවමාරුවක් නියාමනය කිරීම සඳහා විධිවිධාන සැළසීමටත්, නව වෙළෙඳපොළ අතරමැදියන් හඳුනා ගැනීමටත් සහ වෙළෙඳපොළ විෂමාචාරය සමඟ කටයුතු කළ හැකි පුළුල් පරාසයක බලාත්මක කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීමටත් අපේක්ෂා කෙරේ.

කෙටුම්පත් කළ පනත පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණද එය පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නොහැකි වූ අතර පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සැළකිල්ලට ගෙන නව පාර්ලිමේන්තුවට කෙටුම්පත් කළ පනත හඳුන්වාදීමේ ක්‍රියාවලිය මහ මැතිවරණයෙන් පසුව ආරම්භ කිරීමට සිදුවනු ඇත. මේ සඳහා සූදානම් වීමේ දී නව කොමිෂන් සභාව එහි අඩංගු විධිවිධාන සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. සමබර, ඵලදායී හා සමානුපාතික නියාමනයක් ඇති කරමින් රජය විසින් එය ඉක්මණින් බලාත්මක කිරීමට පියවර ගනු ඇතැයි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විශ්වාස කරයි.

## ක්‍රියාකාරී අවදානම් පදනම් කරගත් අධීක්ෂණය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන ආයතන අධීක්ෂණය කිරීම සහ මූල්‍යමය නිරවද්‍යතාවය සහ ව්‍යාපාර කාර්යක්ෂමතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සඳහා අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කළේය. ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් අංශයට බලපෑමක් විය හැකි මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී මූල්‍යකරණ අවදානම් සැලකිල්ලට ගනිමින්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම (AML/ CFT) පිළිබඳ කර්මාන්තයේ නියුතු ආයතනවල

අවබෝධය ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් අප විසින් නියාමනය කරනුලබන ආයතන සඳහා මඟ පෙන්වීම් සහ දැනුවත් කිරීමේ සැසි පැවැත්වූවෙමු. වර්ෂය තුළ, අවදානම් තක්සේරු කිරීමේ ප්‍රශ්නාවලිය සහ කොටස් තැරැව්කාර සමාගම් සඳහා අධීක්ෂණ රාමුව මගින් හඳුනාගෙන ඇති ඉහළ අවදානම් ක්ෂේත්‍රයන් මත පදනම්ව, අප විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් පිළිබඳව අවධානය යොමු කරමින් ඒතැන් පරීක්ෂාවන් සිදු කළෙමු. වඩාත් නිවැරදි, කාර්යක්ෂම හා ස්ථාවර නියාමන වාර්තාකරණ ක්‍රමයක් සහතික කිරීම සඳහා ඩිජිටල්කරණ වාර්තාකරණ සහ නියාමන ක්‍රියාවලීන් තවදුරටත් පුළුල් කිරීමේ හැකියාව පිළිබඳව අප දැනට ගවේෂණය කරමින් සිටිමු.

වඩාත් නිවැරදි, කාර්යක්ෂම හා ස්ථාවර නියාමන වාර්තාකරණ ක්‍රමයක් සහතික කිරීම සඳහා ඩිජිටල්කරණ වාර්තාකරණ සහ නියාමන ක්‍රියාවලීන් තවදුරටත් පුළුල් කිරීමේ හැකියාව පිළිබඳව අප දැනට ගවේෂණය කරමින් සිටිමු.

### ආයෝජක අධ්‍යාපනය සහ දැනුම වැඩි දියුණු කිරීම

ආයෝජකයින්ට තම ආයෝජන සම්බන්ධයෙන් වන ප්‍රතිලාභ සහ අවදානම් අගය කිරීමට නම්, ආයෝජනය කිරීමට පෙර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව නිසි අවබෝධයක් තිබීම අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, වැඩමුළු මෙන්ම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් බහුවිධ උපායමාර්ග ඔස්සේ රටපුරා ආයෝජකයින් දැනුවත් කිරීමේ සිය වැඩසටහන් අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වන ලද අපගේ වැඩසටහන් සඳහා 10,000 කට අධික පිරිසක් සහභාගී විය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඇති කරගත් ගිවිසුමට අනුව යමින් වාණිජ හා ආර්ථික විද්‍යාව හදාරණ උසස් පෙළ සිසුන් සඳහා පළාත් අතර රූපවාහිනී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් ආරම්භ කළේය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOSCO) විසින් සංවිධානය කරන ලද ලෝක ආයෝජක සතියට සමගාමීව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් භාෂා ත්‍රිත්වයම ආවරණය වන පරිදි අධ්‍යාපනික කාටූන්, දැන්වීම්, ලිපි ආදී මහජන දැනුවත් කිරීමේ ලේඛන ගණනාවක් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ක්‍රියාකාරකම් හරහා බලාපොරොත්තු වූයේ විධිමත් පෞද්ගලික මූල්‍ය සැළසුම් කෙරෙහි ජනතාවගේ අවධානය යොමු කිරීමයි.

### කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) සඳහා අරමුදල් රැස් කිරීම පුළුල් කිරීම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හට වෙළෙඳපොළ පදනම් කරගත් මූල්‍ය සම්පාදන මාර්ග යන් ඇතුළත් වී තිබීම ප්‍රාග්ධන වෙළෙඳපොළවලට අත්‍යවශ්‍යය. මේ අනුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව එක්ව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලයිස්තු ගත කිරීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කරමින් "එම්පවර් පුවරුව " දියත් කළේය. මෙම නව ලයිස්තුගත කිරීමේ පුවරුව හරහා ප්‍රාග්ධනය රැස්කර ගැනීම පිළිබඳ වැඩි දැනුවත්භාවයක් ඇති කිරීම සඳහා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව ප්‍රාදේශීය වාණිජ මණ්ඩල සමඟ එක්ව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනෙකුත් ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. ඒ අනුව පවත්වන ලද සෑම වැඩසටහන් සඳහාම 500 ට අධික පිරිසක් සහභාගී වූ අතර කථිකයන්, විද්වත් මණ්ඩල සාමාජිකයින් සහ ආයෝජන බැංකු ද ඊට සම්බන්ධ විය.

දළ දේශීය නිෂ්පාදිතයෙන් 50% කට වැඩි දායකත්වයක් ලබාදෙමින් සහ ඉහළ මට්ටමේ සමාජ-ආර්ථික ප්‍රතිලාභ ජනනය කරමින් ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳු නාරටිය ලෙස ක්‍රියාත්මක වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බැවින් ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා එවැනි ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට අප කැපවී සිටිමු.

### බාහිර පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වගකීම් ඉටුකිරීමට පහසුකම් සැපයීම සඳහා අපගේ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීම අත්‍යවශ්‍ය බව අප හොඳින් දන්නා කරුණකි. 2019 වර්ෂය තුළදී, ප්‍රතිපත්ති සහ නියාමන කරුණු සම්බන්ධ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සහ ප්‍රතිචාර ලබා ගැනීම සඳහා අප සුරැකුම්පත් ක්ෂේත්‍රයේ නියුතු සහභාගීවන්නන්, විශේෂයෙන් ලයිස්තුගත සමාගම්, විගණකවරුන්, කොටස් තැරැව්කරුවන් සහ ඒකක භාර කළමනාකරණ සමාගම් සමඟ නිරන්තරයෙන් සාකච්ඡා කළෙමු. මෙම සංවාද තුළින් අපට වටිනා අදහස් ලබාගැනීමට හැකි වූ අතර, ඔවුන් සමඟ අපගේ සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගන්නා බවට අප සහතික වෙමු. මෙය පුළුල් ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට සහ නියාමන ක්‍රියාවලිය විධිමත් කිරීමට පමණක් නොව, අදාළ වෘත්තීයමය කාර්යයන් සහ වගකීම් අවබෝධ කර ගැනීමටත් අගය කිරීමටත් උපකාරී වේ.

### ඉදිරියට ගමන් කිරීම

2020 ජනවාරියේදී පත් කරන ලද නව කොමිෂන් සභාව සුරැකුම්පත් ක්ෂේත්‍රයේ නියුතු පාර්ශවකරුවන් සමඟ රැස්වීම් මාලාවක් ආරම්භ කළ අතර ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීම පිළිබඳ ඔවුන්ගේ අදහස් ලබා ගනිමින් ඔවුන් මුහුණ දුන් දුෂ්කරතාවලටද සවන් දුන්නේය. මෙම සාකච්ඡා මගින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, වෙළෙඳපොළ නියාමනය ශක්තිමත් කිරීම සහ සරල කිරීම, නව නිෂ්පාදන හඳුන්වාදීම සහ ආයෝජකයින් සහ නිකුත් කරන්නන් යන දෙඅංශයේම දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා වටිනා යෝජනා සහ අවබෝධයන් ගෙන එන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව ඒකාබද්ධව කමිටු පත් කර මෙම අභියෝග කඩිනමින් විසඳීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

තවද, ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ක්‍රියාශීලී බව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සමඟ එක්ව ආයෝජකයින්ට පූර්ණ ඩිජිටල්කරණ අත්දැකීමක් ලබා දීමටත්, බාධාවකින් තොරව පශ්චාත් වෙළෙඳාම් සම්බන්ධ නිරවුල් කිරීම් සිදු කිරීමටත්, විද්‍යුත් ගැනුම්/විකුනුම් සටහන් සහ විද්‍යුත් වාර්තා ලබා ගැනීමටත් පියවර ගනු ඇත. නවෝත්පාදනයන් සහ පුළුල් ප්‍රාග්ධන වෙළෙඳපොළක් පවත්වාගෙනයාම සඳහා කොටස් තැරැව්කාර සමාගම් සඳහා අදාළ නීති, මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි නීති සහ ලැයිස්තුගත කිරීමේ නීති සමාලෝචනය කිරීමේ හා සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය දැනටමත් සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කටයුතුවල සාර්ථකත්වය උදෙසා ඔවුන් තුළ ඇති විශේෂඥ දැනුම හා අත්දැකීම් බෙදාහදා ගැනීම සහ ඔවුන්ගේ වටිනා කාලය කැප කිරීම පිළිබඳව සියලුම කොමිෂන් සභා සාමාජිකයින්ට ස්තූති කිරීමටද මා මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලයේ සහයෝගීතාව සහ නොසැලෙන සහයෝගය සහ කැපවී වැඩකිරීම පිළිබඳව මාගේ හදපිරි ප්‍රණාමය පිරිනැමීමට ද කැමැත්තෙමි. අවසාන වශයෙන්, ගරු. මුදල් අමාත්‍ය ධුරය හොබවන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාටත්, භාණ්ඩාගාරයේ ලේකම් එස් ආර් ආටිගල මහතාටත්, මුදල් අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ටත් සහ අපගේ සියලු පාර්ශවකරුවන්ටත් කොමිෂන් සභාවේ කටයුතු සුමටව පවත්වාගෙනයාම සඳහා සහයෝගය ලබා දීම වෙනුවෙන් ස්තූතිවන්ත වෙමි.



**ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න**
සභාපති
2020 ජූලි 20

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය



> **"රටේ වෙනත් බොහෝ ක්ෂේත්‍රවල මෙන්ම, අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළද බොහෝ අවස්ථාවන් මග හැරී ඇති අතර එහි සැබෑ හැකියාවට අනුව ක්‍රියා කර නොමැති බව මාගේ අදහසයි. සත්‍ය වශයෙන්ම ගත්විට, රටක් වශයෙන්, යහපත් හා සමෘද්ධිමත්භාවයක් සහිත සංවර්ධිත ජාතියක් බවට පත්වීමට අපි සිහින මැව්වෙමු. අප එම දැක්ම ඉටුකර ගැනීමට අවශ්‍ය නිපුණතාවන්, කැපවීමෙන් සහ උනන්දුවෙන් අත්පත් කර ගැනීමට ක්‍රියාකළ යුතුය."**

අපගේ කාර්යයන්හී සාරාංශයක් ඉදිරිපත් කිරීම සහ 2020 සහ ඉන් ඔබ්බට අපගේ අපේක්ෂාවන් සහ සැළසුම් පිළිබඳ හැඟවීමක් සැපයීමට හැකිවීම සතුටට කරුණකි.

රටේ වෙනත් බොහෝ ක්ෂේත්‍රවල මෙන්ම, අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළද බොහෝ අවස්ථාවන් මග හැරී ඇති අතර එහි සැබෑ හැකියාවට අනුව ක්‍රියා කර නොමැති බව මාගේ අදහසයි. සත්‍ය වශයෙන්ම ගත්විට, රටක් වශයෙන්, යහපත් හා සමෘද්ධිමත්භාවයක් සහිත සංවර්ධිත ජාතියක් බවට පත්වීමට අපි සිහින මැව්වෙමු. අප එම දැක්ම ඉටුකර ගැනීමට අවශ්‍ය නිපුණතාවන්, කැපවීමෙන් සහ උනන්දුවෙන් අත්පත් කර ගැනීමට ක්‍රියාකළ යුතුය.

අප ආර්ථිකය මුහුණ දෙන ෆිස්කල් හා මූල්‍යමය බාධාවන් සැලකිල්ලට ගෙන, රටේ වර්ධන මාවත නැවත ස්ථානගත කිරීමේදී පෞද්ගලික අංශය විසින් සිදු කළ යුතු  වැදගත් කාර්යභාරය වඩා පැහැදිලිය. ඒ අනුව, පෞද්ගලික අංශයේ වර්ධනයට රුකුලක් වන ශක්තිමත් ප්‍රාග්ධන වෙළෙඳපොළක අවශ්‍යතාවය වෙන කවරදාකටත් වඩා හොඳින් දැනේ. ශක්තිමත් හා තිරසාර ප්‍රාග්ධන වෙළෙඳපොළක් නිර්මාණය කිරීම සඳහා අදාළ සියලු අංශ නියාමනය කිරීමේ ප්‍රබල කර්තව්‍යයක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පැවරී ඇත.

### රටේ ආර්ථික වර්ධනය: ප්‍රාග්ධන වෙළෙඳපොළ ආර්ථික වර්ධනයට, සේවා නියුක්තියට, ආදායමට සහ ජීවන තත්වයට දායක විය හැකි අයුරු

මරියානා මසුකාටෝ සිය 'ව්‍යවසායකත්ව රාජ්‍ය නම් කෘතිය තුළින් පෙන්වාදී ඇත්තේ නවෝත්පාදන හා ආර්ථික පරිවර්තනය සඳහා රජය පෙරමුණ ගත යුතු බවයි. මසුකාටෝ සඳහන් කරන ආකාරයට චීනයේ, දකුණු කොරියාවේ, සිංගප්පූරුවේ, තායිවානයේ සහ මැලේසියාවේ ශීඝ්‍ර දියුණුවට තුඩු දුන්නේ රජය නිසි ප්‍රමාණයෙන් ව්‍යාපාර ලෝකයට මැදිහත් වූ නිසාය. එම මැදිහත්වීම පෞද්ගලික අංශයට ඇඟිලි ගැසීමක් නොවූ නමුත් වර්ධනය සහ නවීකරණය ළඟා කර ගැනීමට හොඳින් සැළසුම් කරන ලද සාර්ථක මැදිහත්වීමකි.

තවද, හාවඩ් විශ්වවිද්‍යාලයේ කීර්තිමත් මහාචාර්ය රිකාඩෝ හවුස්මාන් ද සඳහන් කරන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැටලුව බවට පත්ව ඇත්තේ ඇඟලුම් වැනි සාපේක්ෂව සරල නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරීමේ සිට ඉහළ වටිනාකමකින් යුත් භාණ්ඩ හා තාක්ෂණික වශයෙන් දියුණුවන අංශ කරා යාමට පෞද්ගලික අංශයට හැකියාවක් නොමැති බවයි.
ශ්‍රී ලංකාව මෙන් ම සමකාලීනව ඔවුන් ඇඟලුම් නිෂ්පාදනය ආරම්භ කළද, ආසියානු රටවල සාර්ථකත්වය වූයේ  ඔවුන්ගේ පෞද්ගලික අංශයට ඇඟලුම්වල සිට ඉලෙක්ට්‍රොනික හා යන්ත්‍රෝපකරණ නිෂ්පාදන වැනි වටිනා අංශ වෙත යාමට ඇති හැකියාවයි.

ආයෝජන අප පසුකර වෙනත් රටවල් වෙත යාම දැකීම කනගාටුවට කරුණකි. දකුණු කොරියාව, සිංගප්පූරුව සහ වියට්නාමයේ මූල්‍ය හා සුරැකුම්පත් නීති ප්‍රතිසංස්කරණ මගින් විදේශීය සෘජු ආයෝජන ගලා ඒම තීව්‍ර කරන බවට  පාඩම් අපට සපයන බව පැවසීමට මා කැමතිය. ඉතා මෑතකදී, වැඩිදියුණු වන ආර්ථිකයක් සහ නව ලැයිස්තුගත කිරීම් රැල්ලක් මගින් මහාපරිමාණ විදේශීය ආයෝජකයින්ගෙන් අරමුදල් ලබා ගැනීමට වියට්නාමයට හැකි වී තිබේ. වියට්නාම කොටස් මෑත අතීතයේ ආසියාවේ හොඳම ලාභ ලබාගෙන ඇති අතර, හො චි මිං කොටස් හුවමාරුව ලෝකයේ හොඳම කාර්ය සාධනයයන් සහිත කොටස් වෙළෙඳපොළවල් අතරින් එකක් බවට පත් වී තිබේ. පසුගිය දෙවසර තුළ එහි කාර්යසාධනය දෙගුණ වී තිබුණද, එම කොටස් හුවමාරුව තවමත්  "Frontier" වෙළෙඳපොළක් ලෙස වර්ගීකරණය  කර තිබීම දැකගත හැකිවේ.

විශ්ලේෂකයින් පවසන්නේ ගෝලීය අරමුදල් සහ ඉහළ ආයෝජකයින් මෙම රටවල ආර්ථිකයන් වෙත ඇදී යන්නේ ගෝලීය වෙළෙඳ පද්ධතියට ඔවුන් සම්බන්ධ වී තිබීම හා විදේශීය නිෂ්පාදන කේන්ද්‍රයක් ලෙස ස්ථානගතවී තිබීම හේතුවෙනි. එය තවදුරටත් වර්ධනය වීමට හේතුවක් වී

ඇත්තේ, චීනය සහ එක්සත් ජනපදය අතර පවතින මතභේදකාරී තත්ත්වය හමුවේ මෙම රටවල් වාසි අත්කරගනීමයි. එනම් ලොව ප්‍රධාන පෙළේ සමාගම් ද්විත්ව ලැයිස්තුගත කිරීම් සළකා බලමින් සිටීමත් චීනයෙන් හා එක්සත් ජනපදයෙන් නිෂ්පාදන විශාල ප්‍රමාණයක් ඉවත්ව ඉහළ වටිනාකමක් සහිත කර්මාන්තශාලා පිහිටුවා මෙම රටවල්වල ස්ථානගතවී මෙම රටවල්වල ආර්ථිකයට දායක වී වාසි අත්කරග නිමින් සිටීමයි.

මේ අනුව, ආර්ථික වර්ධනය හා පරිවර්තනය සඳහා රජයේ නිෂ්ක්‍රීය භූමිකාව සම්බන්ධ සාම්ප්‍රදායික මතයන් පිළිබඳ විවිධ මිථ්‍යාවන් අභියෝගයට ලක් නොවන්නේ නම්, අපේ රට මුහුණ දී සිටින ව්‍යුහාත්මක ආර්ථික අභියෝග යන්ට මුහුණ දීමක් අපට බලාපොරොත්තු විය නොහැක. ඒ හා සමානව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තවදුරටත් එහි සාම්ප්‍රදායික භූමිකාවට හා සාම්ප්‍රදායික ප්‍රවේශයට සීමා කළ නොහැක. වෙළෙඳපොළ නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධනය අතර නිවැරදි සමතුලිතතාවයක් පවත්වාගනිමින් ප්‍රාග්ධන උත්පාදනයට  දිරිගැන්වීමක් ලබා දීමේ අරමුණින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය භූමිකාව නැවත සකස් කිරීම අත්‍යවශ්‍ය වේ.

දීර්ඝ කථාවක් කෙටියෙන් කිවහොත්, මට මෙහිදී අවධාරණය කිරීමට අවශ්‍ය වන්නේ , එම රටවල රජයන් පෞද්ගලික අංශයට සමෘද්ධිමත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කර ඇති ආකාරය සහ ඔවුන් තම සමාගම්වලට ගෝලීය ප්‍රමුඛ පෙළේ සමාගම් බවට පත්වීමට පහසුකම් සළසා ඇති ආකාරයත් සහ එම මට්ටමට ළඟාවීමට අපගේ පෞද්ගලික අංශයට අප සහාය විය යුත්තේ ඇයි ද යන්නයි.

ඇත්ත වශයෙන්ම, අපගේ වෙළෙඳපොළ රජය එහි වර්ධනයට හා ව්‍යාප්තියට සහාය දෙන තෙක් බලා සිටින නමුත් ඒ සඳහා උදව් කිරීමට අප අතිශයින් මන්දගාමී වී සිටිමු. උදාහරණයක් ලෙස, දේපල ආයෝජන භාර වෙළෙඳපොළට හඳුන්වා දීමට අපට හැකියාව ලැබුණි. එහෙත් එය අවම වශයෙන් අවුරුදු දහයකට පෙර කළ යුතුව තිබූ දෙයකි.

### ප්‍රාග්ධන වෙළෙඳපොළට අපගේ ජාතික ප්‍රයත්නයන් සඳහා සහාය විය හැකිය.

විශේෂයෙන්ම අරමුදල් සංවර්ධන ව්‍යාපෘති සඳහා පොදු වෙළෙඳපොළ යොදාගැනීමේදී සහ ජාතික වැදගත්කමක් ඇති ක්‍රියාකාරකම් සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වයේදී රජයේ අරමුදල් සම්පාදන අවශ්‍යතාවයන් සඳහා උපකාරී වන  වෙළෙඳපොළ යටිතල පහසුකම් කොළඹ කොටස් හුවමාරුවට සතුව ඇත. පෞද්ගලික ආයතන මෙන් ම, රජයද ඉදිරියට යාමේ දී විවිධ හා විකල්ප අරමුදල් ප්‍රභවයන් කෙරෙහි ද අවධානය යොමු කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

වසර ගණනාවක් තිස්සේ අපගේ ගැටලුව වූයේ සැළකිය යුතු කාලයක් සඳහා අඛණ්ඩව 6% කට  වැඩි වර්ධන වේගයක් පවත්වා ගැනීමට අපට නොහැකිවීමයි. එහෙත් ආසියාවේ සාර්ථකත්වයන් දෙස බලන විට මෑත අතීතයේ සංවර්ධිත තත්ත්වය අත්කර ගත් රටවල් 7-8% කට වඩා අඛණ්ඩව වර්ධන අනුපාතයක් සැලකිය යුතු කාලයක් සඳහා පවත්වාගෙනයාමට සමත් වී ඇත. ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා මෑතකදී Daily FT පුවත්පත සමඟ සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් කියා සිටියේ පශ්චාත් වසංගත තත්ත්වය සමඟ පහළ වැටුණු ආර්ථික වාතාවරණය, ශ්‍රී ලංකාවට 7-8% ක වර්ධනයක් සඳහා සූදානම් වීමට හා ළඟා කර ගැනීමට මෙන්ම  තිරසාර සමාජ-ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා හොඳ අවස්ථාවක් වනු ඇති බවයි.

අනෙක් අතට ආචාර්ය ජයසුන්දර මහතා ප්‍රකාශ කර ඇත්තේ 2021 වසරේ සිට රජය නැවත මූල්‍ය ඒකාබද්ධතා මාවතට පිවිසෙනු ඇති බවයි. එම නිසා, අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළට ඉදිරියට යාමට හා නව අවස්ථා රාශියක් විවෘත කර තිබෙන වාතාවරණය තුළ මෙම මූලික අරමුණ අවබෝධකර ගනිමින් ව්‍යවසායක ප්‍රජාව සවිබල ගැන්වීමට සෑම උත්සාහයක්ම දැරීමට සුදුසුම අවස්ථාව මෙය වේ.

### ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ නියාමන අවශ්‍යතාවය.

නියාමනය පැත්තෙන් බලන විට, නව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කිරීම තුළින් බලාපොරොත්තු වනුයේ නියාමන බලතල සහ වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට ඉහළ ප්‍රමුඛතාවක් ලබාදීමයි. මේ අනුව, නව කොමිෂන් සභාව දැනට පනත් කෙටුම්පතේ විධිවිධාන සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.

පනත් කෙටුම්පත පිළිබඳ විවේචනයන් කේන්ද්‍රගත වී ඇත්තේ බාධක දෙකක් මත ය, ඉන් එකක් වන්නේ ඇතැම් විධිවිධානවල අර්ථය පිළිබඳ පැහැදිලි බව අඩුකමක් හෝ අර්ථයෙහි ව්‍යාකූල බවක් දක්නට ලැබීමයි.  අනෙක් බාධකය වන්නේ බලාත්මක කිරීමේ දඬුවම් පරාසයෙහි ප්‍රායෝගික නොවන බව පනත තුළ ගැටලු ඇති කරවිය හැකි වීම සහ එමගින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බලාත්මක කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ගැටළු මතු කරවිය හැකිවීමයි. ඇත්ත වශයෙන්ම, නව පනත මගින්, බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එතරම් අභියෝගාත්මක නොවිය යුතුය.

එබැවින්, මෙම වර්තමාන නීති කෙටුම්පත් කිරීමේ ප්‍රවේශය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි නීතියක් වනු ඇතැයි මා විශ්වාස කරන අතර එමගින් බලාත්මක කිරීම් වඩා පැහැදිලිව හා කඩිනම්ව සිදු කිරීමට හැකියාව ලැබේ. තවද එමගින් සාධාරණ ප්‍රතිපත්තියක් හෝ ප්‍රායෝගික සාධාරණීකරණයකින් තොරව වෙළෙඳපොළ ක්‍රියාකාරකම්වලට අනවශ්‍ය ලෙස බාධා නොකරන අතර පනත් කෙටුම්පත වෙත එල්ල වන විවේචනද  ඉවත් කරනු ඇත.

සමස්තයක් ලෙස සුරැකුම්පත් වෙළෙඳපොළක වර්ධනය තුළින් පෙන්නුම් කරනුයේ සමස්තයක් වශයෙන් වෙළෙඳපොළ සහ රට කෙරෙහි ජනතාව තබා ඇති විශ්වාසයයි. කෙසේ වෙතත්, මෑත අතීතයේ දී මතු වූ ගැටළු ගණනාවක් අපට අත්දකින්නට ලැබුණු අතර අපගේ වෙළෙඳපොළ කෙරෙහි ඇති අවංකභාවය හා විශ්වාසයේ යම් අඩුවක් ඊට බලපා ඇති ආකාරය අපි දුටුවෙමු. වෙළෙඳපොළ හා මූල්‍ය පද්ධතියට දැඩි බලපෑම් ඇති කරන ප්‍රමාණවත් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග සහ වෘත්තීයමයභාවය නොමැතිකම සමඟ මෙයට සම්බන්ධයක් ඇති බව  මා ප්‍රකාශ කිරීමට කැමතිය.

ආයෝජකයින්ගේ අයිතිවාසිකම් අප ආරක්ෂා කළ යුතු බැවින් උවමනාවට වඩා වැඩි නියාමනයක් තුළින් වර්ධනය හා ක්‍රියාකාරී පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අධෛර්යමත් කෙරෙන නිසා වෙළෙඳපොළ නියාමනය කිරීමේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නිවැරදි සමබරතාවයක් සහිතව කටයුතු කළ යුතු බවත් අප විසින් නියාමනය කරනු ලබන වෙළෙඳපොළෙහි විශ්වසනීයත්වය කිසිදු විටෙක පහත හෙළීමක් නොකළ යුතු බවත් මා මෙහිදී පැවසිය යුතුය.

> **"මරියානා මසුකාටෝ සිය 'ව්‍යවසායකත්ව රාජ්‍ය නම් කෘතිය තුළින් පෙන්වාදී ඇත්තේ නවෝත්පාදන හා ආර්ථික පරිවර්තනය සඳහා රජය පෙරමුණ ගත යුතු බවයි. මසුකාටෝ සඳහන් කරන ආකාරයට චීනයේ, දකුණු කොරියාවේ, සිංගප්පූරුවේ, තායිවානයේ සහ මැලේසියාවේ ශීඝ්‍ර දියුණුවට තුඩු දුන්නේ රජය නිසි ප්‍රමාණයෙන් ව්‍යාපාර ලෝකයට මැදිහත් වූ නිසාය. එම මැදිහත්වීම පෞද්ගලික අංශයට ඇඟිලි ගැසීමක් නොවූ නමුත් වර්ධනය සහ නවීකරණය ළඟා කර ගැනීමට හොඳින් සැළසුම් කරන ලද සාර්ථක මැදිහත්වීමකි."**

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

**"මේ අනුව, ආර්ථික වර්ධනය හා පරිවර්තනය සඳහා රජයේ නිෂ්ක්‍රීය භූමිකාව සම්බන්ධ සාම්ප්‍රදායික මතයන් පිළිබඳ විවිධ මිථ්‍යාවන් අභියෝගයට ලක් නොවන්නේ නම්, අපේ රට මුහුණ දී සිටින ව්‍යුහාත්මක ආර්ථික අභියෝගයන්ට මුහුණ දීමක් අපට බලාපොරොත්තු විය නොහැක. ඒ හා සමානව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තවදුරටත් එහි සාම්ප්‍රදායික භූමිකාවට හා සාම්ප්‍රදායික ප්‍රවේශයට සීමා කළ නොහැක. වෙළෙඳපොළ නියාමනය සහ වෙළෙඳපොළ සංවර්ධනය අතර නිවැරදි සමතුලිතතාවයක් පවත්වාග නිමින් ප්‍රාග්ධන උත්පාදනයට දිරිගැන්වීමක් ලබා දීමේ අරමුණින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය භූමිකාව නැවත සකස් කිරීම අත්‍යවශ්‍ය වේ.**
**දීර්ඝ කථාවක් කෙටියෙන් කිවහොත්, මට මෙහිදී අවධාරණය කිරීමට අවශ්‍ය වන්නේ , එම රටවල රජයන් පෞද්ගලික අංශයට සමෘද්ධිමත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කර ඇති ආකාරය සහ ඔවුන් තම සමාගම්වලට ගෝලීය ප්‍රමුඛ පෙළේ සමාගම් බවට පත්වීමට පහසුකම් සළසා ඇති ආකාරයත් සහ එම මට්ටමට ළඟාවීමට අපගේ පෞද්ගලික අංශයට අප සහාය විය යුත්තේ ඇයි ද යන්නයි."**

අපට ලැබී ඇති බලතල වලට අනුකූලව වෙළෙඳපොළ තුළ අවංකභාවය පවත්වාගැනීමේ අරමුණින් අවදානම අධීක්ෂණය කිරීම, අවම කිරීම සහ කළමනාකරණය කිරීම මෙන්ම පූර්ණ හා නිවැරදි තොරතුරු බෙදා හැරීම තුළින් ආයෝජකයින් ආරක්ෂා වන බවටද සහතික වේ. අනාවරණය කිරීම් පිළිබඳව සහතික වීමෙන් අප බලාපොරොත්තු වනුයේ ආයෝජකයින්ට දැනුවත් ආයෝජන තීරණ ගැනීමට, ආයෝජකයින් තුළ වෙළෙඳපොළ සම්බන්ධව හැඟීම් වැඩි දියුණු කිරීමට මෙන්ම නුසුදුසු ආයෝජන හැසිරීම් වල යෙදීමෙන් වැළැක්වීමයි. මේ අනුව, අනුකූල නොවීම්වලට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දැඩි බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන අතර දැඩි නීති රීති පැනවීම ද අඛණ්ඩව සිදු කරනු ඇත.

## උපායමාර්ගික ආයෝජකයෙකුගේ ඇතුලත්කර ගැනීම සඳහා පහසුකම් සැළසීමේ අවශ්‍යතාවය

පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නිසි ලෙස ක්‍රියාත්මක නොවූ බව අප පිළිගත යුතුය. කිසිදු සැකයකින් තොරව අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ස්ථානගත කළ යුත්තේ බැංකු අංශයට අනුපූරකව සහ රටේ වර්ධන ඉලක්කවලට සහාය වීම සඳහා ය. බොහෝ රටවල වේගවත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීම සඳහා වෙළෙඳපොළ ශක්තිමත් කිරීම ඉතා වැදගත් වන අතර මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා ආයෝජකයින් සහ මහජන විශ්වාසය මෙන්ම වෙළෙඳපොළවල අවංකභාවය  සහ ඔවුන්ගේ සහභාගීවන්නනන්ද අත්‍යවශ්‍ය වේ.

චාලි මන්ගර් පවසන පරිදි, "වැඩ කරන්නේ කුමක්ද, වැඩ නොකරන්නේ කුමක්ද සහ වැඩ නොකරන්නේ ඇයි ද" යන්න අප විසින් සොයාගත යුතුය. ඇත්ත වශයෙන්ම, යම් කෙනෙක් තම ශක්තීන් හා දුර්වලතා හොඳින් හඳුනා ගන්නේ නම් ඔහුට වොරන් බෆට් වැනි ව්‍යාපාරික හවුල්කරුවෙකු සොයා ගැනීම අපහසු නොවන බව මන්ගර් පවසයි. එලෙසම ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා කැප වූ කොටස් හිමියෙකු ලෙස " උපායමාර්ගික ආයෝජකයෙකු" කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඇතුළත් කර ගැනීමට අප පහසුකම් සැලසිය යුතුව ඇති අතර එමගින් අපව තව තවත් ඉදිරියට ගෙන යනු ඇත.

කොළඹ කොටස් හුවමාරුව සහ අපගේ පාර්ශවකරුවන් සමඟ සමීප සාකච්ඡා පැවැත්වීමේ  වටිනාකම මම හඳුනා ගතිමි. හුදු අනුකූලතාවයෙන් ඔබ්බට ගිය සංස්කෘතියක් ඇති කිරීමට අපට හැකි වනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි. ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළෙඳපොළට ඵලදායී ලෙස තරඟ කරමින් රටට අරමුදල් ගලා ඒම ඉහළ නැංවීමට හැකි වන පරිදි  නව නිෂ්පාදන හා වෙළෙඳපොළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් නව වැඩසටහන් රැසක් සඳහා  පහසුකම් සැලසීමට අපි උනන්දු වූයෙමු. ආයෝජන ගමනාන්තයක් ලෙස ආයෝජකයින් අවධානය යොමු කරන අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවන් වන ආකර්ශනීය තක්සේරු කිරීම්, හොඳින් පාලනය කරන ලද සහ ශක්තිමත් නියාමන රාමුවක්, නවීන යටිතල පහසුකම් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (IFRS) අනුකූල වන ලැයිස්තුගත සමාගම් අපගේ වෙළෙඳපොළට ඇත. එමනිසා, අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළට ඇති හැකියාව හා ඔරොත්තු දීමේ ශක්තිය පිළිබඳව අපි සුබවාදීව සිටිමු.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මෑතකදී ගනු ලැබූ සමහර මුල පිරීම් පිළිබඳව වඩාත් නිශ්චිත තොරතුරු ඉදිරිපත් කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නවීන නියාමකයෙකු ලෙස නැවත ස්ථානගත කිරීම

- **කොළඹ කොටස් හුවමාරුවේ මූලික කාර්යයන් ඩිජිටල්කරණය කිරීමේ ඒකාබද්ධ කමිටුව**

  අපගේ වෙළෙඳපොළට ගැටලුකාරී කාල පරිච්ඡේදය තුළ සිය මූලික ක්‍රියාකාරකම් සිදුකිරීමේ හැකියාව පෙන්නුම් කිරීමට සුදුසු තත්වයක නොසිටි අතර, එයින් ඉස්මතු කර පෙන්නුම් කරනුයේ කිසිදු ප්‍රමාදයකින් තොරව කොටස් වෙළෙඳපොළේ මූලික කාර්යයන් ඩිජිටල්කරණය කිරීමේ අවශ්‍යතාවයි. ඒ අනුව, කොළඹ කොටස් හුවමාරුව ඩිජිටල්කරණය පිළිබඳව සොයා බැලීම සඳහා  සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ඒකාබද්ධ කමිටුවක් පත් කරන ලදී. ඩිජිටල්කරණය කිරීමෙන්, කොටස් වෙළෙඳපොළේ සියළුම මූලික ක්‍රියාකාරකම් ඩිජිටල් ලෙස සිදුකිරීමට මෙන්ම විද්‍යුත් වශයෙන් නිශ්කාෂණය සහ බේරුම් කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවට අවශ්‍ය යාන්ත්‍රණයන් හඳුන්වා දීමට අපි අපේක්ෂා කරමු. කොටස් තැරැව්කාර සමාගම් සඳහා අදාළ නීති, මධ්‍යම තැන්පතු ක්‍රමය සඳහා වන නීති සහ ලැයිස්තුගත කිරීමේ නීති ආදිය සඳහා අවශ්‍ය සංශෝධන කොමිෂන් සභාව විසින් මෑතකදී අනුමත කරන ලදී. ප්‍රාග්ධන වෙළෙඳපොළ ඩිජිටල්කරණයට පහසුකම් සැළසීම සහ දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජකයින්ගේ ඇඟිලි තුඩු අගටම ගෙන ඒම මෙම කාර්යයන් තුළින් අපේක්ෂා කෙරේ.

  මේ සම්බන්ධයෙන්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධාරණය කළේ ගෝලීය සුරැකුම්පත් වෙළඳපොලවලට සමගාමීව නවීන සුරැකුම්පත් වෙළඳපොළක් ඇති කිරීම හා සමස්ථයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රාග්ධන වැඩිදියුණු කිරීමේ අරමුණින් තැරැව්කරුවන් රට වෙනුවෙන් ඔවුන්ගේ කාර්යය ඉටු කළ යුතු බැවින් සමස්ත තැරැව්කාර ප්‍රජාවගේ සහයෝගය ඉතා වැදගත් බවයි. සත්‍ය වශයෙන්ම, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව  ඒකාබද්ධ කමිටුව මෙතෙක් ලබා ඇති දැවැන්ත ප්‍රගතිය බොහෝ සම්මානයට පාත්‍ර විය යුතු අතර, වෙළෙඳපොළ නවීකරණය කර එය සියලු තත්වයන් යටතේ ක්‍රියාත්මක කරවීම මූලික අපේක්ෂාවයි.

**"වසර ගණනාවක් තිස්සේ අපගේ ගැටලුව වූයේ සැළකිය යුතු කාලයක් සඳහා අඛණ්ඩව 6% කට වැඩි වර්ධන වේගයක් පවත්වා ගැනීමට අපට නොහැකිවීමයි. එහෙත් ආසියාවේ සාර්ථකත්වයන් දෙස බලන විට මෑත අතීතයේ සංවර්ධිත තත්ත්වය අත්කර ගත් රටවල් 7-8% කට වඩා අඛණ්ඩව වර්ධන අනුපාතයක් සැලකිය යුතු කාලයක් සඳහා පවත්වාගෙනයාමට සමත් වී ඇත. ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා මෑතකදී Daily FT පුවත්පත සමඟ සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් කියා සිටියේ පශ්චාත් වසංගත තත්ත්වය සමඟ පහළ වැටුණු ආර්ථික වාතාවරණය, ශ්‍රී ලංකාවට 7-8% ක වර්ධනයක් සඳහා සූදානම් වීමට හා ළඟා කර ගැනීමට මෙන්ම තිරසාර සමාජ-ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා හොඳ අවස්ථාවක් වනු ඇති බවයි."**

- **ප්‍රාග්ධන වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා ඒකාබද්ධ කමිටුව**

  ප්‍රාග්ධන වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සලකා බැලීමටත්, සාමාන්‍ය ජනතාව අතර දැනුවත්භාවය ඇති කිරීමටත්, ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමටත්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ නියෝජිතයින් සමඟ ඒකාබද්ධ කමිටුවක් පත් කරන ලදී. තවද, මෙම කමිටුවේ අපේක්ෂාව වනුයේ ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා ප්‍රාග්ධන වෙළඳපොළ භාවිතා කිරීමට සමාගම් දිරිමත් කිරීම, මනා දැක්මක් ඇතිකිරීම හා කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් සහයෝගීතාව වර්ධනය කිරීම, ආයෝජක ප්‍රජාව පුළුල් කිරීමේ අරමුණින් පාර්ශවකරුවන්ගේ අධ්‍යාපනය සහ දැනුවත්භාවය වර්ධනය කිරීම සහ අවසානයේ රටේ සියලුම භූගෝලීය කලාපවල සහ ජාත්‍යන්තරව සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ මහජන සහභාගීත්වය වර්ධනය කිරීමයි.

  අනෙක් අතට, කොළඹ කොටස් හුවමාරුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර පුළුල් පරාසයක විහිදී ඇති සමාගම් කොටස් වෙළෙඳපොළ තුළ ලයිස්තුගත කිරීම් සඳහා අවස්ථාවක් උදා කිරීම සඳහා ලයිස්තුගත කිරීමේ නීති සංශෝධන හඳුන්වා දුන්නේය. මෙම සංශෝධන මඟින් අළුතින් කොටස් නිකුත් කරන්නන්ට ආදායම් උත්පාදනය සහ නව මුදල් ප්‍රවාහ මාර්ග ඔස්සේ අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට නව මංපෙත් නිර්මාණය වනු ඇත.

- **කොළඹ කොටස් හුවමාරුව තුළ විදේශ සමාගම්වල ද්විත්ව ලැයිස්තුගත කිරීම් හා සම්බන්ධ ඒකාබද්ධ කමිටුව**

  වෙළෙඳපොළ විශාලත්වය හා ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සඳහා ගත් පියවරවල කොටසක් ලෙස සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම යටතේ, කෙටි කාලීනව ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා රට තුළ වාතාවරණයක් සැකසීමේ වැදගත්කම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හඳුනාගෙන තිබේ. එබැවින්, කොළඹ කොටස් හුවමාරුව තුළ වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයට, ද්‍රවශීලතා මට්ටම්වලට බාධා වන බාධක හඳුනා ගැනීමට ඒකාබද්ධ කමිටුවක් පත් කරන ලදී. තවද ඇමරිකා එක්සත් ජනපදය-චීනය වැනි රටවල් අතර සිදුවන භූදේශපාලනික ආතතීන් තුළින් ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළෙඳපොළට තරඟකාරී වාසියක් ලබා ගැනීමට හැකි වන සාධක කෙරෙහි අවධානය යොමු කරමින් හිතකර ප්‍රතිපත්තියක් සහ නියාමන ප්‍රාග්ධන වෙළෙඳපොළ රාමුවක් සැකසීම ට කටයුතු කරන ලදී. මෙම කාර්යය හරහා අපේක්ෂා කළ තවත් අරමුණක් වූයේ මෝර්ගන් ස්ටැන්ලි කැපිටල් ඉන්ටර්නැෂනල් (MSCI) නැගී එන වෙළෙඳපොළ තත්ත්වය කරා ඔසවා තැබීමට ශ්‍රී ලංකාවට පුළුල් ලෙස පහසුකම් සැළසෙනු ඇති බවයි.

**ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළට දේපළ වෙළෙඳාම් ආයෝජන භාර (REIT) හඳුන්වා දීම**

වර්ෂ 1997 දී සාංගමික ණය සුරැකුම්පත් හඳුන්වා දී වසර 23 කට පසු නව උපකරණයක් ලෙස ලයිස්තුගත දේපොළ වෙළෙඳාම් ආයෝජන භාර ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වා දීම විශේෂ සිදුවීමක් සනිටුහන් කර ඇත. දේපොළ වෙළෙඳාම් ආයෝජන භාරයට ලැබෙන ආදායමෙන් 90% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඒකක හිමියන් අතර බෙදා හැරෙන අතර දේපළ වෙළෙඳාම් ආයෝජන භාරයේ ආයෝජනය කරන ආයෝජකයන්ගෙන් ලැබෙන ප්‍රාග්ධනය දේපොළ වෙළෙඳාම් සහ යටිතල පහසුකම් සංවර්ධනයට යෙදවේ. මෙම දේපොළ වෙළෙඳාම් ආයෝජන භාර හරහා සුළු පරිමාණ ආයෝජකයන්ට දේපොළ වෙළෙඳාම් අංශයේ වර්ධනයෙන් සෘජුවම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. කළමනාකරණ සමාගම් වලට සහ සෘෂඹ වල භාරකරුවන්ට අදාළ වන නීති ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කරන අතර සෘෂඹ ලයිස්තුගත කිරීම සක්‍රීය කිරීම සඳහා ලයිස්තුගත කිරීමේ නීති කෙටුම්පත් කරන ලෙස කොළඹ කොටස් හුවමාරුවට උපදෙස් දෙන ලදී.

- **සුරැකුම්පත් හුවමාරු (SE) පනත් කෙටුම්පත සංශෝධනය කිරීම**

  සුරැකුම්පත් හුවමාරු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට සභාගත කර සැළකිය යුතු කාලයක් ගත වුවද එය පාර්ලිමේන්තුව විසුරුවා හැරීමත් සමඟ සාකච්ඡාවට ගැනීමට නොහැකි විය. කෙටුම්පත් කළ පනත නව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ඉක්මනින් ආරම්භ කිරීමට සිදුවනු ඇත. මෙම කර්තව්‍යය සැළකිල්ලට ගනිමින්, නව කොමිෂන් සභාව මේ වන විට විධිවිධාන විස්තරාත්මකව සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.
  මේ සම්බන්ධයෙන් තවදුරටත් සලකා බැලීමේදී, නව සුරැකුම්පත් හුවමාරු පනත් කෙටුම්පත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි නීතියක් බවට පරිවර්තනය කිරීමට හා නව පනත සමඟ එකඟ වීමට අවශ්‍ය නීතිමය විශේෂඥතාව හා බුද්ධිමත්භාවයක් සහිත සභාපතිවරයකු හා කොමිසමක් සිටීම අපට වාසනාවකි.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

**"ආයෝජකයින්ගේ අයිතිවාසිකම් අප ආරක්ෂා කළ යුතු බැවින් උවමනාවට වඩා වැඩි නියාමනයක් තුළින් වර්ධනය හා ක්‍රියාකාරී පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අධෛර්යමත් කෙරෙන නිසා වෙළෙඳපොළ නියාමනය කිරීමේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නිවැරදි සමබරතාවයක් සහිතව කටයුතු කළ යුතු බවත් අප විසින් නියාමනය කරනු ලබන වෙළෙඳපොළෙහි විශ්වසනීයත්වය කිසිදු විටෙක පහත හෙළීමක් නොකළ යුතු බවත් මා මෙහිදී පැවසිය යුතුය."**

- **පුද්ගලික හා රාජ්‍ය හවුල්කාරිත්වය (PPP)**

  පුද්ගලික හා රාජ්‍ය හවුල්කාරිත්වය මගින් අවදානම් සහ වගකීම් බෙදාහදා ගැනීම තුළින් රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම කුසලතා හා සම්පත් ඒකාබද්ධ වන අතර එමගින් තරඟකාරීත්වය වැඩිදියුණු වී රටට විශාල ප්‍රතිලාභ රැසක් ලැබෙනු ඇත. රට තුළ යටිතල පහසුකම් මූල්‍යකරණ ක්‍රමයක් ලෙස පුද්ගලික හා රාජ්‍ය හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, කොළඹ කොටස් හුවමාරුව තුළ පුද්ගලික හා රාජ්‍ය හවුල්කාරිත්වය සහිත යටිතල පහසුකම් ලැයිස්තුගත කිරීමට හැකි ආකෘතියක් අපසකස් කරමින් සිටිමු.

- **ඒකාබද්ධ මධ්‍යම ප්‍රතිපාර්ශව යාන්ත්‍රණය (CCP) සහ ගෙවීම් වලට එදිරිව බෙරුම්කිරීම (DVP)**

  ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ස්ථිරවම විශ්වාස කරන්නේ වෙන වෙනම මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතන දෙකක් තිබීමට වඩා තනි මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් තිබීමෙන් රටට වාසි සැළසෙන බවයි. එම අදහස යථාර්ථයක් බවට පත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව ඒකාබද්ධ මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් ස්ථාපිත කිරීමට ඇති හැකියාව පිළිබඳව විමසා බලන ලදී. ගෙවීම් වලට එදිරිව බේරුම් කිරීමේ යාන්ත්‍රණයක් (DVP) ක්‍රියාත්මක කිරීම සඳහා වන මෙහෙයුම් කාර්යයන් සඳහා වන පිරිවැය මෑතකදී කොමිසම විසින් අනුමත කරන ලද අතර, කොළඹ කොටස් හුවමාරුව විසින් 2020 අවසාන කාර්තුවට පෙර ගෙවීම් වලට එදිරිව බේරුම් කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධතිමය වෙනස් කිරීම් සිදු කරමින් සිටී.

- **පාර්ශවකරුවන් සමඟ පැවති සම්බන්ධතා**

  තවද, සභාපතිවරයා සහ නව කොමිෂන් සභාව විසින් සුරැකුම්පත් ක්ෂේත්‍රයේ නියලී සිටින පාර්ශවකරුවන් සමඟ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීම පිළිබඳ අදහස් ලබා ගැනීම සහ ඔවුන් මුහුණ දෙන දුෂ්කරතාවලට විසඳුම් ලබාදීම සඳහා රැස්වීම් මාලාවක් පවත්වන ලදී. මෙම උපදේශන මගින් යටිතල පහසුකම් සංවර්ධනය හා ශක්තිමත් කිරීමටත් නියාමනයන් සරල කිරීමටත් අවබෝධයක් ලබා දී ඇත.

- **ප්‍රතිපත්ති පර්යේෂණ හා විශ්ලේෂණ අංශය දියුණු කිරීම**

  නිරන්තරයෙන් වෙනස්වීම් වලට භාජනය වන ආර්ථික හා මූල්‍යමය තත්වයන් සමඟ නොගැළපීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තුළ පර්යේෂණ හා ප්‍රතිපත්ති අංශයක් සැකසීමට හේතු විය. ප්‍රාග්ධන වෙළෙඳපොළට සහ සමස්තයක් වශයෙන් රටට ප්‍රයෝජනවත් විය හැකි ආර්ථික,වෙළෙඳපොළ උපායමාර්ග සහ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම හා යෝජනා කිරීම සඳහා අප ආයතනය පර්යේෂණ හා දත්ත විද්‍යාඥයාගේ කාර්යභාරය ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### නැවත සලකා බැලීමේදී

2019 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ක්‍රියාකාරකම් රාශියක් ආරම්භ කරන ලද අතර ඒ පිළිබඳව ඉදිරි පිටුවල විස්තරාත්මකව සාකච්ඡා කරනු ඇත. හිටපු සභාපති රනෙල් ටී. විජේසිංහ මහතාට සහ කොමිෂන් සභාවටත් සහ හිටපු අධ්‍යක්ෂ ජනරාල් වජිර විජේගුනවර්ධන මහතාටත් 2019 වර්ෂය තුළදී කරන ලද දායකත්වය පිළිබඳව මාගේ අවංක අගය කිරීම සඳහන් කිරීමට කැමැත්තෙමි.

### කොළඹ කොටස් හුවමාරුව හා සම්බන්ධ පුළුල් විගණනය

සුපරීක්ෂණ ක්ෂේත්‍රය තුළ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් හුවමාරුවට වසර පහක කාලයක් සඳහා ලබා දී ඇති බලපත්‍රය අළුත් කිරීමට පෙර කොටස් හුවමාරුවේ පාලනයන්, වෙළෙඳපොළ මෙහෙයුම්, ක්‍රියාවලීන් පිළිබඳ පුළුල් විගණනයක් සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආයෝජක ප්‍රජාව ආරක්ෂා කිරීම සහ "නියමිත සහ සුදුසු" පුද්ගලයින්ට පමණක් බලපත්‍ර ලබා දීමේ අරමුණින් වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ ලියාපදිංචි කිරීම් සිදු කරන ලදී.

### ප්‍රාග්ධනය උත්පාදනයට පහසුකම් සැපයීම

ප්‍රධාන පුවරුවේ හා දිරිසවි පුවරුවේ ලැයිස්තුගත වීම සඳහා සුදුසුකම් සැපිරීමට හැකියාවක් නොමැති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ලැයිස්තුගත කිරීම සඳහා "එම්පවර් පුවරුව නමින් නව පුවරුවක් 2018 ජූලි මාසයේදී හඳුන්වා දීමට අප කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සමඟ කටයුතු කළෙමු. එය හඳුන්වාදීමෙන් පසුව, එහි ලැයිස්තුගත කිරීම පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සඳහා රට පුරා ව්‍යවසායකයින් සමඟ සම්බන්ධවෙමින් තෝරාගත් නගරයන්හී දේශණ සහ වැඩමුළු පවත්වන ලදී.

බහු මුදල් පුවරුවක් පිහිටුවීම (MCB) ගනු ලැබූ තවත් ප්‍රධාන පියවරක් වන අතර එමගින් විදේශීය සමාගම්වල කොටස් ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත කර විදේශ මුදල්වලින් වෙළෙඳාම් කිරීමේ හැකියාව ලැබේ.සළකා බලන වර්ෂය තුළදී සාංගමික ණයකර ලැයිස්තුගත කිරීමට අදහස් කරන දේශීය සමාගම්වලට බහු මුදල් පුවරුවේ MCB පහසුකම් වැඩිකිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන්ද විමසා බලන ලදී.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ආයෝජන දිරිමත් කිරීම

ශ්‍රී ලංකාවට සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින්, කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එක්ව සිංගප්පූරුවේදී "Invest Sri Lanka" තේමාව යටතේ සම්මන්ත්‍රණයක් පැවැත්වූ අතර එයට විදේශීය ආයෝජක ප්‍රජාවගෙන් ධනාත්මක ප්‍රතිචාරයක් ලැබුණි. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ඇති ආයෝජන අවස්ථා පිළිබඳ පෙන්වාදීමේ සහ දැනුවත් කිරීමක් ඇති කිරීමේ උපාය මාර්ග සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිටින විදේශ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල ප්‍රධානීන් සඳහා හිටපු සභාපති රනෙල් විජේසිංහ මහතා ද සාකච්ඡා මාලාවක් ආරම්භ කළේය.

### පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ වන්දි ලබා දීම

ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම අපගේ ප්‍රධාන නියාමන අරමුණු වලින් එකකි. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා, සුළු පරිමාණ ආයෝජකයින්ට ඔවුන්ගේ පැමිණිලි විසඳා ගැනීම සඳහා එලදායී යාන්ත්‍රණයක් සැපයිය යුතුය. ඒ අනුව සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය ස්වාධීන, සාධාරණ හා කාර්යක්ෂම බව සහතික කිරීම සඳහා කටයුතු කළේය.

**"චාලි මන්ගර් පවසන පරිදි, "වැඩ කරන්නේ කුමක්ද, වැඩ නොකරන්නේ කුමක්ද සහ වැඩ නොකරන්නේ ඇයි ද" යන්න අප විසින් සොයාගත යුතුය. ඇත්ත වශයෙන්ම, යම් කෙනෙක් තම ශක්තීන් හා දුර්වලතා හොඳින් හඳුනා ගන්නේ නම් ඔහුට වොරන් බෆට් වැනි ව්‍යාපාරික හවුල්කරුවෙකු සොයා ගැනීම අපහසු නොවන බව මන්ගර් පවසයි. එලෙසම ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා කැප වූ කොටස් හිමියෙකු ලෙස" උපායමාර්ගික ආයෝජකයෙකු" කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඇතුළත් කර ගැනීමට අප පහසුකම් සැලසිය යුතුව ඇති අතර එමගින් අපව තව තවත් ඉදිරියට ගෙන යනු ඇත."**

### ලයිස්තුගත පොදු සමාගම් සහ විගණකවරුන් සමඟ පැවති සාකච්ඡා

අප නිරන්තරයෙන් අපගේ පාර්ශවකරුවන් වෙත ළඟා වෙමින් සාකච්ඡාවන් පවත්වමින් ඔවුන්ට මුහුණ දීමට සිදුවන ගැටළු පිළිබඳව පුළුල් ලෙස අදහස් ලබාගන්නා ගත්තේය. සළකා බලන වර්ෂය තුළදී, හිටපු සභාපති රනෙල් විජේසිංහ මහතාගේ අනුග්‍රහය යටතේ, වෙළෙඳපොළ සහභාගීකරුවන්, ඔවුන්ගේ වගකීම් අවබෝධ කර ගැනීම සහතික කිරීම සඳහා අනුකූලතාව, පවත්නා නීති වෙනස් කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි පවතින වර්තමාන ගැටළු සම්බන්ධයෙන් ලයිස්තුගත සමාගම්, විගණකවරුන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාවක් පැවැත්වූවෙමු.

### වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමය (CFA Society) සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹීම

සළකා බලන වර්ෂය තුළදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ සංගමය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹුණු අතර එමගින් අපේක්ෂා කළේ ආයතන දෙක එක්ව වැඩකරමින් ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ අචාරධර්ම සංග්‍රහයන් සහ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීමයි. තවද ආයෝජකයින්ගේ අයිතිවාසිකම් සහ ඒකාබද්ධ අධ්‍යාපනික වැඩසටහන් පිළිබඳව සහයෝගයෙන් කටයුතු කිරීමටත් එමගින් බලාපොරොත්තු විය.

### ලයිස්තුගත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල තුළ ස්ත්‍රී පුරුෂ විවිධත්වය ප්‍රවර්ධනය කිරීම

2019 ජාතික අයවැයට ඉදිරිපත් කරන ලද යෝජනාවක් සැළකිල්ලට ගනිමින් රාජ්‍ය ලයිස්තුගත සමාගම්වල ස්ත්‍රී පුරුෂ විවිධත්වය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් පවත්වනු ලබන විවිධ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීමට කාර්ය සාධක බලකායක් පිහිටුවන ලදී.

### ආයෝජකයින් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ වෘත්තිකයන් සවිබල ගැන්වීම

සුළු පරිමාණ ආයෝජකයින්ගේ දෘෂ්ටි කෝණයෙන් බලන කල, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජනතාව අතුරින් වැඩි පිරිසකට මූල්‍ය සාක්ෂරතාවය ලබාදීමේ අරමුණින් රට පුරා සිසුන්, ගුරුවරුන්, උපාධි අපේක්ෂකයින්, ආයෝජකයින් සහ අනාගතයේදී ආයෝජනය කිරීමට අපේක්ෂා කරන ආයෝජකයින් සඳහා බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කළේය. ප්‍රාග්ධන වෙළෙඳපොළේ නියැලී සිටින වෙළෙඳපොළ වෘත්තිකයන්ගේ දක්ෂතා හා හැකියාවන් වැඩිදියුණු කිරීමට හැකිවන පරිදි ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ රැකියා ආරම්භ කිරීමට අපේක්ෂා කරන පුද්ගලයින් සඳහා නව වෘත්තීය අධ්‍යාපන රාමුවක් සිය පුහුණු හා සංවර්ධන අංශය හරහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සකස් කරනු ලැබීය.

### ඉදිරියට ගමන් කිරීම

ඉදිරියට යමින්, නිශ්චිත කාලරාමු තීරණය කරමින් සහ වැදගත් අංශයන් කිහිපයක් ඔස්සේ ස්ථිර ප්‍රතිඵල ලබා ගැනීමේ අරමුණ ඇතිව කටයුතු කිරීම සඳහා පුළුල්ව සිතා බැලිය යුතු කාලය මෙය යැයි මම සිතමි.

රජයේ සහයෝගය හා දිරිගැන්වීම් භුක්ති විඳීමට අපි සැබවින්ම වාසනාවන්ත වෙමු. ස්ථිර ප්‍රතිපත්තිවලට අනුව වැඩ කිරීම සහ රජයේ කැමැත්ත අපගේ ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වී තිබේ. අපගේ මෙහෙයුම් ස්වාධීනත්වයට රජය දක්වන සහයෝගය කිසි විටෙකත් අඩපණ වී නැත. මෙය ජාත්‍යන්තර නියාමකයෙකු සඳහා අත්‍යවශ්‍ය පදනමක් වන අතර, ප්‍රාග්ධන වෙළෙඳපොළකටයුතු මෙහෙයවන හෝ ප්‍රාග්ධන වෙළෙඳපොළේ නිරත වීමට අදහස් කරන සැමට විශ්වාසයක් ලබා දෙයි. මේ අනුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ලබාදුන් සියළුම සහයෝගයන් සහ අප කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමාට සහ භාණ්ඩාගාරයේ ලේකම් සජිත් ආටිගල මහතාට මාගේ අවංක කෘතඥතාව පිරිනැමීමට කැමතිය.

දක්ෂ ජනාධිපති නීතීඥවරයෙකු ලෙස, සභාපතිතුමාගේ ඥාණවන්ත උපදෙස් සහ නොවරදින සහයෝගය අපගේ කාර්යයන්හී සෑම පියවරකදීම බෙහෙවින් අගනේය. ආයතනය වෙනුවෙන් සහ අප කෙරෙහිත්,

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

**"වර්ෂ 1997 දී සාංගමික ණය සුරැකුම්පත් හඳුන්වා දී වසර 23 කට පසු නව උපකරණයක් ලෙස ලයිස්තුගත දේපොළ වෙළෙඳාම් ආයෝජන භාර ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වා දීම විශේෂ සිදුවීමක් සනිටුහන් කර ඇත. දේපොළ වෙළෙඳාම් ආයෝජන භාරයට ලැබෙන ආදායමෙන් 90% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඒකක හිමියන් අතර බෙදා හැරෙන අතර දේපළ වෙළෙඳාම් ආයෝජන භාරයේ ආයෝජනය කරන ආයෝජකයන්ගෙන් ලැබෙන ප්‍රාග්ධනය දේපොළ වෙළෙඳාම් සහ යටිතල පහසුකම් සංවර්ධනයට යෙදවේ. මෙම දේපොළ වෙළෙඳාම් ආයෝජන භාර හරහා සුළු පරිමාණ ආයෝජකයන්ට දේපොළ වෙළෙඳාම් අංශයේ වර්ධනයෙන් සෘජුවම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. කළමනාකරණ සමාගම් වලට සහ සෑෂඹ වල භාරකරුවන්ට අදාළ වන නීති ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කරන අතර සෑෂඹ ලයිස්තුගත කිරීම සක්‍රීය කිරීම සඳහා ලයිස්තුගත කිරීමේ නීති කෙටුම්පත් කරන ලෙස කොළඹ කොටස් හුවමාරුවට උපදෙස් දෙන ලදී."**

පෞද්ගලික මට්ටමින් මා කෙරෙහිත් තබා විශ්වාසය වෙනුවෙන් මම ඔහුට අවංකවම ස්තූතිවන්ත වෙමි. කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ නොවරදින සහයෝගය, වටිනා උපදෙස් සහ සාමූහික අදහස් ලබාදීමේදී, ඇතැම් විට ඔවුන්ගේ පෞද්ගලික හා වෘත්තීයමය කාලය කැපකිරීම වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙමි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරය සාක්ෂාත් කර ගැනීමේදී අපගේ කාර්ය මණ්ඩලයේ ඉහළ සහභාගීත්වය, කාර්ය සාධනය සහ විශ්වාසය මා බෙහෙවින් අගය කරමි. එබැවින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මානව ප්‍රාග්ධනය තවදුරටත් වර්ධනය කිරීමට අපේක්ෂා කරමි. අවසාන වශයෙන්, මාගේ අධ්‍යක්ෂවරුන්ට, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ සමස්ත කාර්ය මණ්ඩලයට හදපිරි ස්තූතිය පිරිනැමීමට කැමතිය

නිවැරදි දිශාවට නව උද්යෝගයක් සහිත සහ වේගවත් ගමනක් මම දකිමි. උද්යෝගිමත් පුද්ගලයන් පිළිබඳව ප්‍රංශ විප්ලවයේ ආරම්භයේ සිටි වර්ඩ්ස්වර්ත් පැවසූ පරිදි, "හිමිදිරි උදෑසන ජීවත්ව සිටීම සතුටක්".

අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ මෙතෙක් භාවිතයට නොගත් හැකියාවන් අඛණ්ඩව සමාලෝචනය කර අපගේ ප්‍රවේශය නැවත සකස් කරගනිමින් සාර්ථකත්වයන් ගොඩනැංවීමට මම බලාපොරොත්තු වෙමි.



**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජනරාල්

2020 ජූලි 18

# විස්තීරණ, ක්‍රියාව නැඹුරුවූ, ප්‍රායෝගික සහ මිනියහැකි ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ගයන්

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිශන් සභාව මේ උපායමාර්ග මේ වන විටත් ක්‍රියාත්මක කරමින් සිටියි**



# ප්‍රධාන නියාමන සහ සංවර්ධන උපායමාර්ග

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මේ උපායමාර්ග මේ වන විටත් ක්‍රියාත්මක කරමින් සිටියි**

රටේ ආර්ථික සංවර්ධනය සඳහා
පුද්ගලික අංශය දිරිමත් කිරීම

### ප්‍රධාන නියාමන උපායමාර්ග

### නියාමන හා පාලන පරිසරය ශක්තිමත් කිරීම

- නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති තක්සේරු කිරීම සහ සංශෝධනය කිරීම
- වෙළෙඳපොළ අතරමැදියන් සම්බන්ධ සියලු නීති සමාලෝචනය කිරීම
- OECD විසින් නියම කරන ලද මූලධර්මයන්ට අනුකූලව ආයතනික පාලන සංග්‍රහය සමාලෝචනය කිරීම
- ඒකක භාර සංග්‍රහය සමාලෝචනය
- නව පවරා ගැනීම් හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය අවසන් කිරීම
- සුරැකුම්කරණයේ නෛතික ව්‍යුහය විධිමත් කිරීම

### වගවීම සහ වෙළෙඳපොළ ආදී අධීක්ෂණය වැඩිකිරීම

- වෙළඳාම් ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා උසස් ක්‍රියාකාරිත්වයන් සහිත අවේක්ෂණ පද්ධතිය වැඩි දියුණු කිරීම
- ලයිස්තුගත සමාගම් සඳහා මූල්‍ය අවේක්ෂණයන් සම්බන්ධ පුළුල් රාමුවක් සංවර්ධනය කිරීම
- වගවීම සහතික කිරීම සඳහා අතිරේක සේවා සපයන්නන් මත රාජකාරි පැවරීම
- සියලුම ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයතන සහ අතරමැදියන් සම්බන්ධයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධීක්ෂණය වැඩිදියුණු කිරීම
- ප්‍රාග්ධන වෙළෙඳපොළ අක්‍රමිකතා මැඩපැවැත්වීම සඳහා ඵලදායී වැළැක්වීමේ යාන්ත්‍රනයක් හඳුන්වාදීම
- වෙළෙඳපොළ වැරදි පිළිබඳ කඩිනම් විමර්ශනය

### ප්‍රාග්ධන වෙළඳ වෙළෙඳපොළ සහ සහභාගිවි වන්නන් ගේ ප්‍රමිති සහ නිපුනණතා ඉහළ නැංවීම

- ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයතන, වෙළෙඳපොළ අතරමැදියන් සහ ලැයිස්තුගත සමාගම් හා යෝග්‍ය හා නිසි ප්‍රමිතියෙන් වැඩිදියුණු කිරීම
- වෙළෙඳපොළ සහභාගිවූවන්ට අදාල ලියකියවිලි ප්‍රමිතිකරණය කිරීම
- ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ සහභාගිවන්නන් සඳහා පවත්නා සුදුසුකම් නිර්ණායක සමාලෝචනය කර වැඩිදියුණු කිරීම
- සියලුම වත්කම් පන්ති සඳහා පහසුකම් සැලසීම සඳහා බහු ස්ථර බලපත්‍ර රාමුවක් සංවර්ධනය කිරීම
- ඒකක භාර කළමනාකරණ සමාගම් සහ ආයෝජන කළමනාකරුවන් සඳහා ගෝලීය ආයෝජන කාර්ය සඳහා (GIPS) හඳුන්වාදීමේ හැකියාව ඇගයීම
- මුදල් විශුද්ධිකරණය සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමනයන්ට අදාල ණශක අවශ්‍යතා වැඩි දියුණු කිරීම
- මූල්‍යමය වශයෙන් අභියෝගයට ලක් වූ සමාගම් වර්ගීකරණය හා අනාවරණය කිරීම
- නියාමන අවශ්‍යතාවයට අදාළව කොටස් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම

### පද්ධතිමය අවදානම අවම කිරීම සහ කළමනාකරණය කිරීම

- ගෙවීම්වලට එදිරිව බේරුම් කිරීම (DVP) සහ මධ්‍යම ප්‍රතිපාර්ශවිය (සීසීපී) යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම
- ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයතන සහ අතරමැදියන් සඳහා අවදානම් බරිත ප්‍රමාණවත් ප්‍රාග්ධන රාමුවක් සකස් කිරීම
- එතැන් පරීක්ෂාවන් සඳහා අවදානම් පදනම් කරගත් තක්සේරු රාමුවක් සකස් කිරීම

## ප්‍රධාන සංවර්ධන උපායමාර්ග

### ප්‍රාග්ධන උත්පාදනය සඳහා සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම

- ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රවර්ධනයට අවශ්‍ය විශාලත්වය සහ ද්‍රවශීලතාවය සහිත සමාගම් ලැයිස්තුගත කිරීම සඳහා ක්‍රමයක් නිර්මාණයය කිරීම
- සානගමික ණය සඳහා වෙළෙඳපොළ සංවර්ධනය කිරීම
- ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා යටිතල පහසුකම් සැපයීම සඳහා රාමුවක් හඳුන්වාදීම
- නව වෙළෙඳපොළ කණ්ඩායම් ආකර්ෂණය සඳහා වෙළෙඳපොළට විකල්ප ලැයිස්තුගත කිරීමේ පුවරු හඳුන්වාදීම
- මෝගන් සැටැන්ලි කැපිටල් ඉන්ටර්නැෂනල් (එම් එස් සී අයි) නැගී එන වෙළෙඳපොළ තත්ත්වයට උසස් කිරීම

### ද්‍රවශීලතාවය සහ වෙළෙඳපොළ සහභාගිත්වය ඉහළ නැංවීම

- කුඩා ආයෝජකයින්ට වෙළඳ වෙළඳපොළට පිවිසිය හැකි මාර්ගයක් ලෙස ඒකක භාර කර්මාන්තය සංවර්ධනය කිරීම
- ප්‍රාග්ධන වෙළඳපොළ තුළ විශ්‍රාම වැටුප් අරමුදල් වල සහභාගීත්වය වැඩි කිරීම
- විදේශීය ආයෝජකයින් ආකර්ෂනයණය කර ගැනීම සඳහා හිතකර පරිසරයක් ඇති කිරීම
- හිඟ විකුණු, සුරැකුම්පත් ණයට ගැනීම සහ ණය දීම හඳුන්වාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම
- ද්‍රවශීලතාවය වැඩි කිරීම සඳහා ඉහළ මහජන හිමිකාරිත්ව අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම

### යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ නව උපකරණ

- නියාමන වාර්තාකරණය සඳහා විද්‍යුත්-ලිපි ගොනු කිරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම
- කොටස් තැරැව්කාර කර්මාන්තය හරහා තොරතුරු ආරක්ෂණ ක්‍රම හා ඇණවුම් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම
- ප්‍රමිතිගත ඩිජිටල් ව්‍යාපාර වාර්තාකරණ ක්‍රමයක් හඳුන්වාදීම
- දේපල වෙළෙඳම් ආයෝජන භාර (REIT) සහ විනිමය හුවමාරු අරමුදල් (ETSs) වැනි නව නිෂ්පාදන සඳහා ප්‍රතිපත්ති හා නීති සකස් කිරීම
- අවදානම් පදනම් නිෂ්පාදන හඳුන්වාදීම සඳහා ක්‍රමවේදයක් නිර්මාණය කිරීම

### දේශීය හැකියාවන් ගොඩන නැංවීම

- කොළඹ කොටස් හුවමාරුවේ මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය
- කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙහෙයුම් ඩිජිටල්කරණය
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණු ඵලදායී කාර්යක්ෂම හා කාලෝචිත ආකාරයකින් ඉටු කිරීම සඳහා ප්‍රතිචාරාත්මක බව සහතික කිරීම
- දක්ෂ ශ්‍රම බලකායක් බඳවා ගැනීමට හා රඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමෙන් නියාමකයාගේ නිපුනණතා ගොඩනැගීම
- ප්‍රාග්ධන වෙළෙඳපොළ අදාළ සියළු පාර්ශවකරුවන්ගේ මූල්‍ය සාක්ෂරතාවය සහ ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම
- ආයෝජකයින්ගේ අධ්‍යාපනය සහ මහජනතාව දැනුවත් කිරීමේ අඛණ්ඩ වැඩ සටහන් පැවැත්වීම

# කොමිෂන් සභා සාමාජිකයන්



වමේ සිට දකුණට සිටගෙන:
**ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා, සුනිල් ලංකාතිලක මහතා, ප්‍රියන්ත රත්නායක මහතා, නරේෂ් අබේසේකර මහතා. සිසිර රත්නායක මහතා, ජනාධිපති නීතීඥ සුහද ගමලත් මහතා, එච්. ඒ. කරුණාරත්න මහතා**

වාඩි වී වමේ සිට දකුණට:
**මනිල් ජයසිංහ මහතා, ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න මහතා, (සභාපති)**



# කොමිෂන් සභා සාමාජිකයන්

**විරාජ් දයාරත්න මහතා (සභාපති)**

ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා 2020 ජනවාරි 22 වන දින ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ධුරයට පත්විය. දයාරත්න මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් සහ ජාත්‍යන්තර වෙළෙඳ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. (LL.M) වේල්ස් විශ්ව විද්‍යාලයෙන්. 1989 දී ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වූ ඔහු 1992 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස බඳවා ගන්නා ලදී.

ඔහු 1993 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට රාජ්‍යයේ අධි නීතිඥයෙකු ලෙස සම්බන්ධ වූ අතර 2018 මැයි මාසයේදී අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකු ලෙස පත්විය. එම වසරේම ජුනි මාසයේදී අතිගරු ජනාධිපතිතුමා විසින් ජනාධිපති නීතිඥවරයෙකු ලෙස පත් කරන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ සිය වෘත්තීය ජීවිතයේ පළමු වසර හය තුළදී, දයාරත්න මහතා අපරාධ අංශයට අනුයුක්තව සිටි අතර මහේස්ත්‍රාත් අධිකරණවල සහ මහාධිකරණවල නඩු පවරා ඇති අතර, ඔහු මහාධිකරණය විසින් දෙන ලද තීන්දු වලට අභියාචනාධිකරණයේ ගොනු කරන ලද නඩු සම්බන්ධයෙන් රජය වෙනුවෙන් පෙනී සිටියේය. ඉන්පසුව, ඔහු සිවිල් හා වාණිජ නීති අංශයට ගොස් රාජ්‍ය, රාජ්‍ය සංස්ථා සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන මූලික අධිකණවල සහ අභියාචනාධිකරණයෙ නියෝජනය කර ඇති අතර මූලික අයිතිවාසිකම්, පොදු නීතිය, වාණිජ නීතිය, බදු, බැංකු, රේගු සහ කම්කරු නීතිය. ඔහු ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වාණිජ බේරුම්කරණ කිහිපයකම පෙනී සිටියේය. විවිධාකාර නීතිමය කාරණා සම්බන්ධයෙන් රජය, රාජ්‍ය සංස්ථා සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවලට උපදෙස් දීම ද ඔහුගේ කාර්යයට ඇතුළත් ය.

දයාරත්න මහතා ෆීජී ජනරජයේ අභියාචනාධිකරණයේ විනිසුරුවරයෙකු වන අතර මැලේසියාවේ ආසියානු ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයේ ICPL විනිශ්චයකාර මණ්ඩලයේ විනිශ්චයකාරවරයෙකි. ඔහු ICLP බේරුම්කරණ මධ්‍යස්ථානයේ පීඨ මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර ඉදිකිරීම් බේරුම්කරණය සහ විනිශ්චය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කරයි.

බේරුම්කරණ නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයකු සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පරිපාලන නීතිය පිළිබඳ පරීක්ෂකවරයකු වූ ඔහු තොරතුරු තාක්ෂණ ආයතනය විසින් පවත්වන ලද නීතිවේදී උපාධි පාඨමාලාවේ කොන්ත්‍රාත් නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයකු ලෙස ද සේවය කළේය.

2009 සිට 2011 දක්වා වසර දෙකක කාලයක් ඕමානයේ සුල්තාන් රාජ්‍යයේ ආරක්ෂක අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් හා නීති කටයුතු අධ්‍යක්ෂ කාර්යාලයේ නීති විශේෂඥයෙකු ලෙස දයාරත්න මහතා සේවය කළේය. ඔහු රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මෙන්ම අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ නීති උපදේශකයෙකු ලෙස ද කටයුතු කළේය. ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනිසුරු නීතිපති ලෙස ද කටයුතු කළේය.

ඔහු මහවෙලි මිනි ජල විදුලි ව්‍යාපෘතිය සඳහා BOO/ BOOT පදනම මත සහ ව්‍යාපෘති පදනම මත කිලිනොච්චි දිස්ත්‍රික් විදුලිබල ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ගිවිසුම් කෙටුම්පත් කළ ව්‍යාපෘති කමිටුවල සාමාජිකයෙකු වූ අතර ශ්‍රී ලංකා රජයේ නියෝජිත කණ්ඩායමේ සාමාජිකයෙකි. ශ්‍රී ලංකාව සහ ඕමානය අතර ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම් සකස් කර ශ්‍රී ලංකා රජයේ නියෝජිත කාර්යාංශයේ සාමාජිකයෙකි. ඔහු බොහෝ ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලදී රජය නියෝජනය කර ඇති අතර නීතියේ විවිධ විෂයන් පිළිබඳ ලිපි සහ ප්‍රකාශන සඳහා දායක කර ඇත.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස රාජකාරි භාර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (පීඑස්සී) ඔහුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිදහස් කළේය.

**මනිල් ජයසිංහ මහතා (FCA, FCMA, CIPFA)**

මනිල් ජයසිංහ මහතා, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු හා රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණය පිළිබඳ වරලත් ආයතනයේ සාමාජිකයෙකි.

ශ්‍රී ලංකා අර්නස්ට් ඇන් යන්ග් ආයතනයෙහි සහතික ආරක්ෂණ ප්‍රධානී හා බැංකු හා මූල්‍ය සේවා කටයුතු සම්බන්ධ ප්‍රධානී ලෙස කටයුතු කර වසර 38 කට වැඩි අත්දැකීම් ඇති අයෙකි.

වර්තමානයේදී ඔහු :-

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ලෙස,
- ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස, ව්‍යවස්ථාපිත විගණන කමිටුවේ සාමාජිකයෙකු සහ තවත් බොහෝ කමිටුවල සාමාජිකයෙකු ලෙස,
- දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස,
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස,
- ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ කවුන්සල සාමාජිකයෙකු ලෙස,
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස,
- ලැයිස්තුගත සමාගම්වල විගණන කමිටුවල උපදේශකයෙකු ලෙස සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ විභාග කමිටුවේ සභාපති, ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ විකල්ප සභාපති, ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ, ජාත්‍යන්තර ගිණුම්කරණ අධ්‍යාපන ප්‍රමිති මණ්ඩලයේ සාමාජිකයකු සහ මොරටුව විශ්වවිද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස සේවය කර ඇත.

**ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා**

ගම්ලත් මහතා හිටපු සොලිසිටර් ජනරාල්වරයකු වන අතර අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ හිටපු ලේකම්වරයෙකි.

**එච් ඒ කරුණාරත්න මහතා**

එච්. කරුණාරත්න මහතා වර්තමානයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි මූල්‍ය සේවා අංශය සම්බන්ධයෙන් පුළුල් අත්දැකීම් ලබා ඇත.

ඔහු මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුවේ, ජාතික ගෙවීම් කවුන්සිලයේ සහ සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන අධීක්ෂණ කමිටුවේ සභාපතිවරයා වන අතර මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව ඇතුළු කමිටු ගණනාවක සාමාජිකයෙකි. ඔහු ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ වෙස්ට් කෝස්ට් විදුලි (පුද්ගලික) සමාගමේ සභාපති ලෙස ද සේවය කරයි.මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙසත්, කලම්බු ඩොක්යාර්ඩ් පී. එල්. සී. හි අධ්‍යක්ෂවරයෙකු ලෙසත් කටයුතු කරයි. ඔහුගේ අවුරුදු තිස් හතරක වෘත්තීය ජීවිතය තුළ,මහා බැංකුවේ සහකාර අධිපතිවරයෙකු සහ මුදල් මණ්ඩලයේ ලේකම්, මුදල් මණ්ඩලයේ උපදේශක කමිටුවේ ලේකම්, ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ යනාදි ප්‍රධාන තනතුරු දරා ඇත.

කරුණාරත්න මහතා, අනාගතයන් වරණයන් සහ අනෙකුත් ව්‍යුත්පන්න උපකරණ ගනුදෙනු කිරීමට සිංගප්පූරුවේ මූල්‍ය අධිකාරියෙන් අවසර ලබාගත් කාල සීමාව තුළ සිංගප්පූරුවේ, රෙෆ්කෝ සිංගප්පූරු (පුද්ගලික) සමාගමේ ස්ථාවර ආදායම් දෙපාර්තමේන්තුවේ උප සභාපති සහ මෑන් ෆයිනෑන්ෂල් (පුද්ගලික) සමාගමේ මූලික අවදානම් අධීක්ෂණය පිළිබඳ උපසභාපතිවරයා ලෙස සේවය කර ඇත.

කරුණාරත්න මහතා, 2009 මැයි මස සිට 2015 ඔක්තෝබර් දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ සහ වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් හිමිකරගෙන ඇති අතර ඇමරිකා එක්සත් ජනපදයේ ඔහියෝ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් හිමිකරගෙන ඇත. එමෙන්ම ඒ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයකු ද වේ.

කරුණාරත්න මහතා, විවිධ විෂයන් සම්බන්ධයෙන් දේශීය මෙන්ම ජාත්‍යන්තර වැඩමුළු වල නිත්‍ය කථිකයෙකු වේ.

### ආර් එම් පී රත්නායක මහතා

ආර් එම් පී රත්නායක මහතා ශ්‍රී ලංකා සැළසුම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර දැනට මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස කටයුතු කරයි. ඔහු වසර 25 කට ආසන්න කාලයක් විවිධ තනතුරු දරමින් රාජ්‍ය සේවයේ යෙදී සිටී.

රත්නායක මහතා නෝර්වේ කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇත.

ඔහු 1994 දී රාජ්‍ය සේවයට බැඳුණු අතර මහා භාණ්ඩාගාරයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහ බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ තනතුරු ගණනාවක් දරමින් සිටී. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සංවර්ධන පාර්ශවකරුවන්, සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ මූල්‍ය බලමුලු ගැන්වීම සඳහා ණය දෙන ආයතන සහ ප්‍රාග්ධන වෙළඳපොළ, ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වීම සහ විදේශ මුදල් නිසි කලට බෙදා හැරීමට පහසුකම් සැපයීම වැනි කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම් දරන ලදී.

රත්නායක මහතා, බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ ආසියානු සංවර්ධන බැංකු අංශයේ ප්‍රධාන අධ්‍යක්ෂක, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ විකල්ප විධායක අධ්‍යක්ෂක, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපති, මහජන බැංකුවේ අධ්‍යක්ෂ, වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජික, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ඖෂධ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ, ජාතික වෛද්‍ය නියාමන අධිකාරියේ සාමාජික යන තනතුරුවල සේවය කර ඇත.

රත්නායක මහතා විවිධ ක්ෂේත්‍ර/ විෂය ක්ෂේත්‍රවලට අදාළ ලිපි රාශියක් ද ප්‍රකාශයට පත් කර තිබේ.

### සිසිර රත්නායක මහතා

රත්නායක මහතා වසර 35 කට ආසන්න කාලයක් නීති ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව නියැලී සිටින අතර ශ්‍රී ලංකාවේ සිවිල් හා අපරාධ නීතිය පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත. ඔහු එක්සත් රාජධානියේ, ස්කොට්ලන්තයේ ඇබර්ඩීන් විශ්ව විද්‍යාලයෙන් වාණිජ නීතිය පිළිබඳ පැසසුම් ද සමඟ ශාස්ත්‍රපති උපාධියක් (L.L.M) ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙසද කටයුතු කරයි.

රත්නායක මහතා මහේස්ත්‍රාත්වරයකු, දිසා විනිසුරුවරයෙකු, මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස සහ සිවිල් අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු ලෙස ශ්‍රී ලංකාවේ විවිධ අධිකරණවල සේවය කර ඇත. ඔහු 2013-2015 කාලය තුළ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස සේවය කර ඇත. ඔහු 2007-2008 කාලය තුළ අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) ලෙස ද කටයුතු කර ඇත.

ඔහු අධිකරණ සේවා සංගමයේ සභාපති සහ උප සභාපති ලෙසත් සේවය කර ඇත. (JSA - දිවයිනේ සියලුම මහේස්ත්‍රාත්වරුන් හා දිස්ත්‍රික් විනිසුරුවන්ගෙන් සමන්විත සංගමය). ඔහු මහාධිකරණ විනිසුරුවන්ගේ සංගමයේ උප සභාපති සහ සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත. (HCJA - දිවයිනේ සියලුම මහාධිකරණ විනිසුරුවන්ගෙන් සැදුම්ලත් සංගමය)

හොංකොං හි පැවති "සමාගම් නීතියේ නවීන ප්‍රවණතා පිළිබඳ උසස් පුහුණු වැඩසටහන", සිංගප්පූරුවේ පැවති "2007 කලාපීය අධිකරණ සම්මන්ත්‍රණය", "ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ අධිකරණ සාමාජිකයින් සඳහා සිංගප්පූරුවේ පැවති ජාත්‍යන්තර බේරුම්කරණය සහ ඉදිකිරීම් නීතිය පිළිබඳ විධායක පුහුණු වැඩසටහන" ඇතුළු ජාත්‍යන්තර වැඩසටහන් රැසකට ඔහු සහභාගී වී තිබේ. "ශ්‍රී ලංකා විනිසුරුවන් සඳහා ඉන්දියාවේ අධ්‍යාපන වැඩසටහන", සිංගප්පූරුවේ සිවිල් සේවා විද්‍යාලයේ පැවති අධිකරණය සහ විශිෂ්ටත්වය පිළිබඳ අධ්‍යයන චාරිකාව, දකුණු කොරියාවේ පැවති "කොයිකා පුහුණු වැඩසටහන "සහ" එක්සත් රාජධානියේ එඩින්බරෝහි පැවති UKELA වාර්ෂික සමුළුව" ආදී ජාත්‍යන්තර වැඩසටහන් රාශියකට ඔහු සහභාගී වී ඇත. ඔහු ඉන්දියාවේ පැවති අධිකරණ කළමනාකරණය, නඩු කළමනාකරණය, සිවිල් නීති ප්‍රතිසංස්කරණ සහ පවුල් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ වැඩසටහන් ආදියට ද සහභාගී වී තිබේ.

දකුණු අප්‍රිකාවේ කේප් ටවුන් හි පැවති " ආසියානු-අප්‍රිකානු නීති උපදේශන සංවිධානයේ 46 වන සැසිය", ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් හි පැවති "අධිකරණ කොලොකියම් වැඩසටහන ", "INSOL / UNCITRAL / දුවශීලතාව පිළිබඳව ඇමෙරිකාවේ පැවති, ලෝක බැංකු ඒකාබද්ධ බහුජාතික අධිකරණ කොලොකියම් වැඩසටහන ඇතුළු ජාත්‍යන්තර වැඩසටහන් ගණනාවකදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වී ඇත.

### ඩී එන් ආර් සිරිවර්ධන මහතා

ඩී එන් ආර් සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් භූගෝල විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිය පිළිබඳ උපාධියක්ද ලබාගෙන තිබෙන අතර එංගලන්තයේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය හා බුද්ධිමය දේපොළ ඇතුලත් ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් නීතිපති උපාධියක්ද හිමිකරගෙන ඇත. ඔහු වෘත්තියෙන් නීතිඥවරයෙකි. සිරිවර්ධන මහතා 1988 වසරේදී සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සේවයට සම්බන්ධ විය. වර්තමානයේදී ඔහු සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරෙහි කටයුතු කරනු ලබයි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුගේ ආයතනයේ, ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශ උපදේශන මණ්ඩලයේ නිළ බලයෙන් පත් වූ සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත.

### සුනිල් ලංකාතිලක මහතා

සුනිල් ලංකාතිලක මහතා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිවරයෙකි. ඔහු එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගෙන ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් වානිජවිද්‍යා පළමු පෙළ ගෞරව උපාධියක් ද හිමිකරගෙන ඇත. එමෙන්ම ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ පශ්චාද් උපාධි ආයතනයෙන් කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශන ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත.

# කොමිෂන් සභා සාමාජිකයන්

ලංකාතිලක මහතා, ආර්ථික හා මිල ස්ථායිතාව, මූල්‍ය පද්ධති ස්ථායිතාව සහ නියෝජිතායතන කාර්යයන් යන අංශයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු කර වසර 32 ට වඩා වැඩි අත්දැකීම් ලබා ඇති අයෙකි. 1986 දී මහ බැංකුවට බැඳීමට පෙර ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙසද සේවය කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 32 ක සිය වෘත්තීය ජීවිතය තුළ, සාර්ව ආර්ථික කළමනාකරණය, සාර්ව ආර්ථික ආකෘති නිර්මාණය, මූල්‍ය වැඩසටහන්කරණය, වෙළෙඳ ප්‍රතිපත්ති, තරඟකාරීත්වය, ව්‍යාපෘති කළමනාකරණය, විදේශ ආයෝජන, උපායමාර්ගික සැළසුම්කරණය සහ කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය සහ සන්නිවේදන ප්‍රතිපත්ති යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය ආදී ආයතනවල පිළිගත් පුහුණුකරුවන් විසින් පවත්වනු ලැබූ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් රැසකට සහභාගී වී තිබේ. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ හිමිකම් රක්ෂණ අරමුදලෙහි කළමනාකරණ මණ්ඩලයේ, ජාතික කම්කරු උපදේශක කමිටුවේ සහ අනෙකුත් කමිටුවල සාමාජිකයෙකු ලෙස ද ලංකාතිලක මහතා ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් කටයුතු කර ඇත. තවද, ලංකාතිලක මහතා ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් රජයේ දූත මණ්ඩල කිහිපයක්ම නියෝජනය කර ඇති අතර විශේෂයෙන්ම බැංකු සබඳතා, ආයෝජන ප්‍රවර්ධනය සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා යන අංශයන් සම්බන්ධ කණ්ඩායම් ද නියෝජනය කර ඇත. ලංකාතිලක මහතා විශේෂයෙන්ම ආර්ථික ගැටළු, සුළු පරිමාණ කර්මාන්ත, ජාත්‍යන්තර වෙළෙඳාම, මැණික් කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය යන ක්ෂේත්‍රයන් සම්බන්ධව බොහෝ ලිපි රචනා කර ඇති අතර ඒවා ජාත්‍යන්තර හා දේශීය සඟරා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශනවල ප්‍රසිද්ධ කර ඇත.

ලංකාතිලක මහතා විවිධ මට්ටමින් සම්මන්ත්‍රණ පවත්වා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපෘති ඇගයීම, සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රවල කීර්තිමත් සම්පත්දායකයෙකි. ආර්ථිකය සම්බන්ධ පුළුල් මාතෘකා ඔස්සේ විවිධ සම්මන්ත්‍රණවලදී දේශණ ගණනාවක් ද ලංකාතිලක මහතා විසින් පවත්වා ඇත.

**නරේෂ් අබේසේකර මහතා**

නරේෂ් අබේසේකර මහතා ව්‍යවසායකයකු, ප්‍රධාන කථිකයකු, SECQUORO හි ප්‍රධාන විධායක නිලධාරියා වන අතර පරිවර්තන උපායමාර්ග, මූල්‍ය, ඩිජිටල් සහ තාක්ෂණවේදය විශේෂීකරණය කර ඇත

නරේෂ් අබේසේකර මහතා ලන්ඩන්, හොංකොං, සිංගප්පූරුව, කැනඩාව, ඉතාලිය, මැලේසියාව, ජොහැන්නස්බර්ග් හා අප්‍රිකානු මහද්වීපයේ කොටස් හුවමාරු වලින් බහුතරයක ඇතුළු ලොව පුරා කොටස් වෙළෙඳපොළවල් 40 කට අධික සංඛ්‍යාවක් සවිබල ගන්වමින් ලොව වේගවත්ම කොටස් වෙළෙඳ ගනුදෙනු ක්‍රමය හඳුන්වා දුන් ප්‍රාග්ධන වෙළෙඳපොළ තාක්ෂණයේ ලොව ප්‍රමුඛතම ආයතනය වන සමූහ මිලේනියම් අයි ටී (එල් එස් ඊ ජී ටෙක්නොලොජි) සමාගමේ ප්‍රධාන මූල්‍ය නිලධාරීවරයා වශයෙන් කටයුතු කර ඇත. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අනුව ලොව විශාලතම කොටස් හුවමාරු දෙකෙන් එකක් වන ලන්ඩන් කොටස් හුවමාරු සමූහයේ ගෝලීය නායකත්ව කණ්ඩායමේ ද කටයුතු කළ ඔහු හාර්වඩ් බිස්නස් රිවීව් සඟරාව විසින් නම් කරන ලොව හොඳම ප්‍රධාන විධායක නිලධාරීන් 100 දෙනා අතරට ද පත් විය. ෆොබ්ස් විසින් පිළිගත් දකුණු ආසියාවේ විශාලතම නිෂ්පාදන පහසුකම් සපයන්නන් අතර ආසියාවේ හොඳම 200 ගේ ලැයිස්තුවට ද ඔහු ඇතුලත් විය.

''දකුණු ආසියාවේ හොඳම වාර්ෂික වාර්තාව'' එළිදැක්වීමෙන් පසු සහ ව්‍යාපාර සම්පත් සැලසුම් ක්‍රියාවට නැංවීමෙන් අනතුරුව මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව කලාපීය සම්මාන දිනා ගැනීමටද ඔහු සමත් වී තිබේ.

ශ්‍රී ලංකාවේ අවදානම් සහ පාලන දැනුම් රාමුව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර විගණන ආයතනයේ සම-නිර්මාතෘවරයා වන ඔහු ජපානයේ නාගෝයා-ටොයෝටා නිෂ්පාදන කම්හලේ lean පුරුදු පිළිබඳව ද පුහුණුව ලබා ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි. එමෙන්ම ඔහු ලන්ඩනයේ වරලත් කළමනාකරණකරණ ආයතනයෙහි මෙන්ම ගෝලීය වරලත් කළමනාකරණ ආයතනයන්හි ගණකාධිකාරීවරයෙකි. තවද ඔහු කීර්තිමත් පශ්චාත් කළමනාකරණ උපාධි ආයතනයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් දරයි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙක්, වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයෙක් (ලන්ඩන්), වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරයෙක් වන අතර පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

# ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය



වමේ සිට දකුණට සිටගෙන:

**මධුගයනි බලපිටිය** - කළමනාකාරිණී නීති සහ බලාත්මක කටයුතු සහ වැඩබලන ප්‍රධානී මානව සම්පත් හා තොරතුරු තාක්ෂණ

**සුනෙත් පෙරේරා** - සහකාර අධ්‍යක්ෂ, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන සහ පුහුණු

**තුෂාර ජයරත්න** - අධ්‍යක්ෂ, බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන

**ප්‍රභාෂ් වනිගතුංග** - අධ්‍යක්ෂ ආවේක්ෂණ සහ වැඩබලන අධ්‍යක්ෂ අධීක්ෂණ කටයුතු

**මනූරි වීරසිංහ** - සහකාර අධ්‍යක්ෂ, සාංගමික කටයුතු

**ජී. පී. එන්. දිල්හානි** - වැඩබලන අධ්‍යක්ෂ මූල්‍ය සහ පරිපාලන

වාඩි වී වමේ සිට දකුණට:

**අයන්ති අබේවික්‍රම** - අධ්‍යක්ෂ නීති සහ බලාත්මක කටයුතු සහ වැඩබලන අධ්‍යක්ෂ විමර්ශන

**චින්තක මෙන්ඩිස්** - අධ්‍යක්ෂ ජනරාල්

**ආචාර්ය හර්ෂණ පීරිස් සූරියප්පෙරුම** - අධ්‍යක්ෂ සාංගමික කටයුතු සහ වැඩබලන අධ්‍යක්ෂ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන

නොපැමිණි:

**ධම්මික පෙරේරා** - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්



# කළමනාකරුවන්



වමේ සිට දකුණට සිටගෙන:
**ශීනා ගුණරත්න** - කළමනාකාරිණී-බාහිර සම්බන්ධතා
**ෂර්මිලා පණ්ඩිතරත්න** - කළමනාකාරිණී නීතී සහ බලාත්මක කිරීම්
**සෞමි කොඩිප්පිලි** - කළමනාකාරිණී අධීක්ෂණ කටයුතු
**මංජුලා චන්ද්‍රරත්න** - කළමනාකාරිණී සුපරීක්ෂණ කටයුතු
**රන්මිනි ජයතිලක** - කළමනාකාරිණී තොරතුරු පද්ධති

වාඩි වී වමේ සිට දකුණට:
**ඩී. එම්. ජී. ප්‍රියන්ත** - කළමනාකරු විමර්ෂන
**ලක්ෂ්මි වික්‍රමනායක** - කළමනාකාරිණී මූල්‍ය කටයුතු
**සජීවනි බක්මීදෙනිය** - කළමනාකාරිණී ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන සහ පුහුණු

# කාර්ය මණ්ඩලය



පසු පෙළ වමේ සිට දකුණට:
**ඔලිව් සෝලංගආරච්චි, තක්ෂිලා ෆ්‍රැන්සිස්, ආර්. කේ. වසන්ත සුනිමල්, බුද්ධිනී හේරත්**

ඉදිරි පෙළ වමේ සිට දකුණට:
**ප්‍රියන්ත හේරත්, අනුලා විජේසිංහ, චමරී හීනටිගල**



පසු පෙළ වමේ සිට දකුණට:
**එරංගා මන්ත්‍රීරත්න, ජී. ඩී. කපිල කුමාර, රඛිත අසේල දිසානායක**

ඉදිරි පෙළ වමේ සිට දකුණට:
**නිශෝකා ජයතුංග, ක්‍රිෂාන්ති මුතුතන්ත්‍රීගේ, මේඛලා ජයපාල, කේ. ඒ. ඩී. සේමිනි දයානිකා, මේරියන් ග්ලෙන්ඩා සන්දනම්**



පසු පෙළ වමේ සිට දකුණට:
**කුමාරි සිරිවර්ධන, දසුන් පෙරේරා, පූර්ණි වීරසේකර, නිමල් කුමාරසිංහ**

ඉදිරි පෙළ වමේ සිට දකුණට:
**එම්. ඉම්රාන් අහමඩ්, ඈන් ක්‍රිෂාන්ති ප්‍රනාන්දු, දුලාරි මුහන්දිරම්, ජේ. කේ. ප්‍රියදර්ශනී**

# කාර්ය මණ්ඩලය



පසු පෙළ වමේ සිට දකුණට:
**තනිෂ්ක තිලකරත්න, දශංක වර්ණකුලසූරිය, රන්දික සිල්වා**

ඉදිරි පෙළ වමේ සිට දකුණට:
**රසංගි දිසානායක, පී. එම්. නිරෝෂිකා උදයංගනී, සුධාරා වීරක්කොඩි, කෞෂලයා ගුණවර්ධන**



පසු පෙළ වමේ සිට දකුණට:
**ධනේෂා රාජපුර, ඒ. සී. ඩයස්, රෝෂිනි පීරිස්**

ඉදිරි පෙළ වමේ සිට දකුණට:
**කවීෂා කුඹුකගේ, ගයාන් ලොකුගමගේ, ප්‍රිනිකා නිලක්ෂි පෙරේරා**



වමේ සිට දකුණට:
**රාධා ප්‍රතිභා, සචින් වීරසූරිය, රසික වල්පිටගම, කෞෂලයා විජේසිරි, මරීස් වනිගසේකර**



වමේ සිට දකුණට:
**වයි. ඩී. සඳමාලි, උදානි කේ. වික්‍රමරත්න, සරනයා අනුතිනන්, ප්‍රතිභානි හේරත්, සී. එරන්දති වෛද්‍යසේකර**



පසු පෙළ වමේ සිට දකුණට:
**ඩී. පැතුම් නිරෝෂන, සමිත් ප්‍රේමරත්න, චන්ද්‍රන් නාගේන්ද්‍රන්, ටී. රන්දික හෙට්ටිආරච්චි, බුද්ධික බලපිටිය**

ඉදිරි පෙළ වමේ සිට දකුණට:
**එම්. සඳරුවන් විජේරත්න, ඩබ්ලිව් ආරියරත්න, ඒ. ඩී. ධර්මසිරි, පී. ඩී. පත්මරානි, එච්. පී. රජිත වරුණ, පී. ඩබ්ලිව්. එල්. පියතිස්ස**

**නොපැමිණි:**
**ක්‍රිස්ටොබල් සිල්වා, අශෝකා කේ. දයාරත්න, නොමානි සෙනෙවිරත්න, සමන්ති ගුණවර්ධන, සුරේකා ජයසේකර, ජූලි අලගකෝන්, ලක්ෂ්මි අතපත්තු, දනුෂි තල්පිට, ලලින්ද දයාරත්න**

# මෙහෙයුම් සමාලෝචනය

## නියාමන

නියාමනය යනු තොරතුරු සමානව බෙදාහරිමින්, බාධා වලක්වා ගනිමින්, ආයෝජකයින් තුළ විශ්වාසය වර්ධනය ඇති කරමින් සහ හොඳින් ක්‍රියාත්මක වන වෙළෙඳපොළක් පවත්වා ගන්නා බවට සහතික වීමයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාංගමික පාලනයක් දිරිගන්වමින් හෙළිදරව් කිරීම් ප්‍රවර්ධනය කරමින්, ප්‍රතිපත්ති හඳුන්වා දෙමින් දූරදර්ශී සහ ව්‍යාපාරික හැසිරීම් නීතිරීති ඇතුළත් නියාමන රාමුවක් ස්ථාපිත කර ඇත.

### බලපත්‍ර ලබාදීම සහ ලියාපදිංචි කිරීම

නියාමිත ප්‍රාග්ධන වෙළඳපොළ කාර්‍යයන්හි නිරතවීම සඳහා, නීතිමය අවශ්‍යතාවයන්ට අනුගත වීමට යටත්ව ආස්ථිත්‍යයන් විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබාගැනීම හෝ ලියාපදිංචි වීම සිදුකළ යුතුයි. සලකා බලන වර්ෂය තුළ පහත ආස්ථිත්‍යයන් හට බලපත්‍ර හා ලියාපදිංචිය අලුත් කිරීම් ලබා දී ඇත. (සංඛ්‍යා සටහන 01)

සංඛ්‍යා සටහන: 01 බලපත්‍ර ලබාදීම සහ ලියාපදිංචි කිරීම

| නියාමිත ආස්ථිත්‍ය වර්ගය | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට බලපත්‍රලාභී/ ලියාපදිංචි මුළු ආස්ථිත්‍යයන් ගනණ |
|---|---|
| කොටස් හුවමාරුව | 01 |
| කොටස් තැරැව්කාර සමාගම් | 26 |
| කොටස් තැරැව්කාර සමාගම් - ව්‍යාපාර මෙහෙයුම් ස්වේච්ඡා අකර්මණ්‍ය කිරීම් | 2 |
| කොටස් ගණුදෙනුකාර සමාගම් | 11 |
| ආයෝජන කළමනාකරුවන් | 24 |
| ආන්තික සැපයුම්කරුවන් | 26 |
| ප්‍රාරක්ෂණ ආයතන | 7 |
| ප්‍රාමාණීකරණ ආයතන | 2 |
| නිශ්කාෂණාගාර | 1 |

### ප්‍රතිපත්තිමය මුලපිරීම්

#### 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අදාලව අවසන් කරන ලද අනාවරණ කෙටුම්පත 2017 නොවෙම්බර් මස 17 වන දින දරණ ගැසට් පත්‍රයේ දෙවන කොටසට අතිරේකයක් ලෙස 2017 නොවෙම්බර් මස 22 වන දින එළ කර මහජනතාව අතරට පත් කරන ලද අතර ඉන්පසු එසේ එළ කරන ලද පිටපත සම්බන්ධව ලංකා වාණිජ මණ්ඩලය හා කොළඹ කොටස් වෙළඳපොළ ඇතුලු විවිධ පාර්ශවකරුවන් වෙතින් බොහෝ අදහස් හා සිතුවිලි ඉදිරිපත් විය.

කාරයක්ෂම ප්‍රාග්ධන වෙළඳපොළ නියාමනයකට අවශ්‍ය නියාමන බලතල රඳවා ගන්නා අතර බාහිර හා අභ්‍යන්තර පාර්ශවකරුවන් විසින් එළ කළ අදහස් ද සලකා බලමින් සංශෝධන යෝජනා කෙරිණි.

#### කොළඹ කොටස් වෙළඳපොළ අසාමුහීකරණය කිරීම.

යෝජිත අසාමුහීකරණය කරන ලද කොළඹ කොටස් වෙළඳපොළෙහි කොටස් අනුපාතය සම්බන්ධව කොළඹ කොටස් වෙළඳපොළ සහ කොටස් තැරැව්කාර සමාගම් සමග පැවති රැස්වීම් මාලාවකට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහභාගී වූ අතර 70:30 අනුපාතයට ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන අරමුදල හා කොටස් තැරැව්කාර සමාගම් සමග එකඟතාවයකට එළෙඹෙන ලදී.

ඉහත සංශෝධනයන් සඳහා කැබිනට් අනුමැතිය 2019 අප්‍රේල් මස 9 වන දින පැවති කැබිනට් හමුවේදී ලබාදුන් අතර එසේ අනුමත කරන ලද සංශෝධන, මුදල් අමාත්‍යංශය විසින් නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව හා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

#### නව, සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය.

නව, සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරු ජනාධිපති නීතීඥ සලීම් මර්සූෆ් මහතාගේ මගපෙන්වීම හා නිර්දේශ යටතේ සැකසූ අතර පූර්ණ ස්වාධීන පවරා ගැනීම් උපදේශක මණ්ඩලයක් පැවතීමෙහි වාසි සහ අවාසි සලකා බැලීම සඳහා ලේඛම් කාර්යාලය විසින් ද වැඩිදුර විශ්ලේෂණයකට ලක් කෙරිනි. සමස්ථ වශයෙන් අභ්‍යන්තර අදහස් සලකා බලමින් සංග්‍රහය වැඩිදුර සංශෝධනයට ලක් කෙරෙමින් පවතී.

### අනුමැතිය පිරිනැමීම

#### විශ්වීය, කලාපීය සහ රාෂ්ඨ අරමුදල් සඳහා අනුමැතිය ලබාදීම

මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාග මෙහි නිර්දේශ මත, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විශ්වීය, කලාපීය සහ රාෂ්ඨ අරමුදල් සඳහා කොළඹ කොටස් වෙළඳපොළෙහි ලයිස්තුගත සමාගම් කොටස් වල ආයෝජනය කිරීමට අනුමැතිය ප්‍රධානය කරනු ලබයි. මෙම අනුමැතියන් ප්‍රධානය කරනු ලබන්නේ විණිමය පාලන රෙගුලාසි, 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනත 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත සහ සුරැකුම්පත් වලට අදාළ ශ්‍රී ලංකාවේ නීති වලට අනුකූල වීමට යටත්වයි.

2019 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් 103ක ට ශ්‍රී ලංකාවේ ලයිස්තුගත සුරැකුම්පත් වල ආයෝජනය කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර නම් වෙනස් කිරීම් 76ක් සටහන් කරනු ලැබ ඇත.

#### කොළඹ කොටස් වෙළෙඳපොළේ සමාගම් ලයිස්තුගත කිරීමේ රීති වල 5.4 (ආ) රීතිය යටතේ ලබා දෙන නිදහස් කිරීම්

කොටස් නිකුතුවක් සිදුකළ වහාම එම නිකුත් කළ කොටස් වලින් 20% ක් ඉක්මවන සේ පුද්ගලික ස්ථානගත කිරීමක් මගින් කොටස් නිකුත් කිරීමට බලාපොරොත්තු වන ලයිස්තුගත පොදු සමාගම් වලට නිදහස් කිරීම් ප්‍රධානය කිරීමට අදාල අයදුම්පත් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සලකා බලනු ලබයි.

සලකා බලන වර්ෂය තුළ පහත සමාගම් වලට 5.4 (ආ) රීතියට අනුව නිදහස් කිරීම් ලබාදෙන ලදී.

- සමූහ ප්‍රතිව්‍යුහගත කිරීමක් ක්‍රියාවට නැංවීම සඳහා පෞද්ගලික ස්ථානගත කිරීමක් මගින් "බ්‍රවුන්ස් කැපිටල් පී. එල්. සී." හි කොටස් හිමියන් වෙත නව කොටස් නිකුත් කිරීමට "බ්‍රවුන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් පී. එල්. සී. " වෙත ඉඩ ලබා දීම.
- අභ්‍යන්තර ප්‍රතිව්‍යුහගත කිරීමක් ක්‍රියාත්මක කිරීමට යම් කොන්දේසි වලට යටත්ව කොටස් හුවමාරු කිරීමක් හරහා පෞද්ගලික ස්ථානගත කිරීමක් මගින් වත්මන් කොටස් හිමිකරුවන් 6 දෙනෙක් වෙත නව කොටස් නිකුත් කිරීමට "ලංකා රියල්ටි ඉන්වෙස්ට්මන්ට් පී. එල්. සී. " වෙත ඉඩ ලබා දීම.

### කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ රීති සහ කොටස් තැරව්කරුවන්ගේ රීති විශ්ලේෂණය කිරීම

සලකා බලන වර්ෂය තුලදී පහත ලයිස්තුගත කිරීමේ රීති විශ්ලේෂණය කරනු ලැබූ අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 24 වන වගන්තිය යටතේ ඒවාට අනුමැතිය ලබා දී ඇත.

- බහු මුදල් පුවරුවේ ලයිස්තුගත සුරැකුම්පත් වලට අදාලව ගනුදෙනු අවලංගු කිරීම් සම්බන්ධව නව ප්‍රතිපාදන ඇතුලත් කරමින්, ස්වයංක්‍රිය ගනුදෙනු පද්ධතිය පිලිබඳ රීතින්හි 10.3 රීතිය සංශෝධනය කිරීම.
- බහු මුදල් පුවරුවේ සිදුවන සුරැකුම්පත් ගනුදෙනු සම්බන්ධව පැනවීමට ඇති ගාස්තු ව්‍යුහය.
- ද්විතීයික පුවරුවක් හඳුන්වාදීම හරහා, ලයිස්තුගත සමාගම් විසින් සිදුකරන අවම මහජන කොටස් හිමිකාරිත්වයට අදාල අනුකූල නොවීම් සම්බන්ධව යොදාගත යුතු ක්‍රියා පටිපාටියට අදාල වන, කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ රීති වල 7.13.2 හා 7.13.3 රීතින් සංශෝධනය කිරීම.

### ලයිස්තුගත ලේඛනයෙන් ඉවත් කිරීම්

සලකා බලන කාලය තුළදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 4(2) සහ 4(3) රීතින් අනුව පහත සමාගම් කොළඹ කොටස් වෙළෙඳපොළේ නිල ලයිස්තුවෙන් අනිවාර්ය ඉවත් කිරීම් වලට ලක් කෙරිණි.

- වනික් ඉන්කෝපරේෂන් පී. එල්. සී.
- පැලවත්ත ෂුගර් ඉන්ඩස්ට්‍රීස් පී. එල්. සී.
- ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී. එල්. සී.
- ඔරියෙන්ට් ගාමන්ට්ස් පී. එල්. සී.
- සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී. එල්. සී.
- පීසී හවුස් පී. එල්. සී.
- පීසී ෆාමා පී. එල්. සී.
- බ්‍රවුන්ස් කැපිටල් පී. එල්. සී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 5 වන රීතිය අනුව කොළඹ කොටස් වෙළෙඳපොළේ නිල ලයිස්තුවෙන් ස්වේච්ඡාවෙන් ඉවත් වීමට ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පී. එල්. සී. හට අවසර ලබා දෙන ලදී

### සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම්

මෙහෙයුම් වර්ෂය තුළදී ව්‍යාපාර අත්කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ අවස්ථා පහක් සලකා බලන ලදී. ඒ සඳහා අනුමැතිය ලබාදීමට පෙර කොමිෂන් සභාව විසින් ස්වාධීන උපදේශකයින් විසින් පිළියෙල කරන කරන ලද වාර්තාව සහ එහි අන්තර්ගත වටිනාකම තීරණය කිරීමේ ක්‍රමවේදයල ඒ සඳහා පදනම් කරගත් උපකල්පනයන් හි යෝග්‍යතාවය ඇතුළු කාරණාවන් පිළිබඳ විමසුමක් කරන ලදී. මෙවැනි වටිනාකම ගණනය කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදයන්ට අනුගත බවට සොයා බලන ලදී. එය තුළින් අදාළ ලැයිස්තුගත සමාගම් වලින් කරන ලද හෙළිදරව්කිරීම් වල පැහැදිලි බව වැඩි කිරීම බලාපොරොත්තුවෙන් එම වර්ෂය තුළදී පහත සඳහන් අත්කර කරගැනීම් සහ ඒකාබද්ධ කිරීම් සලකා බලන ලදී. (සංඛ්‍යා සටහන 02)

සංඛ්‍යා සටහන: 02 සමාගම් අත්පත් කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ/ සංග්‍රහය යටතේ සිදුකළ අර්පන

| අර්පණකරු | අර්පණ ලාභියා | අර්පණයේ ස්වභාවය | අර්පණය අවසන් කෙරුණ අවස්ථාවේ කොටස් හිමිකාරිත්වය (ආසන්න වශයෙන්) |
|---|---|---|---|
| ජෝජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් | සිට්‍රස් ලෙෂර් පී. එල්. සී. | අනිවාර්ය අර්පණයක් | 85.03% |
| ලෝටස් රිනිවබල් එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් | හැටන් ප්ලාන්ටේෂන් පී. එල්. සී. | අනිවාර්ය අර්පණයක් | 75.65% |
| සෙරෙනිටි ලේක් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් | හුන්නස් ෆෝල්ස් හෝටෙල්ස් පී. එල්. සී. | අනිවාර්ය අර්පණයක් | 93.47% |
| ස්ටර්ලින්ග් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී. එල්. සී. | අනිවාර්ය අර්පණයක් | 68.19% |
| සිංහ කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | සිංහපුත්‍ර ෆිනෑන්ස් පී. එල්. සී. | අනිවාර්ය අර්පණයක් | 54.88% |

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29(අ) වගන්තිය යටතේ පිරිනමනු ලැබූ අනුමැතියන්

ලැයිස්තුගත සමාගමක් විසින් ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් නිකුත් කිරීමේ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29(අ) වගන්තිය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් ආයතන වලට කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. (සංඛ්‍යා සටහන 3)

# මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා සටහන: 3 ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29(අ) වගන්ති යටතේ පිරිනමනු ලැබූ අනුමැතියන්

| නිකුත්කරුගේ නම | නිකුතුවේ ස්වභාවය | අනුමත කරන ලද මුදල | කාලසීමාව |
|---|---|---|---|
| සොෆ්ට්ලොජික් හෝල්ඩින්ග්ස් පී එල් සී | ජ්‍යේෂ්ඨ වගකීම් රහිත, ලැයිස්තුගත නොකළ, නිදහස් කළ හැකි, ශ්‍රේණිගත කළ ණයකර | රුපියල් බිලියන 2 | අවුරුදු 3 |
| ලකී ලංකා මිල්ක් ප්‍රොසෙසින් කම්පනි පී එල් සී | ලැයිස්තුගත නොකළ පරිවර්තනය කළ හැකි ණයකර | රුපියල් මිලියන 350 | අවුරුදු 20 |
| ලංකා බැංකුව | බාසල් iii අනුකූල ස්ථර 2, ලැයිස්තුගත නොකළ වගකීම් රහිත,අප්‍රධාන නිදහස් කළ හැකි, ශක්‍ය නොවන විට කපා හළ හැකි ලක්ෂණ සහිත ණයකර | රුපියල් බිලියන 12 | ඒ සහ බී වර්ගය අවුරුදු 5<br><br>සී සහ ඩී වර්ගය අවුරුදු 8 |

### කොළඹ කොටස් වෙළෙඳපොලේ බලාත්මක රීති නොපිළිපැදීම සඳහා තාවකාලිකව කල් තබා ගැනීම සඳහා අවශ්‍යයි අයදුම්පත් පුනරීක්ෂණය කිරීම

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති 7.5 (ඩී) (i) 9 ප්‍රකාරව ලැයිස්තුගත ආයතන බලාත්මක රීති පිහිටි නොපිළිපැදීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් තාවකාලිකව කල් තබා ගැනීම සිදු නොකරන්නේ නම් හෝ අදාළ අහිතකර මතය හෝ මතයක් ප්‍රකාශ කර සිටීමෙන් වැලකීමට තුඩුදෙන කරුණු ලැයිස්තුගත සමාගමේ සුරැකුම්පත් ලැයිස්තුවට මාරුකළ දින සිට මාස හයක් ඇතුළත විසඳන්නේ නම්, ලැයිස්තුගත ආයතනයේ සුරැකුම්පත් වෙළඳාම අත්හිටවනු ලැබේ. ලැබුණු අයදුම්පත් වල තත්වය පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 04)

සංඛ්‍යා සටහන: 04 කොටස් වෙළෙඳපොළේ බලාත්මක රීති නොපිළිපැදීම සඳහා තාවකාලිකව කල්තබා ගැනීම

| සමාගමේ නම | අයදුම්පතෙහි තත්ත්වය |
|---|---|
| අහිලානා හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපටීස් පී එල් සී | කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති 7.5 (ඩී) (i) 9 වගන්තියේ විධිවිධාන භාවිතා කිරීමට සමාගම තීරණය කිරීම හේතුවෙන් අයදුම්පත සලකා බැලීම් අත්හිටුවන ලදී |
| අගලවත්ත ප්ලාන්ටේෂන්ස් පී එල් සී | සුරැකුම්පත් වෙළෙඳාම අත්හිටුවීම තාවකාලිකව කල් දැමීමට අවසර ලබා දෙන ලදී |
| වීචි වී වී ෆුඩ්ස් පී එල් සී | සුරැකුම්පත් වෙළෙඳාම අත්හිටුවීම තාවකාලිකව කල් දැමීමට අවසර ලබා නොදෙන ලදී |
| ස්ටෑන්ඩර්ඩ් කැපිටල් පී එල් සී | කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම් ලැයිස්තුවෙන් ඉවත් කිරීම කල්දැමීම සඳහා වන අයදුම්පත සමාලෝචනය කිරීම වාර්තාකරන දිනට අනුව ක්‍රියාත්මක වෙමින් පවතී |
| ඇඩම් ඉන්වෙස්ට්මන්ට් පී එල් සී<br>ඇඩම් කැපිටල් පී එල් සී | කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම් ලැයිස්තුවෙන් ඉවත් කිරීම් කල්දැමීම සඳහා වන අයදුම්පත සමාලෝචනය කිරීම වාර්තාකරන දිනට අනුව ක්‍රියාත්මක වෙමින් පවතී |

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 28 (අ) වගන්තිය යටතේ පිරිනමනු ලැබූ අනුමැතිය

කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත වීමට අපේක්ෂා කරනු ලබන පොදු සමාගමක්, ලැයිස්තුගත වන දිනට පෙර වසරක කාලසීමාවක් තුළදී, එනම් පුද්ගලයෙකු හට කොටස් විභජනය කර ඇත්නම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලිඛිත අවසරයක් මත හැර එම සමාගමේ කොටස් හෝ කොටස් වලට පරිවර්තනය කළ හැකි සුරැකුම්පත්, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කළ නොහැක. වසර තුළදී ග්‍රේන් ''එන්'' ග්‍රීන් සමාගම විසින් යොමු කරන ලද අයදුම්පත සමාලෝචනය කරන ලදී.

### මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම

තැන්පතුකාර සම්බන්ධ ගෝලීය ප්‍රමිතීන් පවත්වාගනිමින් ගෝලීය තලයේ ඇති අනෙකුත් තැන්පතුකාර වල ව්‍යාපාර මෙහෙයුම් සමග සම මට්ටමින් පවත්වාගෙන යා හැකි ලෙසට ව්‍යාපාර කටයුතු ප්‍රසාරණය කිරීමට මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගමට හැකියාව ඇති වන ලෙසට එහි මෙහෙයුම් පුළුල් කිරීම සඳහා එහි සාංගමික ව්‍යවස්ථාවලියට කළ සංශෝධන වලට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදී.

ජාත්‍යන්තර වශයෙන් ඇති අනෙකුත් තැන්පතුකාර විසින් පිරිනමන සේවාවන් සමග සැසඳෙන සේ ලයිස්තුගත සහ ලයිස්තුගත නැති සමාගම් වල ආයතනික ක්‍රියා හැසිරවීමට භාර ගැනීම මගින් තම සේවාවන් තැන්පතුකාර ක්‍රියාකාරකම් වලින් ඔබ්බට ප්‍රසාරණය කිරීමට මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම තීරණය කර ඇත. මෙම සේවා මගින් මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම විසින් සපයන ආයතනික ක්‍රියා සේවාවන් වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ නිකුත්කරන්නන්ගේ පිරිවැය අඩු කිරීම අපේක්ෂා කෙරේ.

### වෙළඳ භූමියෙන් බැහැර ගනුදෙන

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 28 (1) වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළක ලැයිස්තුගතව ඇති පොදු සමාගමක සුරැකුම්පත් දරන පුද්ගලයෙකු විසින් එබඳු බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළ විසින් අනුග මනය කරනු ලබන ගනුදෙනු පටිපාටියට අනුකූල නොවන පරිදි එකී සුරැකුම්පත් මිලදී ගැනීම, විකිණීම, තෑගි කිරීම හෝ වෙනත් ආකාරයකින් ගනුදෙනු කිරීම කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව සිදු නොකළ යුතුයි.

මෙහෙයුම් වර්ෂය තුළදී, විශේෂිත පැවරීම්, 473 ක් සඳහා අනුමැතිය ලබාදුන් අතර, කොටස් ත්‍යාග කිරීම 118 ක් කොමිෂන් සභාවේ අවධානය පිණිස යොමු කරන ලදී. ආන්තික ගනුදෙනු, තනි පුද්ගල ගිණුම් හවුල් බවට හැරවීම, හවුල් ගිණුම් තනි පුද්ගල ගිණුම් බවට හැරවීම්, මූල්‍ය පහසුකම් ලබා ගැනීම් විශේෂිත ත්‍යාග පැවරීම්, රක්ෂණ ව්‍යාපාරය වෙනස් කිරීම්, භාරකාරීත්වය වෙනස් කිරීම්, ඒකාබද්ධ කිරීම්, ස්වේච්ඡා අර්පණ, අනිවාර්ය අර්පණ, ප්‍රතිව්‍යුහ-ගත කිරීම් , භාරකාරීත්වය අත්හිටුවීම්, ආන්තික සැපයීමේ යෙදෙන්නන් අත්හිටුවීම හා සමාගම් නාමය සමාගම් රෙජිස්ට්රයෙන් ඉවත් කිරීම් ආදිය සඳහා විශේෂිත පැවරීම් සිදු කෙරිණ.

ලයිස්තුගත කිරීමේ රීති වල 7.13.3 (iii) රීතියෙහි දක්වා ඇති පරිදි අතිවිශේෂ පසු තත්වයන් හේතුවෙන් අවම මහජන කොටස් හිමිකාරීත්වය සම්බන්ධ අවශ්‍යතා සමග අනුකූල වීමට අපොහොසත් වීම නිසා ලයිස්තුගත සමාගම් (11) වලට කාල දිගුවන් ලබාදීමට කොළඹ කොටස් වෙළෙඳපොළට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟතාව ලබාදෙන ලදී.

### අධීක්ෂණය සහ අනුකූලතාවයන්

වෙළෙඳපොළ සහභාගිවන්නන් තම සේවාදායකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන සහ වෙළෙඳපොළෙහි අඛණ්ඩතාව ආරක්ෂා කරන අයුරින් හැසිරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඵලදායී නියාමනය සඳහා සුදුසු නීති සහ නියාමන ප්‍රමිතීන් අත්‍යවශ්‍ය බැවින් වෙළෙඳපොළ සහභාගීවන්නන් ඔවුන් ක්‍රියාත්මක වන නියාමන රාමුවට අනුකූල විය යුතුය. අපගේ අධීක්ෂණ ක්ෂේත්‍රයන් මගින් දූරදර්ශී සහ ව්‍යාපාරික හැසිරීම යන දෙකම ආවරණය කරන අතර වෙළෙඳපොළ සහභාගීවන්නන්ගේ අනුකූලතාවය සහතික කිරීම සඳහා අප විතැන් පරීක්ෂාවන් සහ විතැන් පරීක්ෂාවන්ගෙන් සමන්විත පුළුල් මෙවලම් භාවිතා කරන්නෙමු.

එපමණක් නොව, දැනුවත් ආයෝජන තීරණ ගැනීම සඳහා ආයෝජකයින්ට විශ්වාසදායක, කාලෝචිත හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම සහතික කිරීම සඳහා ලයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා සමාලෝචනය ද සිදුකරයි.

### ලැයිස්තුගත සමාගම්

මූල්‍ය වර්ෂය අවසාන වී මාස 5 ක් ඇතුළත සියලුම ලැයිස්තුගත සමාගම් විසින් ඒවායේ වාර්ෂික වාර්තා කොටස් හිමියන්ට සහ කොළඹ කොටස් වෙළෙඳපොළට ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම් වල වාර්ෂික වාර්තා විමර්ශනය කරනු ලබන අතර, අදාල නීති රීති වලට අනුගත නොවීම් පිළිබඳ තොරතුරු සමාගම් වලට දැනුම් දෙනු ලැබේ.

මෙම කාර්යයේ අරමුණ වන්නේ ලැයිස්තුගත සමාගම් වල මූල්‍ය වාර්තාකරණයේ සහ තොරතුරු ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම වේ. සුරැකුම්පත් වෙළෙඳපොළෙහි විනිවිදභාවය සහ වගකිවයුතුභාවය ස්ථාපිත කිරීමත්, වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම තහවුරු කිරීමත් සඳහා ලැයිස්තුගත සමාගම් විසින් ප්‍රමාණාත්මක තොරතුරු කඩිනමින් නිකුත්කිරීම අවශ්‍ය වේ.

වාර්ෂික වාර්තා විමර්ශනය කිරීමේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ.

- කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත රීතීන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සමාගම් පනතෙහි අදාළ විධිවිධාන.
- සාංගමික පාලනය සම්බන්ධ භාවිතයන්.
- මූල්‍යමය අවධාරණයන්.
- සභාපතිතුමාගේ වාර්තාව.
- අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව.
- ස්වාධීන විගණකගේ වාර්තාව.
- කොටස් හිමියන්ගේ සහ ආයෝජකයන්ගේ තොරතුරු.
- මූල්‍ය දත්ත.
- අධ්‍යක්ෂකවරුන්ගේ උප කමිටුවල වාර්තා.

කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත රීතීන් සහ අදාළ විධිවිධාන වලට අනුකූලව වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ ඉදිරිපත් කිරීමට පැවරී ඇති වගකීම පිළිබඳව සමාගම් වල දැනුවත්භාවය වර්ධනය කිරීමට දායක වීමේ අරමුණින් ක්‍රියාවලිය පවත්වාගෙන යනු ලැබේ.

මෙහෙයුම් වර්ෂය තුළ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මූල්‍ය වාර්තා 115 ක් විමර්ශනය කර ඇති අතර එකී සමාගම්හි අදාල නීති රීති/ විධිවිධාන වලට අනුකූල වීම, වර්ධනය කිරීමත්, හෙළිදරව් කිරීම් දියුණු කිරීමත් උදෙසා අවශ්‍ය උපදෙස් සහිත ලිපි 97 ක් නිකුත් කර ඇත.

මෙයට අමතරව මෙහෙයුම් වර්ෂය තුළදී ණය නිකුතු සංස්ථා ප්‍රකාශන 16 ක් සහ හිමිකම් නිකුතු සම්බන්ධ ප්‍රකාශන 2 ක් විමර්ශනය කර ඇත.මීට අමතරව බාසල් iii අනුගත වීම සඳහා වූ නිකුතූන් 4 ක් සඳහා නව ප්‍රතිපත්ති දියුණු කර තිබේ. (සංඛ්‍යා සටහන 5)

වාර්ෂික වාර්තාව විමර්ශනය තුළින් වැඩිදුර කරුණු විමසීමට අදාළ වන අසාමාන්‍ය ගනුදෙනු සහ අනුගත නොවීම් 24 ක් හඳුනාගන්නා ලදී.

ලැයිස්තු ගත සමාගම් වල නිවේදන සහ සාංගමික කටයුතු සම්බන්ධව ගත් නියාමන ක්‍රියාමාර්ග පහත සඳහන් වේ. (සංඛ්‍යා සටහන 5)

සංඛ්‍යා සටහන 05: ලැයිස්තුගත සමාගම් වල නිවේදන සහ සාංගමික කටයුතු සම්බන්ධව ගත් නියාමන ක්‍රියාමාර්ග

| නිවේදන/ සාංගමික කටයුතු | අවස්ථා ගණන/ ලැයිස්තුගත සමාගම් ගණන |
|---|---|
| පැහැදිලි කිරීම් ඉදිරිපත් කරන ලෙස කරන ලද දැනුම් දීම්. (ලැයිස්තුගත සමාගම් වල හෙළිදරව් කිරීම්වල වලංගුභාවය තහවුරු කිරීම පිණිස) | අවස්ථා 114 |
| කොළඹ කොටස් වෙළෙඳපොළ හරහා හෙළිදරව් කරන ලෙස මෙහෙයවීම. (හෙළිදරව් කිරීම් නිවැරදි කිරීම පිණිස) | • සිටි හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පනි<br>• එයිට්කන් ස්පෙන්ස් ප්ලාන්ටේෂන් මැනේජ්මන්ට්ස් පී එල් සී<br>• අමානා තකාෆුල් පී එල් සී<br>• බේරුවල රිසෝට්ස් පී එල් සී |

මෙහෙයුම් වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම් විසින් සිදුකකළ වෙළෙඳපොළ දැනුම්දීම් විමර්ශනයට ලක් කොට, අවස්ථා 114 ක් සඳහා ලැයිස්තුගත සමාගමෙන් කොළඹ කොටස් වෙළෙඳපොළෙන් පැහැදිලි කිරීම් කැඳවන ලදී. එම පැහැදිලි කිරීම්, සමාගම් වෙබ් ලැයිස්තුවේ තිබියදී අධ්‍යක්ෂකවරුන් කරන ලද ගණුදෙනු (7), ප්‍රමාද වී කළ හෙළිදරව් කිරීම් (7), අධ්‍යක්ෂවරුන්ගේ වෙන්ස්කම් (82), සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනු (5) සහ ක්ෂණික වෙළෙඳපොළ හෙළිදරව් අවශ්‍ය වෙනත් සාංගමික හෙළිදරව් වන ලියාපදිංචි ලිපිනයේ වෙනස්

# මෙහෙයුම් සමාලෝචනය

වීම් (4), සමාගම් ලේකම් වෙනස්වීම් (4), විගණන වෙනස්වීම් (2), ප්‍රමාණීකරණය කිරීම් විමර්ශන (1), සමාගමේ ඒකාබද්ධ වීම් (1) සහ සම්බන්ධිත පාර්ශව විසින් කළ ගණුදෙනු (1) වශයෙන් වේ.

### අනෙකුත් නියාමන ආයතන වෙත යොමු කරන ලද කාරණා

හඳුනාගැනීම්, තක්සේරුකිරීම් සහ අනාවරණය කිරීම් අදාළ ප්‍රමිතීන්ට අනුකූලද යන්න පැහැදිලි කිරීම සඳහා පහත සඳහන් කරුණු ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පාලන මණ්ඩලයට යොමු කරන ලදී. (සටහන 06)

සටහන 06: අනෙකුත් නියාමන ආයතන වෙත යොමු කරන ලද කාරණා

| නියාමන ආයතනය | සමාගම් ගණන | කුමන කරුණරුණක් සම්බන්ධයෙන් ගැටළුවක් ද යන වග සහ එහි ප්‍රතිඵලය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධ්‍යක්ෂ මණ්ඩලය (SLAASMB) | 4 | සිටි හවුසිං ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැණි පී එල් සී: සමාගමේ/ සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 7 (LKAS7) - මුදල් ප්‍රවාහ ප්‍රකාශන අනුකූලව පිළියෙල කර තිබේද යන්න පිළිබඳව හා විශේෂයෙන් විගනක ඔහුගේ වගකීම සැලකිලිමත්ව නිසි ලෙස ඉටු කර තිබේද යන්න පිළිබඳව පැහැදිලි කිරීම් ලබා ගැනීම පිණිස |
| | | ටැන්ජරින් බීච් හොටෙල්ස් පී එල් සී හඳුනාගැනීම, මිනුම් හා හෙලිදරව් කිරීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්ට අනුකූලද යන්න පිළිබඳව පැහැදිලි කිරීම් ලබා ගැනීම පිණිස |
| | | ටෙස් ඇග්‍රෝ පී එල් සී හඳුනාගැනීම, මිනුම් හා හෙලිදරව් කිරීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්ට අනුකූලද යන්න පිළිබඳව පැහැදිලි කිරීම් ලබා ගැනීම පිණිස |
| | | රේඩියන්ට් ජෙම්ස් ඉන්ටර්නැෂනල් පී එල් සී හඳුනාගැනීම, මිනුම් හා හෙලිදරව් කිරීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන්ට අනුකූලද යන්න පිළිබඳව පැහැදිලි කිරීම් ලබා ගැනීම පිණිෂ සහ විශේෂයෙන් විගණක ඔහුගේ වගකීම් සැලකිලිමත්ව නිසි ලෙස ඉටු කර තිබේද යන්න පිළිබඳව පැහැදිලි කිරීම් ලබා ගැනීම පිණිස. |

### බලපත්‍රලාභී සහ ලියාපදිංචි ආයතන පාලනයන්

#### කොටස් තැරැව්කාර සමාගම්

1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව කොටස් තැරැව්කාර සමාගම් වලට බලපත්‍ර නිකුත් කිරීම සහ බලපත්‍රලාභී සමාගම් වල කටයුතු අධීක්ෂණය කිරීම කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි. එම ආයතන වල මූල්‍ය ස්ථාවරත්වය සහ මෙහෙයුම් ශක්‍යතාවය තහවුරු කිරීම මඟින් ආයෝජකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ විශ්වාසය වැඩි දියුණු කිරීම අපගේ අරමුණයි.

අවදානම පදනම් කරගත් ආකෘතියක් මඟින් කොටස් තැරව්කාර ආයතන වලට බලපාන විචක්ෂණ, මූල්‍ය, ණය නෛතික සහ මෙහෙයුම් වැනි අවදානම් සිදුවීමේ සම්භාවිතාවය සහ එමඟින් ඇති වන බලපෑම තක්සේරු කරන අතරම අදාල නීතිරීති සහ නියාමනයන් වලට දක්වන අනුකූලතාවය ද, සලකා බලනු ලබයි.

බලපත්‍රලාභී කොටස් තැරව්කාර ආයතන මඟින් යොමුකරනු ලබන මූල්‍ය වාර්තා, අනුකූල වාර්තා, විද්‍යුත් දත්ත ගොනු කිරීමේ පද්ධතියට යොමුකරනු ලබන වාර්තා සහ අනෙකුත් අදාළ වාර්තා පරීක්ෂණය හා විශ්ලේෂණය කිරීම විතැන් පරීක්ෂාව යටතේ සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ගතවූ වර්ෂය තුළ උපරිම කැපවීමෙන් යුතුව ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ හා සම්බන්ධ ජනතාව තුළ වෙළෙඳපොළ කෙරෙහි විශ්වාසය තහවුරු කිරීම සඳහා ඵලදායී බලාත්මක කිරීමේ ක්‍රමෝපායන් හා හඳුනාගත් අක්‍රමිකතා වැළැක්වීමේ ප්‍රයත්නයන් ක්‍රියාත්මක කරනු ලබයි.

2019 වර්ෂය තුළදී, කොළඹ කොටස් වෙළෙඳපොළ කොටස් තැරැව්කරුවන්ගේ රීති අංක 12 ට අනුකූලව සහ කොටස් වෙළෙඳපොළ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සහ කොමිෂන් සභා අනුමැතිය යටතේ කොටස් තැරැව්කාර ආයතන 2ක් සිය ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අවුරුදු 2ක කාල සීමාවකට ස්වෙච්ඡාවෙන් අක්‍රිය කරන ලදී.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ ජාතික ප්‍රතිපත්තිය 2010-2015 (National Anti Money Loundering and Countering the Financing of Terrorism Policy 2010-2015-AML/ CFT) ට අනුව AML/CFT සබැඳි අධීක්ෂණය ශක්තිමත් කිරීමේ අරමුණෙන් වෙළෙඳපොළ

සහභාගිකරුවන් සඳහා අවදානම පදනම කරගත් අධීක්ෂණ ආකෘතියක් ගොඩ නගන ලද අතර, එම අධීක්ෂණ ආකෘතියට අනුකූලව කොටස් තැරැව්කාර ආයතන කිහිපයක AML/CFT පදනම් කරගත් එතැන් පරීක්ෂාවක් සිදුකරන ලදී.

2018 වර්ෂය හා සංසන්දනය කිරීමේදී, 2019 වර්ෂයේදී කොටස් තැරැව්කාර ආයතන වල සමස්ත පිරිවැටුමෙහි අඩුවීමක් දක්නට ලැබෙන අතර 2018 වර්ෂයේ රුපියල් මිලියන 149ක් ලෙස වාර්තා වූ ශුද්ධ අලාභය මෙම වර්ෂයේ රුපියල් මිලියන 37 ක් දක්වා අඩු වී ඇත. කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යාන දත්ත පහතින් දැක්වේ. (සංඛ්‍යා සටහන 7)

සංඛ්‍යා සටහන: 07 කොටස් තැරැව්කාර කර්මාන්තයේ කාර්යසාධනය

| | 2019 (රු '000) | 2018 (රු '000) | **වෙනස %** |
|---|---|---|---|
| පිරිවැටුම | 1,663,045 | 1,784,134 | (6.79) |
| ශුද්ධ තැරැව්කාර ගාස්තුව | 1,440,766 | 1,547,442 | (6.89) |
| වෙනත් ආදායම් | 707,329 | 786,797 | (10.10) |
| මෙහෙයුම් ලාභය/(අලාභය) | 40,483 | 23,691 | 70.88 |
| බදු වලට පෙර ශුද්ධ ලාභය/(අලාභය) | (79,453) | (83,724) | 5.10 |
| බදු වලට පසු ශුද්ධ ලාභය/(අලාභය) | (37,096) | (149,879) | 75.25 |
| මුළු වත්කම්* | 9,726,649 | 8,568,117 | 13.52 |
| මුළු වගකීම්* | 4,571,124 | 3,349,785 | 36.46 |
| අයිතිකරුවන්ගේ අරමුදල්* | 5,155,524 | 5,218,332 | (1.20) |

*2018/2019 දෙසැම්බර් 31 දිනට

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කළ විගණනය නොකරන ලද මූල්‍ය වාර්තා

**වෙළෙඳපොළ අතරමැදි ආයතන**

ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි අතරමැදි ආයතන ලෙස කටයුතු කරන ආන්තික ණය සැපයුම්කරුවන්, ආයෝජන කළමනාකරුවන්, ණය ප්‍රාමාණිකරන ආයතන, ප්‍රාරක්ෂණ ආයතන සහ සුරැකුම්පත් නිශ්කාශණ ආයතන ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් සිදු කරයි.

කොමිෂන් සභාවේ මූලික ආකාර අරමුණ වන්නේ, වෙළෙඳපොළ අතරමැදි ආයතන වල ක්‍රියාපටිපාටිය අධීක්ෂණය කිරීම මගින් එම ආයතන වල මූල්‍ය ස්ථාවරත්වය, මෙහෙයුම් ශක්‍යතාවය සහ අභ්‍යන්තර පාලන පටිපාටීන් පාලනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන්හි ප්‍රමාණවත් භාවය තහවුරු කිරීමයි.

වෙළෙඳපොළ අතරමැදි ආයතන වලට බලපාන අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා විශේෂයෙන් සකසන ලද ඵලදායී සහ ශක්තිමත් නියාමන ආකෘතියක් එතැන් සහ විතැන් පරීක්ෂා සඳහා යොදාගනු ලබයි.

ඒ අනුව, මෙම වර්ෂය තුළදී ද ලියාපදිංචි වෙළෙඳපොළ සහභාගිකරුවන් අවදානම පදනම් කරගත් එතැන් පරීක්ෂාවන්ට ලක්කරන ලදී. තවද, ආයෝජන කලමණාකරුවකු ලෙස නව බලපත්‍රයක් ගැනීම සඳහා ඉල්ලුම් කරන ලද ආයතනයක යෝග්‍යතාවය සහ නියාමන නීතිරීති වලට දක්වන අනුකූලතාවය පරීක්ෂා කිරීම සඳහා එතැන් පරීක්ෂාවක් (pre-licensing inspection) සිදු කිරීමෙන් අනතුරුව එම ආයතනට ආයෝජන කළමනාකරුවකු ලෙස ක්‍රියා ක්‍රියාත්මක වීම සඳහා නව බලපත්‍රයක් නිකුත් කරන ලදී.

වෙළෙඳපොළ අතරමැදි ආයතන සඳහා වන නියාමන ආකෘතිය ශක්තිමත් කිරීමේ අරමුණෙන් එම නියාමන නීති රීති මෙම වර්ෂය තුළදී පුනරීක්ෂණයට ලක් කරන ලදී. තවද, ප්‍රාග්ධන වෙළෙඳපොළ ව්‍යාපාර කටයුතු වඩාත් ඉහළ ප්‍රමිතියකින්, වගකිවයුතුභාවයකින් සහ විනිවිද භාවයකින් සිදු කිරීමේ අරමුණෙන් සියලුම වෙළෙඳපොළ අතරමැදියන්ට 2019 සැප්තැම්බර් 1 දින සිට බලපැවැත්වෙන පරිදි යෝග්‍යතා මාර්ගෝපදේශ (Guidelines on Fitness and Propriety) සමඟ අනුකූල වීම අනිවාර්ය කරන ලදී. (සංඛ්‍යා සටහන 8)

# මෙහෙයුම් සමාලෝචනය

(සංඛ්‍යා සටහන 08): වෙළෙඳපොළ අතරමැදි ආයතන වල මූල්‍ය කාර්යසාධනය (2019 දෙසැම්බර් 31 දිනට)

| | මුළු පිරිවැටුම් (රු. මිලියන) | බදු වලට පෙර ශුද්ධ ලාභය (රු. මිලියන) | මුළු වත්කම් (රු. මිලියන) | මුළු වගකීම් (රු. මිලියන) |
|---|---|---|---|---|
| ආන්තික ණය සැපයුම්කරුවන් | 156,879.93 | 42,563.61 | 1,974,472.87 | 1,750,242.20 |
| ආයෝජන කළමණාකරුවන් | 1,369.55 | 311.11 | 10,634.74 | 3,809.98 |
| කොටස් ප්‍රාරක්ෂකයන් | 247.41 | (622.08) | 3,817.44 | 122.77 |
| ණය ප්‍රාමාණිකරණ ආයතන | 208.68 | 89.39 | 291.57 | 97.22 |
| බහු කාර්ය ආයතනෆ | 269,230.70 | 110,132.02 | 6,327,459.12 | 5,763,616.06 |

*ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් නියාමනය වන කාර්යයන් කිහිපයක ක්‍රියාත්මක වීම සඳහා ලියාපදිංචිය ප්‍රදානය කර ඇති ආයතනයන්

### ඒකක භාර කර්මාන්තය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් මෙම වර්ෂය තුළදීත් පදනම් කරගත් ආකෘතියකට අනුකූලව ඒකක භාර කළමනාකරණ සමාගම් වල අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. මෙම ආකෘතිය මගින් ඒකක භාර කළමනාකරණ සමාගම් වල විචක්ෂණ, මෙහෙයුම් සහ කළමණාකරන ක්‍රියාමාර්ග යන ප්‍රධාන අවදානම් ආවරණය කරමින් එම ආයතන වල මූල්‍ය ස්ථාවරත්වය, අභ්‍යන්තර පාලන පටිපාටීන්, පාලන තොරතුරු පද්ධති, නීති සහ නියාමන යන අවශ්‍යතාවයන්හි ප්‍රමාණාත්මක භාවය තක්සේරු කරනු ලබයි.

කොමිෂන් සභාවේ සිදු කරනු ලබන විතැන් පරීක්ෂාව ද 2019 වර්ෂය තුළ දී තවදුරටත් ශක්තිමත් කරන ලද අතර ඒකක භාර කළමනාකරණ සමාගම් වලින් විගණනය නොකරන ලද මාසික මූල්‍ය වාර්තා පරීක්ෂා කිරීම මගින් එම සමාගම් වල ස්ථාවරත්වය සහ කොමිෂන් සභාව මගින් නිකුත් කර ඇති අවම ශුද්ධ වත්කම් අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කරන්නේද යන්න පරීක්ෂා කෙරිණි. මීට අමතරව ඒකක භාරයන්හි ආයෝජන සීමාව හා ද්‍රවශීලතාව අධීක්ෂණයට ලක් කිරීමෙන් එම ඒකක භාරයන්, ඒකක භාර සංග්‍රහය, භාර ඔප්පුව සහ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විධානයන්ට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කරන ලදී.

2019 දෙසැම්බර් 31 දිනට ඒකක භාර අරමුදල් වල මුළු ශුද්ධ වත්කම් දළ වශයෙන් රු. බිලියන 104.79 ක් පමණ වන අතර ඒකක භාර ආයෝජනයන් ගණන පසුගිය වසරට සාපේක්ෂව 10% කින් ඉහළ ගොස් ඇත. (සංඛ්‍යා සටහන 09) (රූප සටහන 01)

සංඛ්‍යා සටහන 09: ඒකක භාර අරමුදල් වල සමස්ත තත්ත්වය

| | 31.12.2019 දිනට | 31.12.2018 දිනට | වෙනස % |
|---|---|---|---|
| අනුමැතිය ලද ඒකක භාර අරමුදල් ගණන් | 71 | 75 | (5.33) |
| ඒකකභ භාර වල ශුද්ධ වත්කම් අගය (රුපියල් බිලියන) | 104.79 | 64.22 | 63.17 |
| ඒකක හිමියන් ගණන | 46,481 | 42,093 | 10.42 |
| නිකුත් කළ ඒකක ගණන (රුපියල් මිලියන) | 4,769 | 3,368 | 41.60 |
| හිමිකම් වල් ආයෝජනය (රුපියල් මිලියන) | 9,841 | 9,416 | 4.51 |
| භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය (රුපියල් මිලියන) | 9,150 | 3,379 | 170.79 |
| අනෙකුත් මූල්‍ය උපකරණ වල ආයෝජනය (රුපියල් මිලියන) | 84,542 | 50,601 | 67.08 |

*වාණිජ පත්‍ර, තැන්පතු සහතික, ණයකර, බැංකු තැන්පතු ආදිය.

මූලාශ්‍රය; ඒකකභාර කළම භාර කළමනාකරණ සමාගම් වල නියාමන යොමු කිරීම්

**සංඛ්‍යා සටහන 01: 2019 දෙසැම්බර් 31 දිනට ඒකකභාර කළමනාකරණ සමාගම් වල වෙළෙඳපොළ කොටස**




- සීමාසහිත සිලෝන් ඇසට් කළමනාකරණ සමාගම
- සීමාසහිත කොම්ට්‍රස්ට් ඇසට් කළමනාකරණ සමාගම
- සීමාසහිත එන් ඩී බී වෙල්ත් කළමනාකරණ සමාගම
- සීමාසහිත සී බෑන්ක් ඇසට් කළමනාකරණ (පුද්ගලික) සමාගම
- නැෂනල් ඇසට් කළමනාකරණ සමාගම
- ෆස්ට් කැපිටල් ඇසට් කළමනාකරණ සමාගම
- සීමාසහිත ජේ බී ෆයිනෑන්ෂල් කළමනාකරණ (පුද්ගලික) සමාගම
- සීමාසහිත ගාර්ඩියන් ඇක්විටි ඇසට් කළමනා කළමනාකරණ සමාගම
- සීමාසහිත කැන්ඩොර් ඇසට් කළමණාකනාකරණ (පුද්ගලික) සමාගම
- සීමාසහිත ඇසෙට් ට්‍රස්ට් කළමනාකරණ (පුද්ගලික) සමාගම
- සීමාසහිත කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් සමාගම
- සීමාසහිත ආර්පිකෝ ඇට්‍රක්සියා ඇසට් කළමනාකරණ සමාගම
- ප්‍රෙමියර් වෙල්ත් කළමනාකරණ (පුද්ගලික) සමාගම
- සීමාසහිත ඇසට්ලයින් කැපිටල් (පුද්ගලික) සමාගම

### කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සම්බන්ධයෙන් සිදුකළ එතැන් පරීක්ෂාව

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ පාලනයන්, ප්‍රමිතීන්, ක්‍රියා පටිපාටි, ක්‍රියාවලීන්, පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණය සහ කාලෝචිත ලෙස නීති රීති බලාත්මක කිරීම පිළිබඳ කාර්යක්ෂමතාව සහ ප්‍රමාණවත් බව තීරණය කිරීම සඳහා 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එතැන් පරීක්ෂාවක් සිදු කරන ලදී. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධානවලට අනුකූලව සහ එහි නීති රීතිවලට අනුකූලව කටයුතු සිදුකෙරේද යන්න පිළිබඳව ද සොයාබැලීම අපගේ පරීක්ෂණයේ මූලික අරමුණ විය.

ඒ අනුව, එක් එක් උපායමාර්ගික ව්‍යාපාරික ඒකකවල අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ක්‍රියාත්මක වන පද්ධති, පාලන සහ ක්‍රියා පටිපාටි අවධාරණය කරමින් අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද පරීක්ෂණ වැඩසටහනක් මගින් එම එතැන් පරීක්ෂාව සිදු කරන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් වැඩිදියුණු කරගත යුතු සහ අනුගතවීම් සඳහා නියමිත කාල නියමයන් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණ ඇතිව ඉහත සඳහන් පරීක්ෂාව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරන ලදි.

### ආවේක්ෂණ, විමර්ශණ හා බලාත්මක කිරීම්

වෙළෙඳපොළ අවංකභාවය යනු මූලික නියාමන පරමාර්ථයක් වන අතර එය

ප්‍රාග්ධන වෙළෙඳපොළේ සුමට ක්‍රියාකාරීත්වයට අතිශයින්ම වැදගත් වේ.

වෙළෙඳපොළ අවංකභාවය පවත්වා ගැනීම සඳහා අප ආවේක්ෂණය කිරීම්, විමර්ශනය කිරීම් සහ බලාත්මක කිරීම් ඇතුළු ක්‍රියාමාර්ග රාශියක් අනුගමනය කරමු.

## වෙළෙඳපොළ ආවේක්ෂණය

වෙළෙඳපොළ ආවේක්ෂණය යනු, වෙළෙඳපොළ සහ මිල කෘතීම ලෙස හැසිරවීම්, අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගණුදෙනු සහ පෙර විකුණුම් ඇතුලත් අයථා ගණුදෙනු මූලික අදියරේදීම වලක්වමින් වෙළෙඳපොළ ආයෝජකයින්ගේ සහ පාර්ශවකරුවන්ගේ විශ්වාසනීයත්වය ආරක්ෂා කර ගැනීම සඳහා යොදා ගැනෙන නියාමන පියවරකි.

සුරැකුම්පත් නීති උල්ලංඝනයන් හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා ස්වයංක්‍රිය ආවේක්ෂණ පද්ධතියක් භාවිතා කරමින් අප තථ්‍ය කාලීනව වෙළෙඳපොළ නිරීක්ෂණය කරන්නෙමු. හඳුනාගන්නා ලද සැකසහිත නීති කඩකිරීම් සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම සඳහා ආවේක්ෂණ වාර්තා සකස් කර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට වෙත යොමු කරනු ලැබේ. සැක සහිත ගනුදෙනු වලට අදාළ සම්බන්ධිත පාර්ශවයන් වෙනම ලැයිස්තුගත කර සමීපව නිරීක්ෂණය කරනු ලබයි.

## පූර්ව ක්‍රියාකාරී ආවේක්ෂණයන්

වෙළෙඳපොළ කෙරෙහි ඇති විය හැකි ඍණාත්මක බලපෑම අවම කිරීම සඳහා වෙළෙඳපොළ වැරදි සම්බන්ධ අවස්ථාවන් හඳුනා ගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ වෙනස්කම් හා ප්‍රවණතා ඇතුළුව ආයෝජකයින්, තැරැව්කරුවන් සහ වෙනත් පාර්ශවයන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධව පූර්ව නිරීක්ෂණයන් සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අසාමාන්‍ය ගනුදෙනු චර්යාවන් විශ්ලේෂණය කරමින් කිසිදු ප්‍රමාදයකින් තොරව ඊට සම්බන්ධ පාර්ශවයන්ගෙන් පැහැදිලි කිරීම් ලබාගනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2019 වර්ෂය තුළ ආයෝජන උපදේශකයින් 16 දෙනෙකුගෙන් සහ ආයෝජකයින් 06 දෙනෙකුගෙන් පැහැදිලි කිරීම් ලබාගෙන ඇත.

## ආවේක්ෂණ වාර්තා සහ සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ සොයා ගැනීම්, කොළඹ කොටස් හුවමාරුවෙන් යොමු කරනු ලබන ආවේක්ෂණ වාර්තා සහ බාහිරින් යොමු කරනු ලබන පැමිණිලි මත පදනම් වෙමින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව බරපතල සැක සහිත වෙළෙඳපොළ අක්‍රමිකතා හඳුනාගෙන ඇති අතර, ඒවා සමාලෝචනය කිරීමෙන් අනතුරුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම ආවේක්ෂණ වාර්තා/ ආවේක්ෂණ සටහන්, ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට (SIC) යොමු කරනු ලැබේ.

2019 වර්ෂය තුළදී, ආවේක්ෂණ වාර්තා 11 ක් සම්පූර්ණ කර ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ආවේක්ෂණ වාර්තා අතර අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගණුදෙනු අවස්ථා 07 ක්ද, වෙළෙඳපොළ සහ මිල කෘතීම ලෙස හැසිරවීම් සම්බන්ධ සිද්ධීන් 04 ක්ද සහ වෙනත් වෙළෙඳපොළ අක්‍රමිකතාවලින්ද සමන්විත වේ.

(මෙම වාර්තා අතර එක් වරද ඛණ්ඩයකට වඩා වැඩි ගණනකට සම්බන්ධ වූ අවස්ථාද තිබේ). සාපේක්ෂව දැඩි අවධානයක් යොමු නොකළ යුතු සැක සහිත වෙළෙඳපොළ වැරදි සඳහා ආවේක්ෂණ සටහන් සකස් කර ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට වෙත යොමු කර ඇත. (රූප සටහන 02)

රූප සටහන 02: අවේක්ෂණ වාර්තා සැක කටයුතු වැරදි




## අනාගත අවශ්‍යතා

නවීන අනතුරු ඇඟවීම් ක්‍රමවලින් නීතියට පටහැනි වෙළෙඳපොළ හැසිරීම් හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් මෙවලම් වලින් සමන්විත නව ආවේක්ෂණ මෘදුකාංග පද්ධතියක් ලබා ගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කටයුතු කරමින් සිටී. වෙළෙඳපොළ මූලික කරගත් විශ්ලේෂණයන් සහ දෘශ්‍යකරණ මෙවලම් මගින් සහාය ලබාදෙන ශක්තිමත් හා නම්‍යශීලී ක්‍රියාවලියක් මෙම පද්ධතිය තුළට ඇතුලත් වනු ඇතැයි අපේක්ෂා කර ඇත.

## විමර්ශන කටයුතු

ශ්‍රී ලංකා සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණු වන ක්‍රමවත් හා සාධාරණ ප්‍රාග්ධන වෙළෙඳපොළක් පවත්වාගෙන යාම සහ ආයෝජක අයිතීන් ආරක්ෂා කිරීම උදෙසා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන කර්තව්‍යයන් තව දුරටත් වැඩි දියුණු කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනත සහ ඒ යටතේ බලාත්මක කරන ලද රීති ප්‍රකාරව අභ්‍යන්තරික වෙළඳාම ,ව්‍යාජ වෙළෙඳපොල/මිල තත්ත්වයන් නිර්මාණය කිරීම, පෙර විකිණීම් සහ අනිකුත් වෙළෙඳපොල විෂමාචාර යනාදී සැකසහිත ප්‍රාග්ධන වෙළෙඳපොල වැරදි සම්බන්ධව විමර්ශනයන් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2019 වර්ෂය තුලදී විමර්ශන තුනක් (3) ක් සාර්ථක ලෙස නිමකරන ලදී. ව්‍යාජ වෙළෙඳපොල/මිල තත්ත්වයන් නිර්මාණය කිරීම සම්බන්ධ ඉන් එක් විමර්ශන යක් නිම කිරීමෙන් පසු කොමිෂන් සභාව විසින් පුද්ගලයින් තුන් දෙනෙකුට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී නඩු පවරා ඇත. තවත් එක් විමර්ශන යක් අවසානයේදී කොමිෂන් සභාවේ තීරණය පරිදි අභ්‍යන්තරික වෙළඳාම,ව්‍යාජ වෙළෙඳපොල/මිල තත්ත්වයන් නිර්මාණය කිරීම සහ පෙර ගණුදෙනු සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකු සඳහා අනතුරු ඇඟවීමක් කර ඇත. කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් 2016 වර්ෂයේදී නැවත ආරම්භ කරනලද එක් විමර්ශනයක් ද මෙම වර්ෂය තුලදී නිමකරන ලදී. තවත් එක් විමර්ශන යකදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කරන ලද කැඳවීම් (Notice of Summons) සඳහා නොපැමිණි පුද්ගලයින් දෙදෙනෙකුට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගරු නීතිපතිවරයා වෙත යොමු කර ඇත.

2019 වසරේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අභ්‍යන්තරික වෙළඳාම පිලිබඳ විමර්ශන දෙකක් ද(2) ව්‍යාජ වෙළෙඳපොල/මිල තත්ත්වයන් නිර්මාණය කිරීම පිලිබඳ විමර්ශන තුනක්ද (3) ලෙස නව විමර්ශන පහක් (5) ආරම්භ කරන ලදී.

වර්ෂය තුලදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දැනටමත් අවසන් විමර්ශන යක නීතිමය කටයුතු වලදී සහය වීම සඳහා අවශ්‍ය වූ ලිපි ලේඛන රජයේ රස පරීක්ෂක වරයා වෙත යොමු කරන ලදී.එසේම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මෙම වසර තුළදීද අනෙකුත් නියාමන ආයතන සමග සමීපව කටයුතු කරගෙන යන ලදී.

2019 වර්ෂය අවසන් වන විට විමර්ශනයන් සම්බන්ධව ගනු ලැබූ පියවරයන් සහ පැවතී තත්ත්වයන් පිලිබඳ සාරාංශයක් පහත වගුවේ දැක්වේ. (සංඛ්‍යා සටහන 10)

1 ලැයිස්තු ගත සමාගමකට සම්බන්ධයක් ඇත්තා වූ පුද්ගලයෙකු සතුව කොටස් වල ප්‍රකාශිත නොවූ මිල සංවේදී තොරතුරු පවතින විට එම සමාගමේ කොටස් වෙළෙඳාම් කිරීම.(ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 32 වගන්තිය)

2 ක්‍රියාකාරී අලෙවිය පිලිබඳ ව්‍යාජ හෝ නොමඟ යවන සුළු පෙනුමක් ඇති කරවීමට හෝ බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත යම් සුරැකුම්පත් සඳහා වූ වෙළෙඳපොල හෝ මිල සම්බන්ධයෙන් ව්‍යාජ හෝ නොමඟ යවන සුළු පෙනුමක් හෝ හැගීමක් ඇති කිරීමේ අරමුණින් යම් දෙයක් මවා පෑම හෝ මවා පෑමට සැලැස්වීම හෝ මවා පෑමක් ඇති කරවීම සඳහා වූ යම් කිසිවක් කිරීම හෝ කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය. (ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීතින්- 12 වන රීතිය) සහ /හෝ කිසියම් තැනැත්තෙකු විසින් යම් සුරැකුම්පත් වල අර් ථලාභී අයිතියේ වෙනස්වීමක් සිදු නොවන අන්දමින් ඒ සුරැකුම්පත් මිලදී ගැනීමෙන් හෝ විකිණීමෙන් හෝ යම් ව්‍යාජ ගනුදෙනු මගින් හෝ වෙනත් ආකාරයකින් යම් බලපත්‍රලත් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති යම් සුරැකුම්පත් පිලිබඳ අසත්‍ය වෙළෙඳපොළක් මවා පෑම නොකළ යුතුය. (ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීතින් - 13 වන රීතිය).

3 සමාගමක සුරැකුම්පත් ස්වකීය සේවාදායකයා වෙනුවෙන් සැලකියයුතු අන්දමට විකිණීමක් හෝ මිලදී ගැනීමක් කිරීමට පෙර , පසු කලෙක ඒ සුරැකුම්පත් වෙළෙඳාම් කිරීම මගින් ලාභ ඉපයීමේ චේතනාව ඇතිව කිසිදු තැනැත්තෙකු විසින් ඒ සමාගමේ සුරැකුම්පත් කෙලින්ම හෝ අනියම් මාර්ගයෙන් මිලදී ගැනීම නොකළ යුතුය. (ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා රීතින් - 14 වන රීතිය)

4 කොමිෂන් සභාව හෝ බලය දෙන ලද තැනැත්තා ඉදිරියෙහි පෙනීසිටීමට අපොහොසත් වන සෑම පුද්ගලයෙක්ම මේ පනත යටතේ වරදකට වරදකරු වියයුතු අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා හෝ රුපියල් දස ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දඩුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

# මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා සටහන 10: විමර්ශනයන් පිළිබඳ විස්තර

| විමර්ශනයේ ස්වභාවය | විමර්ශන සංඛ්‍යාව | ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය |
|---|---|---|
| ලැයිස්තුගත සමාගම් වල කොටස් වල සිදුවී ඇති අභ්‍යන්තරික වෙළදාම සම්බන්ධයෙන් සිදුවන විමර්ශනයන් | 5 | විමර්ශනයන් පහකින් (5) 2019 වර්ෂය තුලදී විමර්ශන අංශයට ලැබුණු විමර්ශන දෙකක් (2) ක් වසර අවසන් වන විටත් කෙරෙමින් පැවතිණි.එක් (1) විමර්ශනයක වාර්තාව කොමිෂන් සභාවට ඉදිරිපත් කල අතර කොමිෂන් සභාවේ නිර්දේශ අනුව තවදුරටත් විමර්ශන කටයුතු සිදු කෙරෙමින් පවතී. අනෙක් විමර්ශන දෙකෙහි (2) විමර්ශන කටයුතු තවදුරත් කෙරෙමින් පැවැතිණි. |
| ලැයිස්තුගත සමාගම් කොටස් වල ව්‍යාජ වෙළෙඳපොල/මිල තත්ත්වයන් නිර්මාණය කිරීම | 3 | එක් (1) විමර්ශනයක් වසර අවසානය වනවිට අවසන් අදියරෙහි පැවති අතර තවත් විමර්ශන දෙකක් (2)ක් වසර තුලදී කෙරෙමින් පැවතිණි. ඉන් එක් විමර්ශනයක් 2019 වර්ෂය තුලදී විමර්ශන අංශයට ලැබුණු විමර්ශනයකි. |
| ලැයිස්තුගත සමාගම් කොටස් වල ව්‍යාජ වෙළෙඳපොල/මිල තත්ත්වයන් නිර්මාණය කිරීම සහ /හෝ අභ්‍යන්තරික වෙළදාම සම්බන්ධයෙන් සිදුවන විමර්ශන යන් | 7 | එක් (1 ) විමර්ශන යක වාර් තාව සකස් කරමින් පැවතිණි.<br>අනෙක් විමර්ශන හයෙන් (6) න් එක් (1) විමර්ශන යක් වසර අවසන් වන විට අවසාන අදියරෙහි පැවති අතර අනෙක් විමර්ශන පහ (5) වසර අවසන් වනවිටත් සිදුකරමින් පැවතිණි. ඉන් විමර්ශන දෙකක් (2) වසර තුලදී විමර්ශන අංශයට ලැබුණු විමර්ශන වේ. |
| ලැයිස්තුගත සමාගම් කොටස් වල ව්‍යාජ වෙළෙඳපොල/මිල තත්ත්වයන් නිර්මාණය කිරීම සහ /හෝ අභ්‍යන්තරික වෙළදාම සම්බන්දයෙන් සහ එම සමාගමේ හිමිකම් නිකුතුවෙන් ලද මුදල් භාවිතය පිලිබඳ නොමග යවනසුළු සහ/හෝ හෙළි දරව් නොකිරීම් සම්බන්දයෙන් සිදුවන විමර්ශනයන් | 2 | විමර්ශන දෙකෙන් (2) එක් විමර්ශනයක වාර්තාව වසර අවසන් වනවිට නිමකර තිබුණු අතර ප්‍රධාන සැකකරු හට හේතු දැක්වීමේ නිවේදනය (Show cause notice) යවන ලදී.<br>අනෙක් විමර්ශනයද වසර තුලදී නිමකරන ලදී. |
| කොටස් තැරව්කාර සමාගම් විසින් සිදු කරන ලද අයථා කටයුතු පිලිබඳ විමර්ශනයන් | 1 | විමර්ශන වාර්තාව අවසන් කර තිබුණු අතර සාකච්ඡා කිරීමට නියමිතව තිබුණි. |
| කොටස් තැරව්කාර සමාගම් විසින් සිදු කරන ලද අයථා කටයුතු පිලිබඳ විමර්ශනයන් | 1 | විමර්ශන වාර් තාව සකස් කරමින් පැවතුණි. |
| කොටස් තැරව්කාර සමාගම් වලට එරෙහිව යොමුකර ඇති ආයෝජක පැමිණිලි. | 1 | විමර්ශන වාර් තාව අවසන් කර තිබුණු අතර සාකච්ඡා කිරීමට නියමිතව තිබුණි. |
| ලැයිස්තුගත සමාගමක් විසින් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය උල්ලංඝනය කිරීම පිලිබඳ විමර්ශනයන් | 3 | එක් (1) විමර්ශනයකට අදාලව පුද්ගලයින් දෙදෙනෙකුට එරෙහිව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 46 අ(4) වගන්තිය යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සදහා ගරු නීතිපති වරයා වෙත යොමුකර ඇති අතර එම විමර්ශනය වසර අවසන් වන විටත් සිදු කරමින් පැවතිණි.<br>තවත් එක් විමර්ශනය (1) කට අදාල විමර්ශන වාර්තාව නිම කර තිබුණු අතර සාකච්ඡා කිරීමට නියමිතව තිබුණි.<br>අනෙක් විමර්ශනය වසර අවසන් වනවිටත් සිදුකරමින් පැවතිණි. |
| ලැයිස්තුගත සමාගමක් විසින් එහි මූල්‍ය වාර්තාවල නොමග යවන සුළු අනාවරණයන් සිදුකිරීම පිළිබඳ විමර්ශනය | 1 | විමර්ශනය වසර අවසන් වන විටත් සිදු කරමින් පැවතිණි. |
| පසුගිය වසර වලදී අවසන් කරන ලද විමර්ශන වල තවදුරටත් සිදු කරන ලද විමර්ශන (2015 සහ 2016 වසර වලදී නැවත ආරම්භ කල) | 9 | විමර්ශන හතරකට (4) අදාළ විමර්ශන වාර්තා අවසන් කර ඇත. විමර්ශන තුනකට (3) අදාළ විමර්ශන වාර්ථා සකස් කරමින් පවතින අතර විමර්ශන දෙකක් (2) වසර අවසන් වන විටත් සිදු කරමින් පැවතිණි. |
| නියාමනයට යටත් ආයෝජන කළමනාකරණ ආයතනයකට එරෙහිව සිදුකල මූලික පරීක්ෂණය | 1 | විමර්ශන වාර්තාව අවසන් කර තිබුණු අතර සාකච්ඡා කිරීමට නියමිතව තිබුණි. |

### බලාත්මක කිරීමේ ක්‍රියා

කොමිසමේ නිර්දේශ සහ තීරණ මත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබයි.

### හේතු දැක්වීම් ලිපි" නිකුත් කිරීම

ශ්‍රී ලංකා මහා බැංකුව මගින් නිකුත් කර ඇති යම් නිර්දේශ කාලානුරූපී ලෙස වෙළෙඳපොල වෙත හෙළිකිරීම සම්බන්ධව ඔවුන්ට විරුද්ධව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ක්‍රියාමාර්ග නොගත යුත්තේ ඇයිද යන්න පිළිබඳව හේතු දැක්වීමක් කිරීමට ලයිස්තුගත පොදු මූල්‍ය සමාගම් දෙකකට සහ ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල වෙත නියම කර ඇත.

### අනතුරු ඇඟවීම් නිකුත් කිරීම

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ රීති ප්‍රකාරව ආයතනික පාලන රීති වලට අනුකූල නොවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඔවුන්ට එරෙහිව පියවර නොගත යුත්තේ මන්ද යන්න පිළිබඳව ලයිස්තුගත පොදු සමාග මක් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට "හේතු දැක්වීම් ලිපියක්" නිකුත් කරන ලද අතර හිඟ මුදල් කපාහැරීම හෝ හිඟ මුදල් අඩු කෙරෙන ආකාරයේ ගැලපීම් කිරීම ඇතුළුව කිසිදු සම්බන්ධ පාර්ශවීය ගණුදෙනු වලට ඇතුළත් වීම එම සමාගමට තහනම් කරමින් නියෝගයක් මගින් අවශ්‍යතාවයක් පනවන ලදී.

හේතු දැක්වීම් සඳහා යැවූ ඉහත ලිපියට ලැබුන පිළිතුරු සහ සමාගම වටා ඇති තත්වයන් සලකා බැලීමෙන් පසු කොමිසම විසින් එම සමාගමේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අනතුරු ඇඟවීමේ ලිපියක් යැවීමට තීරණය කරණ ලදී.

### නඩුකර පැවරීමේ දැන්වීම් නිකුත් කිරීම

පහත කරුණු වලට අදාලව කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ රීති උල්ලංඝණය කිරීම සම්බන්ධව ලයිස්තුගත පොදු සමාගමක් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට නඩුකර පැවරීමේ දැන්වීමක් නිකුත් කරන ලදී;

- ශ්‍රේණිගත කිරීම් පහත යාම් හෙළි නොකිරීම; සහ
- සම්බන්ධිත පාර්ශවීය ගණුදෙනුවක් පිළිබඳ නොමග යවන ආකාරයේ හෙළිකිරීමක් කිරීම

එම සමාගම විසින් ඉහත කරුණු සම්බන්ධව කොමිසම සමග සමථයකට පැමිණීමට ඉල්ලීම් කළ අතර, එම ඉල්ලීම් විචාරය කිරීමෙන් අනතුරුව කොමිසමේ වන්දි අරමුදලට රුපියල් මිලියන 36.3ක සමස්ථ ගෙවීමකට යටත්ව එම කරුණු සම්බන්ධයෙන් සමථයකට පැමිණීමට කොමිසම තීරණය කරන ලදී.

මෙම වාර්තාව එල කරන දිනය වන විටත් ඉහත කී මුදල ගෙවා නොමැත.

### අගතියට පත් පැමිණිලි කරුවන්ගේ මූල්‍ය පාඩු නිවැරදි කිරීම

කොළඹ කොටස් වෙළෙඳපොළේ තීරණ මගින් අගතියට පත්, කොටස් තැරැව්කාර සමාගමක සහ එහි සම්බන්ධිත ආන්තික සැපයුම් සමාග මක සේවාදායකයන් දෙදෙනෙකු විසින් ගොනු කළ පැමිණිලි දෙකක් අසා තීරණය කිරීමට, 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 46 (1) වගන්තිය යටතේ කොමිසමේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් කොමිසම විසින් පත් කරන ලදී.

කොටස් තැරැව්කාර සමාගම සහ එහි සම්බන්ධිත ආන්තික සැපයුම් සමාගමෙහි පිළිතුරු අසා සලකා බැලූ කමිටුව, පහත කරුණු අනාවරණය කරගන්නා ලදී;

- ප්‍රශ්නගත කාලය තුළ අදාල සේවාදායකයන්ගේ ආන්තික ගණුදෙනු ගිණුම් වලට අදාලව ඔවුන් වෙනුවෙන් සිදුකළ කොටස් මිළදී ගැනීම් සිදුකරනු ලැබුවේ එම සේවදායකන්ගේ එකඟතාවය සහ අවසරය මත බව ලේඛනගත හෝ වෙනත් සාක්ෂි මගින් සනාථ කිරීමට කොටස් තැරැව්කාර සමාගම අසමත් වූ හෙයින් එකල බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්ට අදාල වුනු සාමාජික නියාමනයන්හි 5 (II) වගන්තිය උල්ලංඝණයක් කොටස් තැරැව්කාර සමාගම විසින් සිදුකර ඇති බව;
- පැමිණිලිකරුවන්ට සිදුවන පාඩුව අවම කිරීම සඳහා පවතින සුරැකුම්පත් නිසි කලට බැහැර කිරීමට කොටස් තැරැව්කාර සමාගම අසමත් වූ බව;
- කොටස් තැරැව්කාර සමාගම සහ එහි ආන්තික සැපයුම් සමාගම, සුරැකුම්පත් විකිණීමට යැයි සේවාදායකයින් ලබාදුන් පැහැදිලි උපදෙස් වලට පටහැනිව ක්‍රියාකරමින් සුරැකුම්පත් තවදුරටත් මිලදීග ැනීමට යොමුවීම නිසා සේවාදායකයින්ගේ ණය නිරාවරණය පුළුල් වී ඇති බව; සහ
- තමන් සේවාදායකයින්ගේ උපරිම සුභසිද්ධිය ඇතිවන ලෙස ක්‍රියා කළ බව නිරූපණය කිරීමට කොටස් තැරැව්කාර සමාගම අසමත් වූ බව.

කමිටුවේ සොයාගැනීම් මගින් අනෙකුත් කරුණු අතර, අක්‍රමිකතා හෝ කොටස් තැරැව්කාර සමාගමෙහි කටයුතු කළමනාකරණය සම්බන්ධව අවිධිමත් බවක් පෙන්නුම් කරන බව කොමිසම තීරණය කළ අතර කොටස් තැරැව්කරුට ලබා දී ඇති බලපත්‍රය අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට හිලව් වන සේ කොටස් තැරැව්කරු විසින් රුපියල් 3,990,683.81ක මුළු මුදලක් ගෙවීම මගින් පැමිණිලිකරුවන්ට මූල්‍යමය පාඩුවක් සිදුවීමට හේතු වූ කරුණු හරිගැස්වීම හෝ නිවැරදි කිරීම සිදුකළ යුතු බවද කොමිසම තීරණය කළේය.

වැරදිකාර කොටස් තැරැව්කරුට දඩයක් නියම කිරීමට කොළඹ කොටස් වෙළෙඳපොළට ද නියෝග කරන ලදී.

ආන්තික සැපයුම්කාර සමාගම වෙත "හේතු දැක්වීමේ " ලිපියක් යැවීමෙන් අනතුරුව, එයට එරෙහිව කමිටුවේ සොයාගැනීම් පිළිගැනීමට කොමිසම තීරණය කළ අතර එයට ලබා දී ඇති බලපත්‍රය අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමකට හිලව් වන සේ පැමිණිලිකරුවන්ට විසින් රුපියල් 2,141,008.69ක මුළු මුදලක් ගෙවීමට ආන්තික සැපයුම්කාර සමාගමට නියම කර ඇත.

### නීති කෘත්‍ය

#### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව එම්. අයි. සම්සුදීන් සහ එම්. බී. නිසාර් - MC S/5322/17

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළඳපොල/මිළ හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ වෙළඳපොල/මිළ හැසිරවීමට ක්‍රියා කිරීම සම්බන්ධව එම්. ඉම්තියාස් සම්සුදීන් සහ බාහික් නිසාර් යන අයට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී.

මෙම නඩුව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතී.

#### තාලිබ් තවුෆික් අල් නකීබ් එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළඳපොල Case No. WP/HCCA/LA/158/2017

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළඳපොලට එරෙහිව තාලිබ් තවුෆික් අල් නකීබ් විසින් පවරන ලද DSP/20/2016 අංක දරණ නඩුවට

# මෙහෙයුම් සමාලෝචනය

අදාලව ගරු කොළඹ දිසා විනිසුරුතුමා විසින් ලබාදුන් තීන්දුවට එරෙහිව පෙත්සම්කරු විසින් මහාධිකරණයේ අභියාචනයක් ගොනුකරන ලදී.

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත සමාගමක් වන "හන්ටර් ඇන්ඩ් කොම්පැනි පීඑල්සී" හි ලයිස්තුගත නොවූ උප සමාගමක් වන "හීත් ඇන්ඩ් කොම්පැනි (ලංකා) ලිමිටඩ්" හි කටයුතු සම්බන්ධව විමර්ශනය කිරීමට කොළඹ කොටස් වෙළඳපොල සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව බැඳී සිටින බවට ප්‍රකාශනයක් ලබා දෙන ලෙස ඉල්ලමින් DSP/20/2016 අංක දරණ නඩුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළඳපොලට එරෙහිව තාලිබ් තවුෆික් අල් නකීබ් යන අය විසින් කොළඹ දිසා අධිකරණයේ පවරා ඇත. ගරු දිසා විනිසුරු විසින් පැමිණිලිකරු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළඳපොලට එරෙහිව ගොනු කර ඇති නඩුව නිෂ්ප්‍රභා කරමින් නියෝගයක් ලබාදෙන ලදී.

නඩුව නිෂ්ප්‍රභා කරමින් දිසා අධිකරණය ලබාදුන් තීන්දුවට එරෙහිව පැමිණිලිකරු විසින් මහාධිකරණයට අභියාචනා කර ඇති අතර එය මේ වන විට කොළඹ මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

### මැග්පෙක් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව - HCMCA 217/2007 - විභාග වෙමින් පවතී

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති උල්ලංඝනය කරමින් යම් වැදගත් කරුණු වහාම හෙළි නොකිරීම සම්බන්ධව වරදකරුවන් කෙරුන මෙම නඩුවේ චූදිතයන්ගෙන් හතර දෙනෙක් ගරු මහේස්ත්‍රාත් වරයා විසින් ලබාදුන් තීන්දුව සහ සිරදඬුවමට එරෙහිව පළාත්බද මහාධිකරණයට අභියාචනා කර ඇත. හයවන චූදිත අභියාචනාකරු වරදකරු කිරීම සහ දඬුවමට ට එරෙහිව අභියාචනය කොළඹ මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව සේන යද්දෙහිගේ සහ එස් තින්නමානි MC/Fort/12639/2019

සමාගමක අභ්‍යන්තරික තැනැත්තන් විසින් එහි ලැයිස්තුගත සුරැකුම්පත් සම්බන්ධයෙන් පළ නොකල මිල පිළිබඳ සංවේදී තොරතුරු තමා සතුව තිබියදී එම සුරැකුම්පත්වල වෙළෙඳාම් නොකළ යුතු බව දක්වන 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 32 වගන්තිය උල්ලංඝනනය කිරීමට එරෙහිව ආචාර්ය සේන යද්දෙහිගේ යන අයටත්, අදාල වරදට ඔහුට ආධාර අනුබලදීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය යටතේ සුබ්‍රමනියම් තින්නමානි යන අයටත් එරෙහිව කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ වර්ෂ 2019 මාර්තු මස 7 වන දින නඩු පවරන ලදී.

ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මෙම නඩුවේ කරුණු සලකා බලා විත්තිකරුවන් වෙත සිතාසි නිකුත් කළ අතර මෙයට අදාලව විත්තිකරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ SC/SPL/LA/100/19 දරණ විශේෂ අභියාචනා අවසර ඉල්ලීමට අදාළව ලබාදීමට නියමිත නියෝගය හේතුකොට ගෙන මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කළ මෙම නඩුව තාවකාලිකව නවත්වා ඇත.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ලංකා කන්නංගර, කපිල සෙනරත්, ෆාරික් ෆුර්කාන් හා රවින්ද්‍ර මල්ලවආරච්චි MC/Fort/13736/2019

ක්‍රියාකාරී කොටස් වෙළෙඳපොළක ව්‍යාජ හා නොමඟ යවන සුළු පෙනුමක් ඇති කිරීම, 1987 අංක 36 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ 2001 දෙසැම්බර් 18 වන දින නිකුත් කරන ලද නො: 1215/2 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරන ලද සුරැකුම්පත් සහ කොමිෂන් සභා රීතීන්හි 12 වන රීතියෙන් තහනම් කර ඇති අතර එය ඉහත කී පනතේ 51 (1) (ආ) වගන්තිය යටතේ වරදක් වේ. ක්‍රියාකාරී කොටස් වෙළෙඳපොළක ව්‍යාජ හා නොමඟ යවන සුළු පෙනුමක් ඇති කිරීම ඒ සඳහා කුමන්ත්‍රණය කිරීම සහ ආධාර අනුබලදීම යන වැරදි සම්බන්ධයෙන් පිළිවෙලින් ඉහත කී 12 වන රීතිය, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 113 (ආ) සහ 102 වගන්ති යටතේ කොමිෂන් සභාව විසින් ඉහත කී විත්තිකරුවන්ට එදිරිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2019 ජුලි මස 25 වන දින නඩු කටයුතු ගොනු කරන ලදී.මෙම නඩුව එම අධිකරණය ඉදිරියේ දැනට විභාග වෙමින් පවතී.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ඩබ්ලිව් කේ එච් වැගපිටිය, තිලක් ද සිල්වා සහ තක්ෂිල හුලංගමුව MC/Fort/14778/2019

ඉහත කී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතීන්හි 12 වන රීතිය, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය 113 (ආ) සහ 102 යන වගන්ති යටතේ පිළිවෙලින් දක්වෙන ක්‍රියාකාරී කොටස් වෙළෙඳපොළක ව්‍යාජ හා නොමඟ යවන සුළු පෙනුමක් ඇති කිරීම, ඒ සඳහා කුමන්ත්‍රණය කිරීම හා ආධාර අනුබල දීම යන වැරදි සම්බන්ධයෙන් ඉහත කී පුද්ගලයන්ට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ කොමිෂන් සභාව විසින් 2019 නොවැම්බර් 05 වන දින නඩු පවරන ලදී. එහිදී අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 136 (1) (ආ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නඩු පැවරිය නොහැකි බවට විත්තිකාර පාර්ශවයෙන් එල්ල වූ මූලික විරෝධතා පිළිගනිමින් ගරු මහෙස්ත්‍රාත්තුමා ඉහත කී පුද්ගලයන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 186 වගන්තිය යටතේ 2020 පෙබරවාරි මස 13 වන දින නඩුවෙන් නිදහස් කරන ලදි.

### ඩබ්ලිව් කේ එච් වැගපිටිය එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව CA/Writ/519/2019 - තිලක් ද සිල්වා එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව CA/Writ/520/2019

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඉහත පෙත්සම්කරුවන් විත්තිකරුවන් ලෙස නම් කරමින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකළ MC/Fort/14778/2019 දරණ නඩුවට අදාළව අභියාචනාධිකරණ රිට් පෙත්සමක් උක්ත පෙත්සම්කරුවන් විසින් කොමිෂන් සභාව, එහි සාමාජිකයින් සහ එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා යන අයට එරෙහිව ගොනුකර ඇත. එනමුදු 2020 පෙබරවාරි 13 වන දින MC/Fort/14778/2019 යන නඩුවට අදාලව ගරු මහේස්ත්‍රාත්තුමා විසින් ලබා දුන් නියෝගය හේතුකොටගෙන එම පෙත්සම්කරුවන් විසින් ඉහත කී රිට් පෙත්සම ඉල්ලා අස් අස්කර ගන්නා ලදී.

### ආචාර්ය සේන යද්දෙහිගේ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව CA/Writ/417/2017

ආචාර්ය සේන යද්දෙහිගේ යන අය විසින් ඔහුට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම නවත්වාලීමට ඉල්ලා සිටිමින් 2017 වර්ෂයේදී මෙම රිට් පෙත්සම ගොනු කර ඇත. මේ අතර කොමිෂන් සභාව විසින් 2019 මාර්තු මස 07 වන දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ආචාර්ය සේන යද්දෙහිගේ යන අයට එරෙහි MC/Fort/12639/2019 යන නඩුව ගොනු කළ අතර ඉන්පසුව සේන යද්දෙහිගේ යන අය විසින් ඉහත කී රිට් පෙත්සම විභාග යට ගන්නා ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී. 2019 මාර්තු මස 22 වන දින අභියාචනාධිකරණය ඔහුගේ ඉල්ලීම වන මහේස්ත්‍රාත් අධිකරණය ආරම්භ වූ ඉහත කී නඩු කටයුත්ත නවත්වාලීම යන්න ප්‍රතික්ෂේප කරමින් නියෝගයක් කළ අතර වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කිරීම සම්බන්ධව තීන්දුවක් ලබාදීමට අදාළ ලිඛිත දේශන ගොනුකරන ලෙස අධිකරණය විසින් දෙපාර්ශවයටම දන්වා සිටින ලදී.

### සේන යද්දෙහිගේ එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව SC/SPL/LA/100/2019

ඉහත කී CA/Writ/417/2017 යන රිට් පෙත්සම ට අදාළව 2020 මාර්තු මස 22 වන දින අභියාචනාධිකරණය විසින් ලබාදුන් නියෝග යෙන් අගතියට පත්වූ ආචාර්ය සේන යද්දෙහිගේ යන අය එම නියෝගයට එරෙහිව විශේෂ අභියාචනා අවසර ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලදී. එයට එරෙහිව මූලික විරෝධතා ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කරුණු දක්වමින් සේන යද්දෙහිගේ යන අය විසින් දිවුරුම් හා ප්‍රතිඥා ආඥා පනතේ 12 වන වගන්තිය යටතේ වලංගු දිවුරුම් ප්‍රකාශයක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනු කර නොමැති බවත්, ගොනු කර ඇති දිවුරුම් ප්‍රකාශය 1981 කොන්සල් කර්තව්‍ය පිළිබඳ පනතට අනුකූල නොවන බවත්, ඒ අනුව අවසරදීමට තරම් උචිත විශේෂ අභියාචනා ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ගොනු වී නොමැති බවත්, අධිකරණයට දන්වා සිටින ලදී .

කොමිෂන් සභාවේ මූලික විරෝධතා වලට අදාළ නියෝගය ලබාදීම සඳහා මෙම නඩුව නියමිතව ඇති අතර එතෙක් මෙම නඩුව හා සම්බන්ධ ඉහතකී අභියාචනාකරණ රිට් පෙත්සම සහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු තාවකාලිකව නවත්වා ඇත.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව ඩබ්ලිව් ජේ ඒ එම් සොයිසා MC/Fort/7701/2017

විදානලාගේ ජුවනෙල් අරුණ මෙලන් සොයිසා යන අයගේ මධ්‍යම තැන්පතු ක්‍රම ගිණුමක සිදුව ඇති ගනුදෙනු සම්බන්ධව ප්‍රකාශයක් සටහන් කරගැනීම සඳහා කොමිෂන් සභාව විසින් ඔහුව කැඳවනු ලැබූ අතර ඔහු එකී කැඳවීම් මග හැර සිටීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ඔහුට එරෙහිව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 46 (අ) වගන්තිය යටතේ 2019 ජනවාරි 25 වන දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. මෙම නඩුවේ දී ගරු මහේස්ත්‍රාත්තුමා විසින් ඉහත කී සොයිසා යන අයට එරෙහිව වරෙන්තුවක් නිකුත් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට සිය ප්‍රකාශය ලබා දෙන ලදී. ඉන් අනතුරුව කොමිෂන් සභාව විසින් මෙම නඩුව ඉල්ලා අස්කර ගන්නා ලදී.

### පැමිණිලි විසඳීමේ ක්‍රමය

ලැයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් ලද පැමිණිලි සහ එයට ලබාදුන් විසඳුම් පහත් දක්වා ඇත. (සංඛ්‍යා සටහන 11)

සංඛ්‍යා සටහන:11 ලැයිස්තුගත සමාගම් වල අදාල පැමිණිලි සහ කාරණා පිළිබඳ කටයුතු:

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි ගණන | ගනු ලැබූ පියවර/ වත්මන් තත්වය |
|---|---|---|
| ලැයිස්තුගත පොදු සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධයෙන් | 08 | කාර්ණාවක් යෝග්‍යය පරිදි විසඳන ලදී |
| ලැයිස්තුගත සමාගම් වල සම්බන්ධ | 14 | කාර්ණා 14 යෝග්‍යය පරිදි විසඳන ලදී |
| අදාල මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල නොවීම | 02 | කාර්ණා 2ක් යෝග්‍යය පරිදි විසඳන ලදී |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් වෙළඳ වෙළඳ පොලෙහි නීතිය රීතීන්ට අනුකූල නොවීම | 03 | කාර්ණා 3ක් යෝග්‍යය පරිදි විසඳන ලදී |
| එකතුව | 27 | |

### වන්දි කමිටුවක් පත් කිරීම

බලපත්‍රලාභී කොටස් තැරැව් කරුවෙකු හෝ කොටස් ගනුදෙනුකරුවෙකු තම ගිවිසුම්ගත බැඳීම් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීමෙහි ප්‍රතිඵලයක් ලෙස යම් මූල්‍ය පාඩුවක් ලබන ඕනෑම ආයෝජකයෙකුට වන්දි ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා වන්දි අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යාම 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ (සංශෝධිත) 38 වගන්තිය (1) උප වගන්තිය ප්‍රරකාරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත වගකීමකි.

වන්දි සඳහා, 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත (සංශෝධිත) 40 වගන්තිය යටතේ කරන ඕනෑම ඉල්ලීමක් සලකා බලා වන්දි ප්‍රදානය කිරීමේ වගකීම දරන කොමිසමේ වන්දි කමිටුව පිහිටුවීමට පනතේ 39 වගන්තිය (1) උප වගන්තිය යටතේ කොමිසමේ සාමාජිකයන් අතරින් 3ක් පත්කිරීමට වගකීම ඇමතිවරයාට පැවරී ඇත.

ඒ අනුව දෙදහස් 2019 වසරේ මුදල් විෂය භාර ගරු ඇමැතිවරයා විසින් කොමිසමේ ඉල්ලීම මත වන්දිය කමිටුව සංස්ථාපනය කිරීමට කොමිසමේ සාමාජිකයන් අතරින් තුන් දෙනෙක් පත් කරන ලදී.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

ලැයිස්තුගත සමාගම්වලට දිගුකාලීන ප්‍රාග්ධනය රැස් කිරීමට මාර්ගයක් සහ ආයෝජකයින්ට ඔවුන්ගේ අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමට මාර්ගයක් ලබා දෙන බැවින් ප්‍රාග්ධන වෙළෙඳපොළවල් ආර්ථික සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ. හොඳින් ක්‍රියාත්මක වන
ප්‍රාග්ධන වෙළෙඳපොළක ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ආයෝජකයින් ආරක්ෂා කිරීම. පුළුල් හා ද්‍රවශීල වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම සහ පද්ධතිමය අවදානම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් නියාමනයක් අවශ්‍ය වේ මේ නිසා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ වෙළෙඳපොළ සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කිරීමෙහි නිරත විය.

# මෙහෙයුම් සමාලෝචනය

### කොළඹ කොටස් වෙළෙඳපොළේ ගෙවුම් කළ පසු බේරුම් කිරීමේ (Delivery vs Payment system- DVP) යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් හුවමාරුව සමඟ සාකච්ඡා කර ගෙවුම් කළ පසු බේරුම් කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කළේය. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු එය ක්‍රියාත්මක කරන ලෙස කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවට උපදෙස් දෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සියලු පද්ධති වැඩිදියුණු කිරීම් ඇතුළුව යෝජිත ගෙවුම් කළ පසු බේරුම් කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම 2020 අවසානය වන විට සම්පූර්ණ කෙරෙනු ඇත. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එය ස්ථාපිත කිරීම කඩිනම් කිරීම පිළිබඳව අවධානයෙන් පසුවේ.

### සමාගම් විසින් සිදුකරනු ලබන මූලික මහජන නිකුතුන් (IPO) සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රාමුවේ යෝජිත සංශෝධනවලට අදාළ ප්‍රතිපත්ති අනුමත කිරීම.

සමාගම් විසින් සිදුකරනු ලබන මූලික මහජන නිකුතුන් (IPO) සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රාමුවේ යෝජිත සංශෝධනවලට අදාළ ප්‍රතිපත්ති, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව මේ වන විට ඊට අදාළ නීති සම්පාදනය කරමින් සිටී.

### හරිත බැඳුම්කර සහ පරිසර, සමාජ හා පාලන (ESG) වාර්තාකරණ රාමුවට අදාළ පර්යේෂණ පැවැත්වීම

මේ පිළිබඳව පුළුල් පර්යේෂණ සිදු කරන ලදී:

- දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළට වෙත හරිත බැඳුම්කර නිකුත් කිරීම සහ එහි සම්බන්ධතාව .
- පරිසර, සමාජ හා පාලන (ESG) වාර්තාකරණ රාමුව සහ දේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත එහි අදාළත්වය

### ආධාර දෙන ආයතන සමඟ එක්ව සිදුකළ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීම

ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන

ලෝක බැංකුවේ (WB) මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ (FSMP) සහ ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහනේ (CMDP) කොටසක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අධීක්ෂණ හා නියාමන ධාරිතාව ශක්තිමත් කරනු ලබන ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන් රාශියක් සඳහා අරමුදල් ලබා ගන්නා ලදී. එම ව්‍යාපෘතිවලට අදාළ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් සහ උපදේශන හා භාණ්ඩ ප්‍රසම්පාදනයන් මේ වන විට සිදු වෙමින් පවතී.

### ඉන්වෙස්ට් ශ්‍රී ලංකා - සිංගප්පූරු ආයෝජක සම්මන්ත්‍රණය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව 2019 මැයි 21 වන දින සිංගප්පූරුවේ සෘජු ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සම්මන්ත්‍රණයක් සංවිධානය කරනු ලැබිණ. ප්‍රධාන සම්මන්ත්‍රණයෙන් අනතුරුව, සහභාගීකරුවන්ට ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත සමාගම් සමඟ වෙන් වෙන්ව හමුවී සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුණි.

මෙම සම්මන්ත්‍රණය සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හා එක්ව සංවිධානය කරන ලද අතර ඒ සඳහා සම්මන්ත්‍රණයේ ප්‍රධාන ප්‍රවර්ධන හවුල්කරුවා ලෙස සිංගප්පූරු ව්‍යාපාරික සම්මේලනය සහයෝගය දැක්වීය.

### වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

- නියාමන හිඩැස් පියවා ගැනීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත රීතීන් සමස්තයක් ලෙස සංශෝධනය කිරීම සහ නව පියවර හඳුන්වා දීමෙන්
  - අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සාමාජිකයින් ලැයිස්තුගත සමාගමේ අධ්‍යක්ෂකවරුන් නොවීමු.
  - ප්‍රධාන කොටස් හිමියන් විසින් කරනු ලබන ස්වාධීන අධ්‍යක්ෂකවරුන් පත් කිරීම.
- ලැයිස්තුගත සමාගම් වල අධ්‍යක්ෂකවරුන් පත්කිරීමේදී සුදුසුකම් සහ යෝග්‍යතා නිර්ණායක සකස් කිරීම.
- ලැයිස්තුගත සමාගම් වලට අදාල සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය, ලැයිස්තුගත කිරීම් සහ ලැයිස්තුගත ලේඛනයෙන් ඉවත් කිරීම් වැනි නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් ලැයිස්තුගත ආයතන වල කොටස් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.
- සාංගමික පරිපාලන සඳහා වූ ආර්ථික සහයෝගීතා සහ සංවර්ධන ආයතනයේ* මූලධර්ම, ජාත්‍යන්තර සුරැකුම්පත් කොමිෂන් සභාවේ මූලධර්ම සහ ජාත්‍යන්තර විශේෂ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සාංග මික පරිපාලන සංග්‍රහයක් ක්‍රියාත්මක කිරීම.
- නව ලැයිස්තුගත කිරීමේ වේදිකා හඳුන්වාදීම සඳහා මෙහෙයුම් රාමුවක්, අවදානම් හඳුනාගැනීම, නීති උපදේශන සහ මිනුම් සලකුණු පිළිබඳ පුළුල් සමාලෝචනයක් පැවැත්වීමෙන්.
  - විවිධ විදේශ මුදල් වල ණය දේශීය ආයතන වලට ලැයිස්තුගත කිරීමේ හැකියාව ලබා දීම.
  - කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ණය ලැයිස්තුගත කිරීමේ හැකියාව ලබා දීම.
- අඛණ්ඩත්වය වැඩි දියුණු කිරීම සඳහා ලැයිස්තුගත සමාගම් වල විගණනකවරුන් අදාළ වන පුළුල් මාර්ගෝපදේශන නිර්මාණය කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා රාමුවක් නිර්මාණය කිරීමේ හැකියාව සහ පවත්නා අවශ්‍යතා ශක්තිමත් කිරීම.
- ලැයිස්තුගත නොකළ ආයතන විසින් මහජන දීමනා සඳහා නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 75 (1) වගන්තිය යටතේ අවශ්‍ය අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය සංවර්ධනය කිරීම.
- අවදානම් මත පදනම් වූ මූල්‍ය අපේක්ෂා කිරීමේ ප්‍රවේශයක් සහ අභ්‍යන්තර ධාරිතා වර්ධනය සඳහා මූල්‍ය සමීක්ෂණ රාමුවක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා ප්‍රමිතිගත මූල්‍ය වාර්තාකරණ ක්‍රමයක් හඳුන්වා දීමේ හැකියාව ඇගයීමට ලක් කිරීම.
- ලැයිස්තුගත සමාගම් වල සුළුතර කොටස් හිමියන් නියෝජනය කිරීම සඳහා ආයෝජක සංගමයට පහසුකම් සැලසීමේ හැකියාව ඇගයීම.

### ලෝක බැංකුවේ ඩුයින් බිස්නස් දර්ශකය (Doing Business Index)

ලෝක බැංකුවේ ඩුයින් බිස්නස් මුල් පිරීමේදී හුවා දැක්වූ සමාගම් හා පනත හා කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත රීතීන් අනුසාරයෙන් ශ‍ ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන ආකෘතිය, ඇගයුම්කරුවන්ගේ පිළිගැනීමට ලක්ව ඇත. ජගත් ශ්‍රේණිගත කිරීම් වලට අනුව ශ්‍රී ලංකාව 99 වන ස්ථානයට පත්ව ඇති අතර, ප්‍රොටෙක්ටින් මයිනොරිටි දර්ශකය (Protecting Minority Index) අනුව රටවල් 199 ක් අතුරින් 28 වන ස්ථානය ගෙන ඇත'

## ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන සහ පුහුණුව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමයෙහි කොටසක් ලෙස සුරැකුම්පත් ක්ෂේත්‍රයේ නියුතු ආයෝජන උපදේශකයින්ට තම සාමාන්‍ය වැඩ කටයුතු කරගෙන යාම සඳහා අනිවාර්ය වන ලියාපදිංචි ආයෝජන උපදේශක සහතික ලබාදීම අඛණ්ඩව සිදුකරනු ලබයි. මෙම වැඩසටහන තුළින් කර්මාන්තයෙහි නියුතු වෘත්තිකයන්ට ඔවුන්ගේ කාර්යයන් වඩා දක්ෂ ලෙස ඉටුකිරීමට මෙන්ම කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීමට හැකියාව ලැබේ. ආයෝජන උපදේශකයින් ඔවුන්ගේ තාක්ෂණික දැනුම හා නිපුණතා නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම සහ නව්‍යතාවයකින් යුතුව ඉටුකිරීම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනට අනුකූලව ක්‍රියාකරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

ඒ අතරම, දැනුවත් ආයෝජකයින් බිහිකිරීම සඳහා මනාව සකස්කරන ලද ආයෝජක අධ්‍යාපනික වැඩසටහන්ද මහජනතාව වෙනුවෙන් පවත්වනු ලබයි.

## සංශෝධිත සුදුසුකම් රාමුව

පසුගිය වසර දහය තුළ සුරැකුම්පත් ක්ෂේත්‍රයේ වර්ධනයන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2008 දී හඳුන්වා දුන් සුදුසුකම් රාමුව සංශෝධනය කිරීම ආරම්භ කර 2018 දී එම කාර්යය සම්පූර්ණ කරන ලදී. කර්මාන්තයෙහි නියුතු පාර්ශ්වකරුවන් සහ අතීත සිසුන් සමඟ පුළුල්ව පවත්වන ලද සාකච්ඡාවලින් අනතුරුව සුදුසුකම් රාමුව සඳහා පුළුල් සංශෝධනයක් සිදු කරන ලද අතර එහි ක්‍රියාත්මක කිරීම් 2019 වර්ෂයේදී ආරම්භ විය.

සංශෝධිත සුදුසුකම් රාමුව මගින් හිමිකම් සුරැකුම්පත්, ණය සුරැකුම්පත්, ව්‍යුත්පන්න සුරැකුම්පත් සහ ඒකක භාර යන වත්කම් පංති සඳහා වෙනම සහතික ලබා දේ. සංශෝධිත රාමුව යටතේ, ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) සුදුසුකම සුරැකුම්පත් කර්මාන්තයේ ඉහළම සුදුසුකම දක්වා ඉහළ නංවා ඇති අතර ආයෝජන උපදේශකයින් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) අවශ්‍යතාද දැඩි කරන ලදී. (රූප සටහන 03)

රූප සටහන: 03 සුදුසුකම් රාමුව



# මෙහෙයුම් සමාලෝචනය

## ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (CCM) සහ ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA) තත්ත්වය

ප්‍රාග්ධන වෙළෙඳපොළ වෘත්තිකයින්ට අමතරව කර්මාන්තයේ නොවන පුද්ගලයන්, පාසල් හැරගිය අය, උපාධි අපේක්ෂකයින් සහ කර්මාන්තයට පරිබාහිර වෙනත් අංශවල වෘත්තිකයන් CCM පාඨමාලාව සඳහා ලියාපදිංචිවීමට අඛණ්ඩ උනන්දුවක් අප නිරීක්ෂණය කළෙමු. නව සුදුසුකම් රාමුව හඳුන්වා දීමෙන් පසු වර්ෂය තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව සඳහා සිසුන් 48 දෙනෙකු ලියාපදිංචි විය. (සංඛ්‍යා සටහන 12,13,14)

සංඛ්‍යා සටහන: 12 CCM සහ RIA කාර්යසාධනය පිළිබඳ සංඛ්‍යාදත්ත සාරාංශය - 2019 (පැරණි සුදුසුකම් රාමුව)

| සිසුන් සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|
| **මුළු ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව** | **හිමිකම් සුරැකුම්පත් අධ්‍යියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **ණය සුරැකුම්පත් අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **මූල්‍ය නියාමනය සහ ආචාරධර්ම අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **CCM සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **RIA සම්පූර්ණ කළ සංඛ්‍යාව** |
| 2019 වසර තුළ නව කණ්ඩායම් ආරම්භ කර නැත. (නව සුදුසුකම් රාමුව හඳුන්වාදීමේ අන්තර් කාලසීමාව) | 14 | 13 | 31 | 29 | 08 |

සංඛ්‍යා සටහන: 13 CCM කාර්යසාධනය පිළිබඳ සංඛ්‍යාදත්ත සාරාංශය - 2019 (නව සුදුසුකම් රාමුව)

| සිසුන් සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මුළු ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව** | **සුරැකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **හිමිකම් සුරැකුම්පත් අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **ණය සුරැකුම්පත් අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **ඒකක භාර අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **මූල්‍ය සැළසුම්, උපදේශණය සහ අලෙවිකරණය අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** | **සුරැකුම්පත් නියාමනය සහ ආචාරධර්ම අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව** |
| 48 | 15 | 10 | 12 | 09 | 2019 වර්ෂය තුළ විභාග පවත්වා නොමැත. | 2019 වර්ෂය තුළ විභාග පවත්වා නොමැත. |

සංඛ්‍යා සටහන: 14 2019 වර්ෂය තුළ පවත්වන ලද CCM සහ RIA විභාගවල සාරාංශය

| පාඨමාලාව | අදියර | වර්ෂය තුළ පවත්වන ලද විභාග සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (සුදුසුකම් රාමුව 1) | හිමිකම් සුරැකුම්පත් | 6 | 80 |
| | ණය සුරැකුම්පත් | 6 | 96 |
| | සුරැකුම්පත් නියාමනය, ආචාරධර්ම හා අලෙවිකරණය | 7 | 88 |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (සුදුසුකම් රාමුව 2 | සුරැකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ | 1 | 94 |
| | හිමිකම් සුරැකුම්පත් | 1 | 63 |
| | ණය සුරැකුම්පත් | 1 | 86 |
| | ඒකක භාර | 1 | 100 |
| ලියාපදිංචි ආයෝජන උපදේශක | අදාළ නැත | 3 | 89 |

### ප්‍රාග්ධන වෙළෙඳපොළ ඩිප්ලෝමා පාඨමාලාව (DCM)

මෙම වසරේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, එක්සත් රාජධානියේ සුරැකුම්පත් හා ආයෝජන පිළිබඳ වරලත් ආයතනය (CISI) සමඟ ඒකාබද්ධව ඩිප්ලෝමා පාඨමාලා අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. වර්ෂය තුළ නව කණ්ඩායමක් ආරම්භ කරන ලද අතර (කණ්ඩායම 13) 12 වන කණ්ඩායම සඳහා වූ දේශන පවත්වා අවසන් කරන ලදී.

### අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, දේශීය හා ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළවල නවතම ප්‍රවණතා පිළිබඳව අවබෝධයක් හා තක්සේරුවක් ලබාගැනීමට හැකිවන පරිදි කොටස් තැරැව්කාර සමාගම්වල දැනට සිටින ආයෝජන උපදේශකයින් සඳහා CPD වැඩසටහන් හයක් පවත්වන ලදී. පවත්වන ලද වැඩසටහන් හය අතුරින් තුනක් සඳහා සහභාගී වී තිබීම ආයෝජන උපදේශකයින්ට පැරණි සුදුසුකම් රාමුවෙන් සංශෝධිත රාමුවට මාරු කිරීම අනිවාර්ය විය. මෙම වැඩසටහන් සඳහා 900 කට අධික පිරිසක් සහභාගී වූ අතර එයට කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකයින් සහ විශ්ලේෂකයින් ඇතුළත් විය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දැනට සිටින ආයෝජන උපදේශකයින්ට ඊළඟ වසර සඳහා ඔවුන්ගේ සෘෂ් තත්ත්වය යාවත්කාලීන කිරීම සඳහා අවම වශයෙන් වසරකට CPD ලකුණු 4 ක් (4 Credits) ලබාගෙන තිබීම අනිවාර්ය කර ඇත. (සංඛ්‍යා සටහන 15)

සංඛ්‍යා සටහන: 15 2019 වර්ෂය තුළ පවත්වන ලද CPD වැඩසටහන් වල සාරාංශය

| පවත්වන ලද CPD වැඩසටහන්වලට යොදා ගැනුණු මාතෘකා | සහභාගීකරුවන් සංඛ්‍යාව |
|---|---|
| ආයෝජකයන් සහ ආයෝජන උපදේශකයන් සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සාංගමික ආචාරධර්ම සංග්‍රහයේ සඳහන් විශේෂ ලක්ෂණද ඇතුළත් සාංගමික ආචාරධර්මවල වැදගත්කම | 189 |
| සුරැකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ | 192 |
| ආන්තික වෙළෙඳාම පිළිබඳ නියාමන ක්‍රියාවලියේ ප්‍රායෝගික පැතිකඩ | 104 |
| ඒකක භාර | 144 |
| ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළේ අනාගතය සහ ණය ශ්‍රේණිගත කිරීමේ කාර්යභාරය | 107 |
| මූල්‍ය උපදේශනය සහ සැලසුම් කිරීම | 205 |

### ආයෝජක පාඨමාලාව

ඉදිරියේදී ආයෝජනය කිරීමට අපේක්ෂාවෙන් සිටින ආයෝජකයින් සඳහා කොටස් වෙළෙඳාමේ මූලික න්‍යායාත්මක හා ප්‍රායෝගික තත්වයන් පිළිබඳ දැනුම ලබා දීමේ අරමුණින් සති හයක් පුරා ඉංග්‍රීසි මාධ්‍ය වැඩසටහන් හතරක් වසර තුළ පවත්වන ලදී. වර්ෂය තුළ මෙම වැඩසටහන් සඳහා 173 දෙනෙකු ලියාපදිංචි විය.

### උසස් ආයෝජක පාඨමාලා

දැනට ආයෝජනයෙහි නිරත ආයෝජකයින්ට කොටස් වෙළෙඳාමේ උසස් න්‍යායාත්මක හා ප්‍රායෝගික තත්වයන් පිළිබඳ දැනුම ලබා දීමේ අරමුණින් ඉහත වැඩසටහන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලදී. වර්ෂය තුළ මෙම වැඩසටහන සඳහා සහභාගිවන්නන් 49 දෙනෙකු ලියාපදිංචි කර ඇත.

### රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ව්‍යාපෘතිය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අප, රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ව්‍යාපෘතිය දිගටම කරගෙන යන ලදී. එය ආරම්භ කරන ලද්දේ විශ්ව විද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ ආශ්‍රිත විෂයයන් හැදෑරීමට උපාධි අපේක්ෂකයින් දිරිමත් කිරීමේ අරමුණිනි. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ දක්ෂතා දක්වන උපාධි අපේක්ෂකයින්ට රන් පදක්කමක් සහ මුදල් ත්‍යාගයක් පිරිනමනු ලැබේ. ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ජාතික විශ්ව විද්‍යාල එකොළහක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී.

පහත සඳහන් ජාතික විශ්ව විද්‍යාලවලට 2019 වර්ෂය තුළ රන් පදක්කම් සහ මුදල් ත්‍යාග පිරිනමන ලදී.

- කැළණිය විශ්ව විද්‍යාලය
- යාපනය විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය
- ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය
- රුහුණු විශ්ව විද්‍යාලය

### සහතික පත්‍ර ප්‍රදානෝත්සවය

5 වන සහතික හා ඩිප්ලෝමා සම්මාන ප්‍රදානෝත්සවය 2019 පෙබරවාරි 13 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්විණි. ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (CCM), ලියාපදිංචි ආයෝජන උපදේශක (RIA), ඩිප්ලෝම පාඨමාලාව (DCM) හා ඒකක භාර පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කළ සියලුම සාර්ථක සිසුන් සඳහා සම්මාන පිරිනමන ලදී.

සම්මාන ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා සහභාගී වූ මෙම අවස්ථාවට පැමිණ සිටි සිසුන් 100 කට අධික පිරිසක් සම්මාන ලබා ගත්හ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයන් සහ එහි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, කොටස් තැරැව්කරුවන්, ඒකක භාර කර්මාන්තයේ නිලධාරීන් සහ තවත් බොහෝ ආරාධිත අමුත්තන් මෙම අවස්ථාවට සහභාගී වූහ.

# මෙහෙයුම් සමාලෝචනය

## ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය (CMIC)

අධ්‍යයන කාර්යමණ්ඩල වලට සහ උපාධි අපේක්ෂකයින්ට විද්‍යුත් ඉගෙනුම් පරිසරයක් ලබා දීමට අප අපේක්ෂා කරන බැවින්, ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු, දත්ත සහ වෙනත් අධ්‍යාපන මෙවලම් ලබාදෙමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය අඛණ්ඩව යාවත්කාලීන කිරීම සිදුකරනු ලබයි. මෙම සිසුන් තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ පර්යේෂණයන් පිළිබඳ අවබෝධය තවදුරටත් වර්ධනය කර ගැනීමට අවස්ථාවක් ලබාදීම මෙන්ම ආයෝජනය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමද මෙමගින් අපේක්ෂා කෙරේ.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුවත්භාවය සහ බාහිර සම්බන්ධතා

ජනතාව අතර මූල්‍ය නිපුණතා වැඩිදියුණු කිරීම සහ හොඳින් දැනුවත් මූල්‍ය තීරණ ගැනීමට ඔවුන්ට සහාය වීමට, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විවිධ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් ආයෝජක අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කර පවත්වනු ලබයි. අපගේ වැඩසටහන් විවිධ ප්‍රේක්ෂකයින් වෙත ළඟා වීමට සුදුසු ලෙස නිර්මාණය වී ඇති අතර සම්මන්ත්‍රණ, වැඩමුළු, ඩිජිටල් මාධ්‍ය සහ ප්‍රකාශන ඇතුළු විවිධ ශිල්පීය ක්‍රම ඒ අතර ප්‍රධාන වේ.

## සම්මන්ත්‍රණ සහ වැඩමුළු හරහා දැනුවත් කිරීම

අපගේ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් මූලිකවම අවධානය යොමු කර ඇත්තේ දැනට ආයෝජනයෙහි නිරත වෙමින් සිටින සහ ආයෝජනය කිරීම සඳහා හැකියාව ඇති ආයෝජකයන් වඩාත් කැමතිම ආයෝජන මාර්ගය බවට ප්‍රාග්ධන වෙළෙඳපොළ පත් කිරීම සඳහා දිරිමත් කිරීමයි. වර්ෂය තුළ අප රට පුරා පාසල් ළමුන්, උපාධි අපේක්ෂකයින්, ගුරුවරුන් සහ සාමාන්‍ය ජනතාව සඳහා මූල්‍ය අධ්‍යාපනික සම්මන්ත්‍රණ/ වැඩමුළු පවත්වන ලදී. එසේ පවත්වන ලද වැඩසටහන් වල සාරාංශය පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 16)

සංඛ්‍යා සටහන: 16 පවත්වන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු

| වැඩසටහන් වර්ගය | වැඩසටහන් ගණන |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පවත් වන ලද ගුරු පුහුණු වැඩසටහන් (භාෂා ත්‍රිත්වයන්ම) | 07 |
| පාසල් සම්මන්ත්‍රණ (උසස් පෙළ සිසුන්) (භාෂා ත්‍රිත්වයන්ම) | 13 |
| උපාධි අපේක්ෂකයින් | 06 |
| එම්පවර් පුවරුවේ ලැයිස්තුගතවීම සඳහා හැකියාව ඇති සමාගම් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසම හා කොළඹ කොටස් වෙළෙඳපොළ එක්ව පවත් වන ලද වැඩසටහන් (SEC/CSE SME Forums) | 05 |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසම හා කොළඹ කොටස් වෙළෙඳපොළ එක්ව පවත් වන ලද පුළුල් ආයෝජක සම්මන්ත්‍රණ | 04 |
| කොළඹ කොටස් හුවමාරුවේ සිවිදින වැඩසටහන් | 01 |

## පාසල් හා විශ්ව විද්‍යාල සඳහා පවත් වන ලද වැඩසටහන්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, පාසල් ළමුන්, පාසල් ගුරුවරුන්, විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් සහ කථිකාචාර්යවරුන් අතර මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා දිවයින පුරා සම්මන්ත්‍රණ හා වැඩමුළු ගණනාවක් පවත්වමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අඛණ්ඩව කටයුතු කළේය.

පාසල් ගුරුවරුන් සහ සිසුන් අතර හොඳ මූල්‍ය දැනුමක් ලබා දෙමින් පාසල් මට්ටමේ සිට මූල්‍ය අධ්‍යාපනය ආරම්භ කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කටයුතු කරයි. තවද, ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂය වර්තමානයේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන විෂයට සහ අ.පො.ස. (උසස් පෙළ) ව්‍යාපාර අධ්‍යයනය පාසල් විෂය නිර්දේශයන්ට ද ඇතුලත් කර ඇති අතර එම විෂය නිර්දේශයට අදාළ කොටස අප විසින් පවත්වනු ලබන ප්‍රාග්ධන වෙළෙඳපොළ වැඩසටහන් තුළින් ආවරණය කෙරේ. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමඟ එක්ව පවත්වනු ලබයි.

සියළුම ජාතික විශ්ව විද්‍යාල වල කළමනාකරණ, ගණකාධිකරණය, වාණිජ හා ආර්ථික විද්‍යා පීඨයන් සමඟ එක්ව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව උපාධි අපේක්ෂකයින් සහ කථිකාචාර්යවරුන් දැනුවත් කිරීම සඳහා නිරන්තර වැඩසටහන් පවත්වන ලදී.

ඒ අනුව විශ්ව විද්‍යාල 06 ක උපාධි අපේක්ෂකයින් සඳහා වැඩසටහන් පවත්වන ලදී.

## Core (Coherant, Open, Responsive and Effective) Justice වැඩසටහ

නීති හා බලාත්මක කිරීමේ අංශය විසින්ල ශ්‍රී ලාංකීය නීති වෘත්තියේ පාලනයල සුදුසුකම් හා විවිධත්වය වැඩිදියුණු කිරීම උදෙසා රජයේ විශ්ව විද්‍යාල සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ තෝරාගත් සිසුවියන් සඳහා දේශීයකරණය කළ අධ්‍යයන චාරිකාවකට පහසුකම් සලසන ලදීග ෂීෂා සමග එකතුව සිදුකෙරුන මෙම වැඩසටහන පැවැත්වුනේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වැනි ආයතන (මෙම අධ්‍යයනයේ අවධානය යොමු කෙරෙන ප්‍රධාන යතනයක් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තෝරාගෙන තිබීම නිසා) වල කාර්යයන් දැකබලා ගෙන ඒවායේ නීති ක්ෂේත්‍රයේ ඇති රැකියා අවස්ථා පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට සිසුන් බලගගැන්වීම සඳහායිග

## ප්‍රාදේශීය ආයෝජක වැඩමුළු

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව (CSE) විසින් 2019 වර්ෂය තුළදී රට පුරා "කොටස් වෙළෙඳපොළ නගරයෙන් නගරයට " ආයෝජක වැඩමුළු මාලාව අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබීය.

මෙම වැඩමුළු පවත්වනු ලැබුවේ මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම සහ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ ඇති ආයෝජන උපකරණ වර්ග පිළිබඳ දැනුම ලබා දීම, ධනය උත්පාදනය වැඩි කිරීම සහ ආයෝජකයින් වංචාවන්ට හසුවීමට ඇති ප්‍රවණතාව අඩු කිරීමේ අරමුණ ඇතිවය.

මෙම ප්‍රාදේශීය වැඩමුළු සඳහා වෘත්තිකයන්, ව්‍යවසායකයින්, අධ්‍යාපනඥයින් ඇතුළු විශාල පිරිසකගේ ක්‍රියාකාරී සහභාගීත්වයක් දක්නට ලැබුණි. වර්ෂය තුළ පහත සඳහන් නගර ආවරණය කරමින් ප්‍රාදේශීය ආයෝජක වැඩමුළු පවත් වන ලදී.(සංඛ්‍යා සටහන 17)

සංඛ්‍යා සටහන: 17 ප්‍රාදේශීය වැඩමුළු

| දිනය | වැඩමුළු පවත් වන ලද නගරය |
|---|---|
| 2019 මාර්තු 23 දින | මාතර |
| 2019 ජූනි 22 දින | යාපනය |
| 2019 සැප්තැම්බර් 07 දින | තිස්සමහාරාම |
| 2019 සැප්තැම්බර් 21 දින | පොලොන්නරුව |

වැඩසටහන් සඳහා සහභාගී වූ ආයෝජකයින්ට කොටස් තැරැව්කාර ආයතනවල නියෝජිතයන් සහ ඒකක භාර කළමනාකරණ සමාගම්වල නියෝජිතයන් හමුවීමටත් අවශ්‍ය ආයෝජන උපදෙස් ලබා ගැනීමටත් අවස්ථාව ලබා දෙන ලදී. මෙම ආයෝජක වැඩමුළුවල කර්මාන්තයේ නියුතු ප්‍රවීණයින් විසින් කොටස්වල ආයෝජනයේ විවිධ පැති ආවරණය කරමින් දේශණ සිදු කළ අතර විද්වත් මණ්ඩල සාකච්ඡා ද පවත් වන ලදී.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා පවත් වන ලද (SME) වැඩමුළු

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව විසින් 2018 ජූලි මාසයේදී "එම්පවර් පුවරුව" දියත් කිරීමෙන් අනතුරුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැඩමුළු දිවයින පුරා පවත්වන ලදී. එහි අරමුණ වුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ අභිප්‍රාය ඇතිව වැඩි ප්‍රාග්ධනයක් ලබා රැස්කරගනිමින් ඔවුන්ගේ ව්‍යාපාර පුළුල් කරගැනීමට අවස්ථාව සැලසීම සඳහා එම්පවර් පුවරුව පිළිබඳව වැඩිදුර දැනුවත් කිරීමයි.

මෙම නව ලැයිස්තුගත කිරීමේ ක්‍රමය හරහා ප්‍රාග්ධනය රැස් කිරීම සම්බන්ධයෙන් ප්‍රේක්ෂකයන්ට ඇතිවිය හැකි ගැටළු විසඳීම සඳහා කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ලැයිස්තුගත සමාගම්වල නියුතු විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් විද්වත් මණ්ඩල සාකච්ඡා වලින් ද ඉහත කී වැඩමුළු සමන්විත විය. 2019 වර්ෂය තුළ පවත්වන ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැඩමුළු (SME Forums) පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 18)

සංඛ්‍යා සටහන: 18 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැඩමුළු

| දිනය | වැඩමුළු පවත්වන ලද නගරය |
|---|---|
| 2019 ජූනි 28 දින | මහනුවර |
| 2019 අගෝස්තු 24 දින | යාපනය |
| 2019 සැප්තැම්බර් 06 දින | මාතර |
| 2019 සැප්තැම්බර් 20 දින | පොළොන්නරුව |
| 2019 සැප්තැම්බර් 21 දින | මඩකලපුව |

## පාර්ශවකරුවන්ගේ සඳහා පැවති වැඩමුළු

### ලැයිස්තුගත සමාගම් සමඟ පැවති සාකච්ඡාව

ලැයිස්තුගත ආයතන සිය ව්‍යාපාර කටයුතු සිදුකරන නියාමන පරිසර පද්ධතිය නිශ්චය කිරීම සහ මෙහෙයුම් රාමුව තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා අතිරේක නියාමන මැදිහත්වීමක් අවශ්‍ය දැයි ඇගයීම සඳහා සමුළුවක් 2019 ජූලි මාසයේ දී පැවැත්විණි.

බොහෝ සමාගම් දැනටමත් සභාපති තනතුර සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුර ස්වේච්ඡාවෙන් වෙන් කිරීම ක්‍රියාවට නංවා ඇති අතර, එය ක්‍රියාවට නොනැංවූ පිරිසෙහි අභියෝග සලකා බැලීමෙහිලා, සභාපති තනතුර සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුර වෙන් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂයෙන් සාකච්ඡා කරන ලදී.

### විගණකවරුන් සහ අනෙකුත් ප්‍රාග්ධන වෙළෙඳපොළ පාර්ශවකරුවන් සමඟ පැවති වටමේස සාකච්ඡාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන කාර්යයන් සඳහා විගණකවරුන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වැනි නිල සේවා සපයන්නන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපේක්ෂාවන් අවධාරණය කිරීම සඳහා එම වටමේස සාකච්ඡාවක් සංවිධානය කරන ලදී. ඒ අනුව සහභාගි වූවන් අතර නියාමන අපේක්ෂාවන් පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා විගණකවරුන්, ආයෝජන උපදේශකයින්, බැංකුකරුවන්, තක්සේරුකරුවන්, ආයුගණකවරුන් දැනුම හුවමාරු සැසි සැසිවාරයට සහභාගි වන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිය අපේක්ෂාවන් සපුරාලීමේ හිඩැස් විස්තර කිරීම සඳහා සත්‍ය සිදුවීම් සමුදායක් පෙන්වා දෙන ලදී.

### සාංගමික යහපාලනය සම්බන්ධයෙන් වූ කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාව

ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ වන සාංගමික යහපාලනය සම්බන්ධයෙන් වූ රාමුව වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකයින්, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා අධ්‍යක්ෂකවරුන්ගේ ආයතනය, වරලත් මූල්‍ය විශ්ලේෂක වරුන්ගේ ශ්‍රී ලාංකීය සමාජය, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නියෝජනය කරන්නන්ගෙන් සැදුම්ලත් කේන්ද්‍රීය කණ්ඩායම විසින් දැනට පවතින සාංගමික යහපාලන රාමුව සමාලෝචනය කරන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද සැසිවාරයට සහභාගී වූ 50 කට අධික ආසන්න පිරිසකගේ පුළුල් පරාසයකින්, කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවේ සාමාජිකයින් තෝරා ගන්නා ලදී.

### වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ වැඩමුළුව (CFA Forum)

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2019 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ වරලත් මූල්‍ය විශ්ලේෂක සංගමය (CFASL) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ අතර ආයතන දෙක එක්ව වැඩ කරමින් ආයෝජකයින්ගේ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම, ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ වෘත්තීය ප්‍රමිතීන් සහ අඛණ්ඩතාව පවත්වා ගැනීම සහතික කිරීම අභි අරමුණ විය.

ඉන් අනතුරුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, වරලත් මූල්‍ය විශ්ලේෂක සංගමය (CFASL) සමඟ එක්ව සිය පළමු සහයෝගිතා වැඩමුළුව 2019 නොවැම්බර් මාසයේදී "වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ ආයතනයේ ගෝලීය ආයෝජන කාර්ය සාධන ප්‍රමිතීන් සහ වත්කම් කළමනාකරණ සංග්‍රහය යොදාගැනීම අරමුදල් සම්පාදකයින්ට සහ ආයෝජකයින්ට ප්‍රයෝජනවත් විය හැක්කේ ඇයි?" යන මාතෘකාව යටතේ කොළඹ හිල්ටන් රෙසිඩන්සීස් හෝටලයේ ග්‍රෑන්ඩ් බෝල්රූම් හිදී පවත්වන ලදී. වරලත් මූල්‍ය විශ්ලේෂකයින්ගේ ආයතනයේ , ආසියා පැසිෆික් කලාපයේ වෘත්තීය හැසිරීම් බලාත්මක කිරීමේ අධ්‍යක්ෂ එඩී වෑන් මහතා වැඩමුළුවේ සම්පත්දායකයා විය.

### ප්‍රදර්ශන සඳහා සහභාගී වීම්

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ආයෝජකයින්ට නිවැරදි ආයෝජන තීරණ ගැනීම සඳහා උපකාරී වන විවිධ ක්‍රමවේදයන් භාවිතා කරයි. ඒ අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 2019 වර්ෂය තුළ ප්‍රදර්ශන කිහිපයකට සහභාගී විය. (සංඛ්‍යා සටහන: 19)

# මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා සටහන: 19 ප්‍රදර්ශන සඳහා සහභාගිවීම්

| දිනය | ප්‍රදර්ශනය | ප්‍රදර්ශනයන් පැවති ස්ථාන |
|---|---|---|
| 2019 මාර්තු 11 දින | මොමෙන්ටම් - 2019 | BMICH (කොළඹ) |
| 2019 මාර්තු 15 දින | එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා | අනුරාධපුර |
| 2019 සැප්තැම්බර් 12 දින | එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා | යාපනය |
| 2019 ඔක්තෝබර් 03-04 දින | ලෝක ආයොජන සතිය | ලෝක වෙළඳ මධ්‍යස්ථානය (කොළඹ) |

කොළඹ කොටස් වෙළෙඳපොළ සමඟ එක්ව "2019 ලෝක ආයෝජකයින්ගේ සතිය" හා සමගාමීව, ආයෝජක අධ්‍යාපනය සහ ආයෝජක රැකවරණයෙහි වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ප්‍රදර්ශන කුටියක් ආරම්භ කළේය. මෙම ප්‍රදර්ශන කුටිය මෙහෙයවනු ලැබුවේ කොටස් තැරැව්කාර ආයතන 09 ක් සහ ඒකක භාර කළමණාකරන සමාගම් 03 ක් විසිනි. දින දෙකක ප්‍රදර්ශන කුටියට මහජනයාගෙන් විශාල ප්‍රතිචාරයක් ලැබුණි. සැලකිය යුතු සංඛ්‍යාවක් මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි (CDS) ගිණුම් විවෘත කරන ලදී. සුරැකුම්පත් වෙළෙඳපොළේ ආයෝජනය කිරීම පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා සිසුන්, විවිධ කර්මාන්ත වල නියුතු වෘත්තිකයන් සහ සාමාන්‍ය ජනතාව ද මෙම කුටියට පැමිණියහ.

## විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීම්

### සමස්ත ලංකා අන්තර් පාඨශාලීය උසස් පෙළ රූපවාහිනී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන.

දිවයින පුරා උසස් පෙළ වාණිජ හා ආර්ථික විද්‍යා සිසුන් අතර මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිසම සිදුකරගෙන යනු ලබන ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2019-2020 වර්ෂය සඳහා රූපවාහිනී ප්‍රශ්න විචාරාත්මක දැනුම මිනුම වැඩසටහනක් දියත් කරන ලදී.

මූලික තරඟ විභාගය, අවසන් පූර්ව වටය සහ අවසන් අවසන් මහා තරඟය ආදී වශයෙන් අදියර 03 කින් පැවැත්වෙන මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ පළාත් නවයෙහිම සිසුන් අතර පැවැත්වේ.

දිවයින පුරා විභාග මධ්‍යස්ථාන 21කදී සිසුන් 600 කට වැඩි පිරිසකගේ සහභාගීත්වය ඇතිව පවත්වන ලද මූලික වටයේ තරඟ විභාගය සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ සහ කොළඹ ව්‍යාපාර වස්තු භුවමාරුවේ සහාය ලබා ගන්නා ලදී.

මෙම රූපවාහිනී වැඩසටහනේ පූර්ව පටිගත කිරීම් සමඟින් එහි දෙවන අදියර දක්වා ඉදිරියට යන අතර 2020 මැද භාගයේදී විකාශය කිරීමට නියමිතය.

## මුද්‍රිත මාධ්‍ය හරහා දැනුවත් කිරීම්

### ආයෝජනය පිළිබඳ කාටූන් මාලාව

මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දෘශ්‍ය ආකෘතියක් ද භාවිතා කරන ලදී. ඒ අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සතිඅන්ත සහ පුවත්පත්වල "අනාගතයට ආයෝජනයක්" යන තේමාව යටතේ භාෂා ත්‍රිත්වයෙන්ම කාටූන් මාලාවක් අඛණ්ඩව දියත් කරන ලදී.

ඊට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව භාෂා ත්‍රිත්වයම ආවරණය වන පරිදි නැණවත්ව ආයෝජනය කිරීම පිළිබඳ ඉඟි ඇතුළත් විශේෂ මහජන දැන්වීම් මාලාවක් ප්‍රසිද්ධියට පත් කළේය. ඉතුරුම් සහ ආයෝජන අතර වෙනස, සුරැකුම්පත් ගිණුමක් ආරම්භ කිරීම, කොටස් තෝරා ගන්නා ආකාරය ආදිය ආවරණය වන පරිදි දැනුවත්භාවයක් ලබාදෙමින් 2019 ලෝක ආයෝජක සතියට සමගාමීව මෙම දැන්වීම් ප්‍රකාශයට පත් කරන ලදී.

### පුවත්පත් ලිපි මාලාව

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළේ ආයෝජනය කිරීම පිළිබඳ ලිපි මාලාව තවදුරටත් අඛණ්ඩව ඩේලි මිරර්, අද සහ ටැමිල් මිරර් යන පුවත්පත් සමඟ පලකරන ලදී.

## "Smart Investor" ශිර්ෂය යටතේ පලකරන ලද ආයෝජක දැන්වීම් මාලාව















# මෙහෙයුම් සමාලෝචනය

## IOSCO සමඟ සම්බන්ධතාවය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානයේ (IOSCO) සාමාන්‍ය සාමාජිකයෙකු වන අතර වර්ධනය හා නැගී එන වෙළෙඳපොළ කමිටුවේ (GEMC)සහ ආසියා පැසිෆික් කලාපීය කමිටුවේ (APRC) සාමාජිකයෙකි. ප්‍රතිපත්ති කමිටු අටක් විසින් ෂඩ්කඩ හී ප්‍රතිපත්තිමය කටයුතු සිදු කරන අතර බලාත්මක කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම පිළිබඳ කමිටුව (4 වන කමිටුව) සහ සුළු පරිමාණ ආයෝජකයින් පිළිබඳ කමිටුව යන ප්‍රතිපත්ති කමිටු දෙක ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නියෝජනය කරයි. (8 වන කමිටුව) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ෂඩ්කඩ සමඟ අවබෝධතා ගිවිසුමටද අත්සන් තබා ඇත. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නියෝජනය කරන ප්‍රතිපත්ති කමිටු දෙකේ රැස්වීම්වලට අඛණ්ඩව සහභාගී වී ක්‍රියාශීලීව කටයුතු කරන අතර සමීක්ෂණ සහ ප්‍රශ්නාවලිවලට ප්‍රතිචාර දැක්වීම තුළින් විවිධ වැඩ ප්‍රවාහයන්ට දායක වේ.

## මානව සම්පත්

පැවරී ඇති කාර්යභාරය ඉටුකිරීමේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීමේ අරමුණින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නිවැරදි පුද්ගලයින් බඳවා ගැනීමට, සංවර්ධනය කිරීමට හා රඳවා ගැනීමට උත්සාහ කරයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එහි මූලික කාර්යයන් ඉටු කිරීම සඳහා මෙන්ම තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වූ විශේෂිත දැනුමින් හා කුසලතා වලින් සමන්විත මානව ප්‍රාග්ධනයක් හිමිය.

## කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය සේවකයින්ට වඩාත් ආරක්ෂිත සහ හිතකර පරිසරයක් සපයන අතර අත්දැකීම් ලබා ගැනීමට, සේවා තෘප්තිය වැඩි කිරීමට සහ රැකියා ජීවිතය සමතුලිතව පවත්වා ගැනීමට හිතකර සේවා ස්ථාන සංස්කෘතියක් ද ප්‍රවර්ධනය කරයි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, ආවේක්ෂණ අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා සුදුසුකම් ලත් පළපුරුදු සේවකයෙකු බඳවා ගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමත් විය. එසේම සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සහකාර කළමනාකරුවන් දෙදෙනෙකු සහ එක් රියදුරෙකු ද බඳවා ගන්නා ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විවිධ අංශයන්ගෙන් යුත් කණ්ඩායමකින් සමන්විත වන අතර සෑම විටම අපගේ උපාය මාර්ග හා ප්‍රතිපත්ති තුළින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර ගැනීමට උත්සාහ කරයි. එපමණක් නොව, කාර්ය මණ්ඩලයේ ඇති කැපවීම සහ වෘත්තීයමයභාවය අගය කිරීමටත්, නිසි ගරුත්වය ලබාදීමටත් , ආරක්ෂාකර ගැනිමටත් සහ වටිනාකමක් ලබාදිමටත් කටයුතු කරන්නෙමු.

## සේවක තෘප්තිය සහ චිත්ත ධෛර්යය වැඩි දියුණු කිරීම

ආයතනයට දීර්ඝ කාලයක් සේවය කළ සහ කාර්යසාධනයක් පෙන්වූ සේවකයින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිසි පිළිගැනීමට ලක්ව ඇති අතර, එවැනි ඇගයීමක ප්‍රතිඵල ලයක් ලෙස රැකියා තෘප්තිය වැඩිදියුණු කිරීමටත් වඩා හොඳ කාර්ය සාධනයක් සඳහා සේවකයින් පෙළඹවීමටත් හේතු වී තිබේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සේවකයින් නව දෙනෙකු ඔවුන්ගේ කාර්යසාධනය සහ සේවා කාලය මත පදනම්ව උසස්වීම් ලබා ගත්හ.

2017 ජනවාරි 1 වන දින කළමනාකරණ අභ්‍යාසලාභීන් 10 දෙනෙකු අවුරුදු දෙකක පුහුණු වැඩසටහනක් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට බඳවාගන්නා ලද අතර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ඔවුන්ගෙන් 7 දෙනෙකු කාර්යසාධනය පිළිබඳ ඇගයීමකින් පසු ස්ථිර කාර්යමණ්ඩලයට ඇතුළත් කර ගන්නා ලදී.

## විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම්

මුදල් හා පරිපාලන අධ්‍යක්ෂ ඉයන්ති ජයරත්න මෙනවිය වයස අවුරුදු 60 ඉක්මවීමෙන් අනතුරුව 2019 මාර්තු මාසයේදී විශ්‍රාම ගත්තාය. විශ්‍රාම ගැනීමෙන් පසු තවත් වසරක කාලයක් සඳහා සේවා දිගුවක් ඇයට ලබා දුන්නේය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ එක් අධ්‍යක්ෂවරයකු, ජ්‍යෙෂ්ඨ සහකාර කළමණාකරුවන් දෙදෙනෙකු, සහකාර කළමණාකරුවන් තිදෙනෙකු, එක් නිලධාරියෙකු සහ එක් විධායක ලේකම්වරියක් ඉල්ලා අස්වූ අතර කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ අස්වීමේ ප්‍රතිශතය 11% ක් සහ කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමේ ප්‍රතිශතය 89% ක් ලෙස වර්ෂය තුළ වාර්තා විය. (සංඛ්‍යා සටහන 20) (රූප සටහන 04)

සංඛ්‍යා සටහන 20: 2019 දෙසැම්බර් 31 දිනට සේවක සංයුතිය

| තනතුරු | අමාත්‍යාංශය විසින් නියමිත දිනට අනුමත කරන ලද කාර්ය මණ්ඩලය | 2017 පෙබරවාරි 14 දින හා 2018 ජනවාරි 22 දින පැවති කොමිෂන් සභා රැස්වීම්වල තීරණ මත පදනම්ව ඉහළ නංවන ලද කාර්ය මණ්ඩලය | 2019 .12.31 දිනට සමස්ත කාර්යමණ්ඩලය | පවත්නා කාර්ය මණ්ඩලය | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | තාවකාලික | |
| විධායක කාර්ය මණ්ඩලය | | | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | | 1 | 1 | | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 2 | 1 | | 1 |
| අධ්‍යක්ෂක | 11 | | 11 | 5 | 1 | 5 |
| සහකාර අධ්‍යක්ෂ | 5 | 5 | 10 | 3 | | 7 |
| කළමනාකරුවන් | 8 | 10 | 18 | 9 | | 9 |

| තනතුරු | අමාත්‍යාංශය විසින් නියමිත දිනට අනුමත කරන ලද කාර්ය මණ්ඩලය | 2017 පෙබරවාරි 14 දින හා 2018 ජනවාරි 22 දින පැවති කොමිෂන් සභා රැස්වීම්වල තීරණ මත පදනම්ව ඉහළ නංවන ලද කාර්ය මණ්ඩලය | 2019 .12.31 දිනට සමස්ත කාර්යමණ්ඩලය | පවත්නා කාර්ය මණ්ඩලය | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | තාවකාලික | |
| ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් | | | | 20 | | |
| සහකාර කළමනාකරුවන් | 43 | 20 | 63 | 19 | | 21 |
| ජ්‍යෙෂ්ඨ විධායක ලේකම් | | | | 2 | | |
| විධායක ලේකම් | | | | 1 | | |
| නිලධාරීන් | 11 | | 11 | 6 | | 5 |
| **විධායක නොවන** | | | | | | |
| රහස්‍ය ලේකම් | 6 | | 6 | 3 | | 1 |
| දුරකථන ක්‍රියාකරුවන් | | | | 2 | | |
| විධායක නොවන (අවශ්‍යතාව මත නම් කිරීමට නියමිත) | | 3 | 3 | - | | 3 |
| සහාය කාර්යා මණ්ඩලය | | | | | | |
| ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාර | | | | 4 | | |
| කාර්යාල සහකාර | 10 | 2 | 12 | 1 | | 1 |
| කාර්යාල සහායක/රියදුරු | | | | 4 | 2 | |
| **එකතුව** | 96 | 41 | 137 | 81 | 3 | 53 |

## රූප සටහන 04: කාර්යමණ්ඩල සංයුතිය පිළිබඳ විස්තර




- අධ්‍යක්ෂ ජනරාල්
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
- අධ්‍යක්ෂක
- සහකාර අධ්‍යක්ෂක
- කළමනාකාර
- ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාර
- සහකාර කළමනාකාර
- නිලධාරි
- ජ්‍යෙෂ්ඨ විධායක ලේකම්, විධායක ලේකම් සහ රහස්‍ය ලේකම්
- පිළිගැනීමේ නිලධාරි සහ දුරකථන ක්‍රියාකරු
- ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාර
- කාර්යාල සහකාර
- කාර්යාල සහායක/ රියදුරු

## ස්ත්‍රී/ පුරුෂ විශ්ලේෂණය

සළකා බලන වර්ෂය අවසානයේදී ස්ථිර කාර්ය මණ්ඩලයේ ස්ත්‍රී/ පුරුෂ හා වයස් විශ්ලේෂණය අනුව, සමස්ත කාර්ය මණ්ඩලයේ සාමාජික,සාමාජිකාවන් 84 අතුරින් න් පිරිමි 30 ක් හා කාන්තාවන් 54 ක් විය. (රූප සටහන් 05,06,07,08)

## රූප සටහන 05: ස්ත්‍රී/ පුරුෂ විශ්ලේෂණය




- ස්ත්‍රී
- පුරුෂ

## රූප සටහන 06: සේවාකාලය පිළිබඳ තොරතුරු




- අවුරුදු 5 ට අඩු
- අවුරුදු 6-8
- අවුරුදු 9 -11
- අවුරුදු 12-14
- අවුරුදු 15-17
- අවුරුදු 18-19-20
- අවුරුදු 21 ට වැඩි

# මෙහෙයුම් සමාලෝචනය

**රූප සටහන 07: කාර්යමණ්ඩල වයස් විශ්ලේෂණය**




**රූප සටහන 08: කාර්යමණ්ඩලයේ අධ්‍යාපන සුදුසුකම්**




### සේවක සුබසාධනය

වසර අවසානයේදී ‘Dazzling Night’ යන තේමාව යටතේ කාර්ය මණ්ඩල සංවිධානය කරන ලද අතර එමඟින් කාර්ය මණ්ඩලයට, ඔවුන්ගේ කලත්‍රයින්ට සහ දරුවන්ට සෙසු කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සමඟ සුහදව කටයුතු කිරීමට අවස්ථාව ලැබුණි.

### පුහුණු හා සංවර්ධන

කාර්ය මණ්ඩලය ඕනෑම ආයතනයක ධනය වන බැවින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධානය යොමු කරනුයේ ජාත්‍යන්තර තලයේ ප්‍රාග්ධන වෙළඳපොළවල්වල නියාමන සහ සංවර්ධනයන් සම්බන්ධ නව ප්‍රවණතා පිළිබඳව අවධානය යොමුකරමින් තම කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණුවීම් හා සංවර්ධනයන් වෙත යොමු කිරීමයි. අපගේ පුහුණු හා සංවර්ධන රාමුව, ව්‍යුහගත, දියුණුවන, සේවකයින්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කරන සහ කුසලතා ශක්තිමත් කරන එකකි.

කාර්ය මණ්ඩලයට විදේශීය පුහුණුව ලබා දීම වෙනුවෙන් දළ වශයෙන් රුපියල් මිලියන 8.6 ක් වර්ෂය තුළ වෙන් කරන ලදී. එමෙන්ම සලකා බලන වර්ෂය තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දේශීය පුහුණු කටයුතු සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 1.5 ක් ද, උසස් අධ්‍යාපනය සහ සාමාජික ගාස්තු සඳහා අනුග්‍රාහකත්වය ලබාදීම් වෙනුවෙන් තවත් රුපියල් මිලියන 0.5 ක් ද වැය කර තිබේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, රුසියාව වැනි රටවල පවත්වන ලද විවිධ වැඩසටහන් වලදී ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය හා සංවර්ධනය පිළිබඳ පුහුණුවීම් සඳහා සහභාගීවීමට කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අවස්ථාව උදා විය. දැනුම හුවමාරු කර ගැනීම සහ සෙසු නියාමකයින් අතර සහයෝගීතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානය (IOSCO), ආසියා පැසිෆික් ආර්ථික සහයෝගීතාව (APEC) සහ අනෙකුත් ජාත්‍යන්තර ආයතනවලට අපගේ ස්තුතිය එලකරමු.

තවද, දේශීයව සංවිධානය කරනු ලබන ශ්‍රී ලංකා ආර්ථික සමුළුව 2019, CIMA ව්‍යාපාරික නායකයින්ගේ සමුළුව, වාර්ෂික AAT සමුළුව, වරලත් ගණකාධිකාරීවරුන්ගේ ජාතික සමුළුව, සයිබර් ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය, සමාගම් ලේකම්වරුන්ගේ කාර්යභාරය වැනි සම්මන්ත්‍රණ හා වැඩසටහන් වලට සහභාගී වීමට ද කාර්ය මණ්ඩලයට අවස්ථාව ලබා දෙන ලදී.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනය සඳහා ඇති කැපවීම පෙන්නුම් කරමින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පුහුණු අංශය අඛණ්ඩව කාර්ය මණ්ඩලයට ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ දැනුම වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කෙරෙන අධ්‍යයන පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙයි. ඒ අනුව වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනය (CFA) වට්ටම් ගාස්තු යටතේ පාඨමාලා හැදෑරීම සඳහා කාර්ය මණ්ඩලයට ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලැබූ අතර කාර්යමණ්ඩලය සඳහා පශ්චාත් උපාධි ඇතුළු උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා අනුග්‍රාහකත්වයන් ද අප ලබා දී ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා චිත්ත සුවය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව පලපුරුදුලත් චිකිත්සකවරියක් වන පෝලින් කොරයා මෙනවිය විසින් වැඩමුළුවක් පැවැත්වීය.

සභාපතිතුමාගේ කාර්යාලය විසින් මෙහෙයවන විශේෂ වැඩසටහන් යටතේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නිලධාරීන් අතරින් ආර්ථික විද්‍යාර්ථීන්ගෙන් සැදුම්ලත් ආර්ථික බුද්ධි ඒකකයක් (Economic Intelligence Unit) 2019 සැප්තැම්බර් මාසයේ දී පිහිටුවන ලදී. ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය හා සංවර්ධනය සම්බන්ධ සාමාන්‍ය කටයුතු කරගෙන යන අතරතුර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආර්ථික විද්‍යාර්ථීන්ට බුද්ධිමය අභියෝගයක් දැනෙන පරිදි ඊට ගැළපෙන ක්‍රමවේදයක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ විය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එදිනෙදා ජීවිතයේදී මුහුණදීමට සිදුවිය හැකි හදිසි අවස්ථා වලදී ආරක්ෂක පියවර ගැනීම පිළිබඳව ඔවුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රථමාධාර/ ආරක්ෂිත පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. ඉහත පුහුණු වැඩසටහන් පවත්වනු ලැබුවේ ඕවර්සීස් රියලිටි (ලංකා) පීඑල්සී හි ආරක්ෂක අංශ ප්‍රධානී ලසත් ප්‍රනාන්දු මහතා සහ ඕ ආරක්ෂක සේවා අංශයේ නිශාන්ත රාජපක්ෂ මහතා විසිනි.

### සීමාවාසික පුහුණුව

ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයාගේ කාර්යයන් පිළිබඳ ඇත්දැකීම් ලබා ගැනීමට හැකිවන පරිදි ජාතික විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින් කිහිප දෙනෙකුට සීමාවාසික අවස්ථා ප්‍රදානය කිරීමට අප කටයුතු කළෙමු.

### "Triple P" වැඩසටහන

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති රනෙල් ටී විජේසිංහ මහතා විසින් 2018 වසරේදී හඳුන්වාදුන් “වෙලාවට වැඩ කිරීම, ඵලදායිතාව සහ ක්‍රියාශීලීභාවය ” යන "Triple P" වැඩසටහන යටතේ සාංග මික කටයුතු අංශයේ සහකාර කළමනාකාරිනී සමන්ති ගුණවර්ධන මහත්මිය කාර්ය මණ්ඩලය ඉදිරියේ අන් අයට ආදර්ශයක් ලබාදෙමින් සභාපතිතුමාගේ ඇගයීමට ලක්විය.

### තොරතුරු තාක්ෂණ

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශ්‍රී ලංකා CERT | CC ආයතනය (පරිගණක හදිසි සූදානම පිළිබඳ කණ්ඩායම ඇ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය) විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, පද්ධති සහ වෙබ් යෙදුම් පිළිබඳ පද්ධතිමය අවදානම තක්සේරු කිරීමක් සිදු කරන ලදී.

ඊට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආපදා වැළැක්වීමේ පද්ධතිය ආරක්ෂිතව හා නව නිර්මාණයකට අනුව වැඩි දියුණු කරන ලදී. සුළු හෝ ප්‍රමාදයක් වුවද වලක්වා ගැනීමට හැකිවන පරිදි පරිසනක යටිතල පහසුකම් ඉහළ උපයෝගීතාවයකින් යුතුව යොදවා ඇත. ප්‍රාථමික වෙබ් අඩවියක් නොමැති අවස්ථාවක ආරක්ෂක අංග සහ නිවැරදි දත්ත පවත්වා ගෙන යන අතරම මෙහෙයුම් කටයුතු දිගටම කරගෙන යාම සඳහා ව්‍යාපාර සම්බන්ධ තීරණාත්මක දත්ත ආපදා

වැළැක්වීමේ පද්ධතියට යොමු කිරීම සඳහා නව ක්‍රමවේදයක් නිර්මාණය කර ඇත.

### ව්‍යවස්ථාපිත අරමුදල්

#### සෙස් අරමුදල

1991 අංක 26, 2003 අංක 18 , 2009 අංක 47 දරන පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14 ඒ සහ 14 බී යන වගන්තිවලට අනුව පහත ආකාරයෙන් සඳහන් කොට ඇත.

14 ඒ (1) බලපත්‍රලාභී කොටස් හුවමාරුවක සටහන් වී ඇති හෝ එහි නීතිරීති යටතේ දැනුම් දෙන ලද ගැනුම්කරු සහ විකුණුම්කරු යන දෙදෙනාම විසින් සිදුකරනු ලබන සෑම සුරැකුම්පත් මිලදීගැනීමක් සහ විකිණීමක් සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුපාතයකට අනුව වූ සෙස් බද්දක් නියම කිරීම්, අයකිරීම් හා ගෙවීම් කිරීම් සිදු කළ යුතුය. විවිධ වත්කම් පන්ති වෙනුවෙන් විවිධ අයකිරීමේ අනුපාතයන් පැනවීමට ඉඩ ඇත.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ද වෙනත් ඕනෑම ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතුය.

14 බී (1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු වන අතර 14 ඒ වගන්තිය යටතේ අයකරනු ලබන සෙස් බදු අරමුදල් එම සෙස් බදු අරමුදලට බැර කල යුතුය.

(2) කොමිෂන් සභාව අනුමත කරන්නා වූ මුදල් ප්‍රමාණයන් උපයෝගී කරගෙන සෙස් බදු අරමුදලින් පහත සඳහන් කාර්යයන් සිදු කිරීමට හැකියාව ඇත.

(ඒ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම

(බී) 38 වන වගන්තිය යටතේ ස්ථාපිත කොට ඇති වන්දි අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම සඳහා සහ

(සී) කොමිෂන් සභාවේ අරමුණු කරා ළඟාවීමේදී ඊට අවශ්‍ය බලතල , කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට

(3) සෙස් අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින් ,කොමිෂන් සභාව තීරනය කරන ආකාරයකට ආයෝජනක කළ හැකිය.

2010 අගෝස්තු මස 1 වන දින සිට දෙවන වතාවටත් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එක් ගනුදෙනුවක් සඳහා අය කරනු ලබන සෙස් බදු අනුපාතය 0.09% සිට 0.072% දක්වා පහත හෙළන ලදී. මීට කලින් එය වෙනස් කරන ලද්දේ 2003 දෙසැම්බර් 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි 0.1% සිට 0.09% දක්වා අඩු කිරීමෙනි.

2011 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් මිලියන් 50 ක් හා මිලියන 50 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු සඳහා අයකරනු ලැබූ සෙස් බද්ද පිළිවෙලින් 0.072% ක, හා 0.045% ක විය. 2017 ජුනි 27 දින සිට බලපැවැත්වෙන පරිදි එම ගනුදෙනු පරාසය වෙනස් වූ අතර ඒ අනුව මිලියන 100ක් දක්වා සහ මිලියන 100 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු පරාසයන් සඳහා අයකරනු ලබන සෙස් බද්ද පිළිවෙලින් 0.072%ක, හා 0.045% ක විය.

2006 පෙබරවාරි මස 15 දින සිට බලපැවැත්වෙන පරිදි එක්දින ගනුදෙනු සඳහා වන තැරැව්කාර ගාස්තුව, කොටස් වෙළෙඳපොළ සෙස් බදු, මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගාස්තුව හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සෙස් බද්ද යනාදී ගනුදෙනු පිරි වැය ගනුදෙනුවේ එක් පාර්ශවයකට අයකරනු නොලැබේ. එක දින ගනුදෙනු යනුවෙන් හඳුන්වනු ලබන්නේ යම් ආයෝජකයකු එකම සුරැකුම්පත් විශේෂයක් එකම දිනකදී එකම තැරැව්කාර සමාගමක් හරහා මිලදී ගෙන විකිණුවේ නම් හෝ විකුණා නැවත මිලදී ගත්තේ නම් එවැනි ගනුදෙනුය. එවැනි අවස්ථාවක ගනුදෙනුවේ දෙපාර්ශවය වෙනුවෙන්ම අයකරන රජයේ කොටස් ගනුදෙනු ගාස්තුව 0.300% කි.

- මිලදී ගනු ලබන කොටස් ප්‍රමාණය විකුණනු ලැබූ කොටස් ප්‍රමාණය හා සමාන නොවන අවස්ථාවක දී මිලදී ගත් හෝ විකුණනු ලැබ දෙකින් කවර හෝ එකක අඩු ප්‍රමාණය සඳහා සෙස් බද්ද අය නොකෙරේ.
- මිලදී ගනු ලබන කොටස් ප්‍රමාණය විකුණනු ලැබූ කොටස් ප්‍රමාණය හා සමාන වන අවස්ථාවක දී විකුණනු ලැබූ කොටස් ප්‍රමාණය මත සෙස් බද්ද අය නොකෙරේ.

තැරැව්කාර ගාස්තු, කොළඹ කොටස් හුවමාරුව, මධ්‍යම තැන්පතු ක්‍රම සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා ගාස්තු යන ගනුදෙනු ගාස්තු අය නොකිරීම සඳහා එකම සුරැකුම්පත් විශේෂයක් සම්බන්ධයෙන් ආයෝජකයකු විසින් සිදු කරන සමස්ථ මිල දී ගැනුම් හා විකුණුම් සලකා බලයි.

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් එයට බැර කරන ලදී. එමෙන්ම 2009 සහ 2010 වසරවලදී වසරකට රු.මි.50 බැගින් සෙස් අරමුදලින් රුපියල් මිලියන 100ක පියවීම් සහතික කිරීමේ අරමුදලට බැර කරන ලදී.

තවද රු.මිලියන 276ක්, රු.මිලියන 380ක්, රු.මිලියන 94ක් හා රු.මිලියන 52ක් වශයෙන් අවස්ථා 4 දී පිළිවෙලින් 2010.09.30, 2012.09.24 ,2013.12.31 හා 2019.09.16 යන දිනයන්හීදී වීකාබද්ද අරමුදලට බැර කරන ලදී.

2019 දෙසැම්බර් 31 දින වන විට සෙස් අරමුදලට බැර වී ඇති ශේෂය රුපියල් 2,759,652,222/- ක් වන අතර ඉන් රුපියල් 306,607,487/- ක් රජයේ ආයතන වල තාවකාලික අතිරික්ත භාර අරමුදල්වල ආයෝජනය කර ඇති අතර රුපියල් 32,895,534/-ක් භාණ්ඩාගාර බැඳුම්කරවල සහ රු.350,000,000 ක් රජයේ සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනීම්වල ආයෝජනය කර ඇත.

2010 වසරේ සිට 2019 වසර දක්වා සෙස් අරමුදලෙහි වර්ධනය පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ.(රූප සටහන 09)

**රූප සටහන් 09: සෙස් අරමුදල**




#### වන්දි අරමුදල

වර්ෂ 1987 දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟම වන්දි අරමුදල ආරම්භ කරන ලදී. 1987 අංක 36 දරන සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා (සංශෝධිත) පනතේ 38 වන වගන්තියෙහි පහත සඳහන් ආකාරයෙන් දක්වා ඇත.

බලපත්‍රලාභී කොටස් තරව්කරුවෙකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයකුට වන්දි ප්‍රදානය කිරීම සඳහා මෙම වන්දි අරමුදල පිහිටුවන ලදී.

එම වන්දි අරමුදලෙහි පහත සඳහන් කරුණු අන්තර්ගත වේ;

- වන්දි අරමුදලෙහි කාර්යය සඳහා පර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණු මුදල
- 51 අ වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලැබූ මුදල් (51 අ වගන්තිය යනු වරද සමතයකට පත් කිරීම සම්බන්ධයෙන් වුවකි)
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් පනතේ 14බී වගන්තිය යටතේ සෙස් අරමුදලින් බැර කරන මුදල්

වන්දි අරමුදලෙහි බැරට ඇති මුදල්, කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයකට කොමිෂන් සභාව විසින් ආයෝජනය කළ හැකිය.

# මෙහෙයුම් සමාලෝචනය

අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් තිදෙනෙකු වන්දි කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතුය.

පනතට අනුව පත් කරන ලද කමිටුව යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු කිරීමක් හෝ ප්‍රදානයක් සම්බන්ධයෙන් කමිටුව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වන්නේය.

වන්දි සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විධි විධාන සලසා ඇත. පනත අනුව ඉල්ලුම්කරුවෙකු විසින් හිමිකම් පෑමට සහාය වන පරිදි ඉදිරිපත් කරන ලද ලේඛන සහ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසු හෝ එවැනි නඩු විභාගයක නිගමනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වූ ඕනෑම අවස්ථාවක කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසරදීම හෝ නොදීමට ඉඩ ඇත. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් වන්දි අරමුදලට බැර කරන ලදී.

2019 දෙසැම්බර් 31 වන දින විට මෙම අරමුදලේ ශේෂය රුපියල් 457,530,217 කි. 2010 වසරේ සිට 2019 වසර දක්වා අරමුදලෙහි වර්ධනය පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ.(රූප සටහන 10)

**රූප සටහන් 10: වන්දි අරමුදල**

(රු.මිලියන)




**පියවීම් සහතික කිරීමේ අරමුදල**

මෙම පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මැයි මස ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගීකරුවන් අතර ගනුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි විස්තර කළ හැකිය.

- කොටස් ගනුදෙනුවක් වූ සැනින් ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් බේරුම් කිරීම කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී, එනම් ගැනුම්කරු විසින් ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් සිදු කළ යුතු අතර විකුණුම්කරුට ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් පියවීම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් කොටස් අයිතිය පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතරමැදි කාලයක් පැවතීම හේතුවෙන් සුරක්ෂිත නොවන පියවීම් අවදානමක් ඇතිවන නිසා මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාව ඇතිවිය.
- මෙම අරමුදලේ භාරකරුවන් නිළ බලයෙන් ඊට පත් වන අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති , කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති , මහා භාණ්ඩාගාරයෙහි නියෝජ්‍ය ලේකම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රධාන විධායක නිලධාරී යන අය ඊට ඇතුළත් වේ.
- ශ්‍රී ලංකා රජය මෙම අරමුදල ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 50ක මුදලක් ප්‍රදානය කර ඇත. මෙම අරමුදල භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත්වල සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. මෙම අරමුදලට ප්‍රතිපූරක වශයෙන් පරිත්‍යාග තෑගී සහ ප්‍රදානයක් ලබාගත හැකි වේ. වර්තමානයේදී කොටස් තැරැව්කරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායකවීමෙහි අවශ්‍යතාවක් නොමැත.
- මෙම අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 සහ 2010 වසරවලදී මිලියන 50 බැගින් වූ සමාන ප්‍රමාණවලින් සෙස් අරමුදලින් රුපියල් මිලියන 100ක් මෙයට බැර කරන ලදී. පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාර ඔප්පුව වෙනස් කිරීමෙන් අනතුරුව 2012 ජනවාරි මසදී කොළඹ කොටස් හුවමාරුව විසින්ද රුපියල් මිලියන 100ක් මෙම අරමුදලට බැර කරන ලදී.

කෙසේ වෙතත්, පියවීම් සහතික කිරීමේ අරමුදල, පියවීම් අවදානම ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිළියමක් ලෙස මධ්‍යම නිශ්කාෂණ ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා පියවර ගෙන තිබේ. පියවීම් සහතික කිරීමේ අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

2019 දෙසැම්බර් 31 වන දින විට මෙම අරමුදලේ ශේෂය රුපියල් 942,902,878/- කි. 2010 වසරේ සිට 2019 වසර දක්වා අරමුදලෙහි වර්ධනය පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. (රූප සටහන 11)

**රූප සටහන 11: පියවීම් සහතික කිරීමේ අරමුදල**

(රු.මිලියන)



# අතිරේක තොරතුරු

2019 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී සහ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන

**බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළවල්**

සීමා සහිත කොළඹ ව්‍යාපාරවස්තු හුවමාරුව

**බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්**

1. ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) ලිමිටඩ්
2. ආශා ෆිලිප් සෙකියුරිටීස් ලිමිටඩ්
3. ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
4. ඇසෙට්ලයින් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
5. බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
6. කැන්ඩර් ඉක්විටීස් ලිමිටඩ්
7. කැපිටල් ඇලායන්ස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)
8. කැපිටල් ඇලායන්ස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
9. කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
10. සීටී සී එල් එස් ඒ සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
11. එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පුද්) සමාගම
12. ෆස්ට් කැපිටල් ඉක්විටීස් (පුද්ගලික) සමාගම
13. ෆස්ට් ගාඩියන් කොටස් (පුද්ගලික) සමාගම
14. ජේ බී සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
15. ජෝන් කීල්ස් කොටස් තැරැව්කාර (පුද්ගලික) සමාගම
16. ලංකා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
17. LOLC සෙකියුරිටීස් සමාගම
18. නවරා සෙකියුරිටීස් (පුද්ගලික ) සමාගම *
19. NDB සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
20. NSB අරමුදල් කළමනාකරණ සමාගම (ණය සුරැකුම්පත්)
21. රිචඩ් පීරිස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
22. SC සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
23. SMB සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
24. සොෆ්ට්ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්) සමාගම
25. සමර්විල් කොටස් තැරැව්කාර (පුද්ගලික) සමාගම
26. තැප්‍රොබේන් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
27. ටී.කේ.එස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම*
28. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)

*ව්‍යාපාර මෙහෙයුම් ස්වේච්ඡාවෙන් අක්‍රිය කිරීම

**බලපත්‍රලාභී කොටස් වෙළෙඳුන**

1. ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
2. බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම (ණය)
3. කැපිටල් ඇලායන්ස් ලිමිටඩ් (ණය)
4. එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පුද්ගලික) සමාගම
5. ජේබී සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
6. NDB සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
7. සීමාසහිත NSB අරමුදල් කළමනාකරණ සමාගම (ණය)
8. සෙලාන් බෑන්ක් පීඑල්සී (ණය)
9. SMB සුරැකුම්පත් (පුද්ගලික) සීමිත- (ණය)
10. සොෆ්ට්ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්) සමාගම
11. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය)

**2019 දෙසැම්බර් 31 වන විට බලපත්‍රලාභී ඒකක භාර කළමනාකරණ සමාගම්**

1. සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
   - සිලෝන් ඩොලර් බොන්ඩ් ෆන්ඩ්
   - සිලෝන් ෆයිනෑන්ෂල් සෙක්ටර් ෆන්ඩ්
   - සිලෝන් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - සිලෝන් ඉන්කම් ෆන්ඩ්
   - සිලෝන් ඉන්ඩෙක්ස් ෆන්ඩ්
   - සිලෝන් අයි පී ඕ ෆන්ඩ්
   - සිලෝන් මනි මාර්කට් ෆන්ඩ්
   - සිලෝන් ටුවර්සම් ෆන්ඩ්
   - සිලෝන් ට්‍රෂෙරි ඉන්කම් ෆන්ඩ්
2. කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - කොම්ට්‍රස්ට් ඒ ඩී එල් මුදරබා ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් මනි මාර්කට් ෆන්ඩ්
3. එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - එන් ඩී බී වෙල්ත් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ඉන්කම් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ඉන්කම් ප්ලස් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ඉස්ලාමික් මනි ප්ලස් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් මනි ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් මනි ප්ලස් ෆන්ඩ්
4. සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - සීබෑන්ක් සෙන්චරි ග්‍රෝත් ෆන්ඩ්
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (ී සීරීස්)
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (ඊ සීරීස්)
   - සීබෑන්ක් හයියීල්ඩ් ෆන්ඩ්
   - සීබෑන්ක් සේවින්ග්ස් ප්ලස් ෆන්ඩ් මනි මාර්කට් ෆන්ඩ්
   - සීබෑන්ක් සුරැකුම් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - සීබෑන්ක් යුනිට් ට්‍රස්ට් ෆන්ඩ්
5. නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්නාමල් ග්‍රෝත් ෆන්ඩ්
   - නාමල් හයියීල්ඩ් ෆන්ඩ්
   - නාමල් ඉන්කම් ෆන්ඩ්
   - නාමල් මනි මාර්කට් ෆන්ඩ්
   - නැෂනල් ඉක්විටි ෆන්ඩ්
   - නාමල් ගිල්ට් ෆන්ඩ්
   - නාමල් බෑන්ක් ෆන්ඩ්

# අතිරේක තොරතුරු

6. ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
- ෆස්ට් කැපිටල් ඉක්විටි ෆන්ඩ්
- ෆස්ට් කැපිටල් ෆික්ස් ඉන්කම් ෆන්ඩ්
- ෆස්ට් කැපිටල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
- ෆස්ට් කැපිටල් මනි මාර්කට් ෆන්ඩ්
- ෆස්ට් කැපිටල් වෙල්ත් ෆන්ඩ්

7. ජේ බී ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ජේ බී වැන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ්
- ජේ බී වැන්ටේජ් ෂෝර්ට් ටර්ම් ගිල්ට් ෆන්ඩ්
- ජේ බී වැන්ටේජ් වැලියු ඉක්විටි ෆන්ඩ්

8. ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
- ගාර්ඩියන් ඇක්විටි ඉක්විටි ෆන්ඩ්
- ගාර්ඩියන් ඇක්විටි මනි මාර්කට් ෆන්ඩ්
- ගාර්ඩියන් ඇක්විටි මනි මාර්කට් ගිල්ට් ෆන්ඩ්

9. කැන්ඩර් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
- කැන්ඩර් ග්‍රෝත් ෆන්ඩ්
- කැන්ඩර් මනි මාර්කට් ෆන්ඩ්
- කැන්ඩර් ඔපොචුනිටීස් ෆන්ඩ්
- අමානා කැන්ඩර් ෂාරියා බැලන්ස්ඩ් ෆන්ඩ්
- අමානා කැන්ඩර් ෂාරියා ඉන්කම් ෆන්ඩ්

10. ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ඇස්ටෘ ඇල්ෆා ෆන්ඩ්

11. කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
- කැපිටල් එලයන්ස් බැලන්ස්ඩ් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් කෝපරේට් ඩෙබිට් ඇන්ඩ් ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් කෝපරේට් ට්‍රෂෙරි ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් ගිල්ට් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් ගිල්ට් මනි මාර්කට් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් හයියිල්ඩ් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් ඉන්කම් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ග්‍රේඩ් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් මීඩියම් රිස්ක් ඩෙබිට් ෆන්ඩ්
- කැපිටල් එලයන්ස් කොන්ට්‍රේට්විව ඉක්විටි ෆන්ඩ්

12. ආර්පිකෝ අටරාසියා ඇසෙට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
- ආර්පිකෝ අටරාසියා සී එම් ටී (කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට්)
- ආර්පිකෝ අටරාසියා එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා ඉන්ඩෙක්ස් ෆන්ඩ්
- ආර්පිකෝ අටරාසියා රිපෝ ඉන්වෙස්ට්මන්ට් ෆන්ඩ්
- ආර්පිකෝ අටරාසියා ශ්‍රී ලංකා බොන්ඩ් ෆන්ඩ්

13. ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
- ප්‍රිමියර් ග්‍රෝත් ෆන්ඩ්
- ප්‍රිමියර් මනි මාර්කට් ෆන්ඩ්

14. ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ඇසෙට්ලයින් ඉන්කම් ෆන්ඩ්
- ඇසෙට්ලයින් ඉන්කම් ප්ලස් ග්‍රෝත් ෆන්ඩ්

### ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන

ආයෝජන කළමනාකරුවන් ,ආන්තික ණය සැපයුම්කරුවන් සහ කොටස් ප්‍රාරක්ෂණ ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන

| සමාගම | ආයෝජන කළමනාකරුවන් | ආන්තික ණය සැපයුම්කරුවන් | කොටස් ප්‍රාරක්ෂකයින් |
|---|---|---|---|
| අක්විටි පාර්ට්නර්ස් (පුද්ගලික ) සමාගම | | √ | |
| ADL ඉක්විටීස් ලිමිටඩ් | | √ | |
| අමානා ඇසෙට් ලිමිටඩ්ෆ | √ | | |
| ආශා ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් | | √ | |
| ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික ) සමාගම | √ | | |
| ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (පුද්ගලික ) සමාගම | √ | | |
| අසෙට්ලයින් කැපිටල් (පුද්ගලික ) සමාගම | √ | | |
| අසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් | | √ | |
| ලංකා බැංකුව | √ | | √ |
| බෙන්සෙයි සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම | | √ | |
| බාර්ට්ලීට් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | √ | | |
| කන්ඩර් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | √ | | |
| කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | √ | | |
| කැපිටල් ට්‍රස්ට් ක්‍රෙඩිට් (පුද්ගලික) සමාගම | | √ | |
| සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | √ | | |
| සිටිසන් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පී එල් සී | | √ | |

| සමාගම | ආයෝජන කළමනාකරුවන් | ආන්තික ණය සැපයුම්කරුවන් | කොටස් ප්‍රාරක්ෂකයින් |
|---|---|---|---|
| කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී එල් සී | | √ | √ |
| කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | √ | | |
| ඩී එෆ් සී සී බෑන්ක් පී එල් සී | | √ | √ |
| ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී (පෙර කලම්බු ට්‍රස්ට් ෆිනෑන්ස් පීඑල්සී ලෙස හඳුන්වන ලද) | | √ | |
| ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | √ | | |
| ෆස්ට් කැපිටල් මාර්කට් ලිමිටඩ් | | √ | |
| ගාර්ඩියන් අක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | √ | | |
| ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් | √ | | |
| හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී | | √ | √ |
| ඉනොවෙස්ට් ඉන්වෙස්ට්මන්ට් (පුද්ගලික ) සමාගම | √ | | |
| ජේ බී ක්‍රෙඩිට් (පුද්ගලික ) සමාගම | | √ | |
| ජේබී ෆිනෑන්ෂල් (පුද්ගලික ) ලිමිටඩ් | √ | | |
| එල් බී ෆිනෑන්ස් පීඑල්සී | | √ | |
| LOLC ෆිනෑන්ස් පී එල් සී | | √ | |
| ලීනියර් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික ) සමාගම | √ | | |
| මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | √ | √ | √ |
| නේෂන් ලංකා කැපිටල් ලිමිටඩ් | | √ | |
| නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | √ | | |
| නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පීඑල්සී | | √ | |
| නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් | √ | | |
| එන්ඩීබී කැපිටල් හෝල්ඩින්ස් ලිමිටඩ් | | | √ |
| එන් ඩී බී  වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික ) සමාගම | √ | | |
| ඔරියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් | √ | | |
| පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී එල් සී | | √ | |
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී | | √ | |
| පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී එල් සී | | √ | |
| ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | √ | | |
| රිච්ඩ් පීරිස් ෆයිනෑන්ස් සර්විසස් (පුද්ගලික ) සමාගම | | √ | |
| සම්පත් බෑන්ක් පී එල් සී | | √ | √ |
| සෙලාන් බෑන්ක් පී එල් සී | | √ | |
| සොෆ්ට්ලොජික් කැපිටල් පී එල් සී | √ | | |
| උනිඔන් බෑන්ක් ඔෆ් කලම්බු පී එල් සී | | √ | |
| වෝල්ඩොක් මැකෙන්සි ලිමිටඩ් | √ | √ | |

**නිශ්කාෂණ ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්:**

- මධ්‍යම තැන්පතු ක්‍රම (පුද්ගලික) සමාගම

**ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්:**

- ෆිච් රේටින්ග්ස් ලිමිටඩ්
- ඉක්රා ලංකා ලිමිටඩ්

** අමානා ඇසෙට් ලිමිටඩ් හි ආයෝජකයින්ගේ නිරවුල් කිරීම් සඳහා ලියාපදිංචිය අළුත් කරන ලදි. නව සේවාදායකයින් හෝ ආයෝජන භාර ගැනීමට සමාගමට අවසර ලබා දී නැත.

# අතිරේක තොරතුරු

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| වාර්ෂික කොටස් පිරිවැටුම (රුපියල් මිලියන) | 340,917 | 253,251 | 176,935 | 220,591 | 200,069 | 171,408 |
| දේශීය (රුපියල් මිලියන) | 246,796 | 166,151 | 102,544 | 117,135 | 111,378 | 109,003 |
| විදේශීය (රුපියල් මිලියන) | 94,120 | 87,099 | 74,391 | 103,456 | 88,691 | 62,405 |
| වෙළෙඳපොළ දින (සංඛ්‍යාව) | 241 | 239 | 240 | 241 | 240 | 241 |
| දෛනික සාමාන්‍ය කොටස් පිරිවැටුම (රුපියල් මිලියන) | 1,414 | 1,059.6 | 737.2 | 915.3 | 834 | 711 |
| ගනුදෙනු වූ කොටස් සංඛ්‍යාව (සංඛ්‍යාව මිලියන) | 16,722 | 9,414 | 7,196 | 8,468 | 6,001 | 9,855 |
| දේශීය (රුපියල් මිලියන) | 14,726 | 7,693 | 5,776 | 6,529 | 4,821 | 7,091 |
| විදේශීය (රුපියල් මිලියන) | 1,995 | 1,721 | 1,420 | 1,939 | 1,180 | 2,764 |
| කොටස් ගනුදෙනු සංඛ්‍යාව | 1,982,709 | 1,506,790 | 1,056,849 | 981,977 | 885,657 | 1,197,205 |
| දේශීය | 1,899,569 | 1,431,750 | 1,002,476 | 928,276 | 838,784 | 1,150,486 |
| විදේශීය | 83,140 | 75,040 | 54,373 | 53,701 | 46,873 | 46,719 |
| නව ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 7 | 5 | 4 | 3 | 3 | 2 |
| ලේඛනයෙන් බැහැරවීම් සංඛ්‍යාව | 3 | 3 | 2 | 2 | 2 | 10 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 294 | 294 | 295 | 296 | 297 | 289 |
| ගනුදෙනුවූ සමාගම් සංඛ්‍යාව | 284 | 278 | 240 | 279 | 279 | 279 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රුපියල් බිලියන) | 3,104.9 | 2938.0 | 2,745.41 | 2,899.29 | 2,839.45 | 2,851.31 |
| වසර අවසානයේ වෙළෙඳපොළ මිල ඉපයුම් අනුපාතය (වාර ගණන) | 19.7 | 18.0 | 12.37 | 10.60 | 9.65 | 10.83 |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ ප්‍රතිශතයක් ලෙස මුළු පිරිවැටුම (%) | 11.0 | 8.4 | 6.2 | 7.6 | 7.0 | 6.01 |
| වසර අවසානයේ ලාභාංශ ඵලදාව (%) | 2.1 | 2.18 | 2.75 | 3.19 | 3.09 | 3.17 |
| වසර අවසානයේ මිල පොත් අගය (වාර ගණන) | 2.2 | 1.99 | 1.42 | 1.31 | 1.18 | 1.14 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (%) | 31 | 30 | 24.5 | 24.5 | 21.4 | 22 |
| | | | | | | |
| **මිල දර්ශක** | | | | | | |
| සියලු කොටස් මිල දර්ශකය (ASPI) | 7,299.0 | 6894.5 | 6,228.26 | 6,369.26 | 6,052.37 | 6,129.21 |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | 23.4 | (5.5) | (9.7) | 2.3 | (5.0) | 1.27 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 (S & P Sri Lanka 20) | 4,089.1 | 3625.7 | 3,496.44 | 3,671.72 | 3,135.18 | 2,936.96 |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | 25.3 | (11.3) | (3.6) | 5.0 | (14.6) | (6.32) |
| | | | | | | |
| **මුළු ප්‍රතිලාභ දර්ශක** | | | | | | |
| සියලු කොටස් මුළු ප්‍රතිලාභ මිල දර්ශකය (ASTRI) | 9,579.2 | 9079.9 | 8,232.66 | 8,457.09 | 8,066.97 | 8,203.82 |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | 26.3 | (5.2) | (9.3) | 2.7 | (4.6) | 1.70 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය (S & P Sri Lanka 20 TRI) | 5,331.1 | 4861.5 | 4,843.17 | 5,259.85 | 4,686.71 | 4,603.57 |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | 29.0 | (8.8) | (0.4) | 8.6 | (10.9) | (1.77) |

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| **විදේශීය ක්‍රියාකාරකම්** | | | | | | |
| වාර්ෂික පිරිවැටුම (රුපියල් මිලියන) | 94,120 | 87,099 | 74,391 | 103,456 | 88,691 | 62,405 |
| මිලදී ගැනුම් (රුපියල් මිලියන) | 104,689 | 84,414 | 74,583 | 112,285 | 77,067 | 56,537 |
| විකුණුම් (රුපියල් මිලියන) | 83,550 | 89,784 | 74,199 | 94,627 | 100,315 | 68,272 |
| ශුද්ධ විදේශීය ගලා ඒම | 21,139 | (5,369.9) | 383.5 | 17,657.4 | (23,247.5) | (11,735) |
| ගනුදෙනු වූ කොටස් සංඛ්‍යාව (මිලියන) | 1,995 | 1,721.50 | 1,420 | 1,939 | 1,180 | 2,764 |
| මිලදී ගැනුම් (මිලියන) | 2,381 | 1,730.72 | 1,572 | 2,062 | 1,060 | 3,896 |
| විකිණුම් (මිලියන) | 1,610 | 1,712.27 | 1,267 | 1,817 | 1,299 | 1,631 |
| ගනුදෙනු සංඛ්‍යාව | 83,140 | 75,040 | 54,373 | 53,701 | 46,873 | 46,719 |
| මිලදී ගැනුම් (සංඛ්‍යාව) | 94,752 | 65,932 | 51,656 | 56,643 | 37,855 | 25,759 |
| විකිණුම් (සංඛ්‍යාව) | 71,529 | 84,149 | 57,091 | 50,760 | 55,892 | 67,680 |
| | | | | | | |
| **ණයකර වෙළෙඳපොළ** | | | | | | |
| සාංගමික ණයකර | | | | | | |
| මුළු පිරිවැටුම (රුපියල් 000) | 7,139,730.4 | 4,714,012.7 | 2,932,154.0 | 3,592,905.5 | 4,540,599 | 5,677,080 |
| ගනුදෙනු සංඛ්‍යාව | 401 | 220 | 291 | 529 | 293 | 234 |
| ගනුදෙනු වූ ණයකර ප්‍රමාණය (000) | 56,909 | 42,201 | 28,335 | 35,696 | 44,024 | 55,643 |
| | | | | | | |
| **රජයේ සුරැකුම්පත්** | | | | | | |
| පිරිවැටුම (රු.) | | | - | | - | |
| ගනුදෙනු සංඛ්‍යාව | | | - | | - | |
| ගනුදෙනු සංඛ්‍යාව (දහස්) | | | - | | - | |
| | | | | | | |
| **ඒකක භාර** | | | | | | |
| ශුද්ධ වත්කම් වටිනාකම (රුපියල් මිලියන) | 127,356 | 129,844 | 103,890 | 128,804 | 64.22 | 104.79 |
| ඒකක හිමියන් සංඛ්‍යාව | 32,619 | 38,140 | 41,154 | 41,037 | 42,093 | 46,481 |
| නිකුත් කර ඇති ඒකක සංඛ්‍යාව | 9,772 | 8,812 | 7,142 | 7,639 | 3,368 | 4,769 |
| කොටස් වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන) | 14,591 | 14,376 | 13,786 | 12,466 | 9,416 | 9,841 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන) | 60,897 | 28,294 | 49,299 | 24,386 | 3,379 | 9,150 |
| | | | | | | |
| අනෙකුත් උපකරණවල ආයෝජනය කර ඇති ප්‍රමාණය **(රු. මිලියන) | 52,202 | 87,272 | 40,553 | 91,732 | 50,601 | 84,542 |

තොරතුරු: කොළඹ කොටස් වෙළෙඳපොළ, ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් සිදුකරනු ලබන නියාමන ඉදිරිපත් කිරීම්.

** වාණිජ පත්‍ර, තැන්පතු සහතික,ණයකර සහ බැංකු තැන්පතු.

# වසරේ කැපී පෙනෙන අවස්ථා



ලෝක ආයෝජක සතිය ආරම්භ කරමින් මූල්‍ය සාක්ෂරතාවය සඳහා සීනුව නාද කිරීම



ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානෝත්සවය




නීති සිසුන් සඳහා පැවති වැඩමුළුව



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා මහනුවර පැවැති සම්මන්ත්‍රණය



සාංගමික ආචාරධර්ම පිළිබඳ සාකච්ඡාව




සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සම්මේලනයේ නියෝජිතයන් සමඟ පැවැති වැඩමුළුව



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා යාපනයේ පැවැති සම්මන්ත්‍රණය



පොළොන්නරුව ආයෝජක සම්මන්ත්‍රණය




මාතර පැවති ආයෝජක සම්මන්ත්‍රණය



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා මාතර පැවැති සම්මන්ත්‍රණය



ආයෝජක උපදේශකයන් සඳහා පැවැති අඛණ්ඩ වෘත්තීය සංවර්ධන සම්මන්ත්‍රණය



යාපනයේ පැවති ආයෝජක සම්මන්ත්‍රණය




යාපනයේ පැවති "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ජාතික ප්‍රදර්ශනය

# වසරේ කැපී පෙනෙන අවස්ථා



ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් ඩේවිඩ් හෝලි මහතා සමඟ පැවැති හමුව



ගුරුභවතුන් සඳහා පැවැති අධ්‍යාපන වැඩසටහනක්



ඇඹිලිපිටිය ප්‍රාදේශීය ආයෝජක සම්මන්ත්‍රණය



සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා පොළොන්නරුවේදී පැවැති සම්මන්ත්‍රණය



තිස්සමහාරාමයේ පැවති ආයෝජක සම්මන්ත්‍රණය




"ඉන්වෙස්ට් ශ්‍රී ලංකා" - සිංගප්පූරුවේදී පැවති ආයෝජක සම්මන්ත්‍රණය



ලැයිස්තුගත සමාගම් වල නියෝජිතයන් සමඟ පැවැති සාකච්ඡාව



ශ්‍රී ලංකා වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම



උසස් පෙළ සිසුන් සඳහා පැවති සම්මන්ත්‍රණය




විගණකවරුන් සහ අනෙකුත් වෙළඳපොළ පාර්ශවකරුවන් සමඟ පැවැති වටමේස සාකච්ඡාව



සබරගමු විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් සඳහා පවත්වන ලද සම්මන්ත්‍රණය



''ද ඉන්වෙස්ටර් 2020'' උසස් පෙළ රූපවාහිනී දැනුම මිනුම ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනේ මූලික වටයේ තරඟ විභාගය




ලෝක ආයෝජක සතියට සමගාමීව ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පැවැති සහ CSE සහ SEC ඒකාබද්ධ ප්‍රදර්ශන කුටිය

# මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
විගණකාධිපති වාර්තාව | 66-68

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 69

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 70

සංචිත වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 71

මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 72-73

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය
ප්‍රකාශන වලට අදාල සටහන | 74-88

පියවීම් සහතික කිරීමේ අරමුදල

විගණකාධිපති වාර්තාව | 89-90

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 91

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 92

ශුද්ධ වත්කම් වෙන්ස්වීම පිළිබඳ ප්‍රකාශය | 93

මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 94

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය
ප්‍රකාශන වලට අදාල සටහන | 95-96

# විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : බීඑෆ්/එච්/එස්ඊසී/1/19/3

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2020 අගෝස්තු 21 දින

සභාපති

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇති මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුයි

අංක. 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර,

  දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකියි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

### 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ

  පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාවේ පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

# විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇති.

  අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව



අංක: **ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| 2019 දෙසැම්බර් 31 දිනට | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 87,921,497 | 62,478,273 |
| සෙස් අරමුදල | 2 | 1,972,252,215 | 2,265,755,869 |
| වන්දි අරමුදල | 3 | 381,455,159 | 410,500,829 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 4 | 1,480,653 | 1,324,161 |
| ලැබිය යුතු දෑ | 5 | 7,906,073 | 21,609,738 |
| සෙස් අරමුදල | 2 | 817,511,467 | 505,188,942 |
| වන්දි අරමුදල | 3 | 80,508,785 | 6,941,727 |
| තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 6 | 15,521,775 | 15,346,689 |
| මුදල් හා මුදල් සමාන දේ | 7 | 168,713,076 | 29,287,171 |
| **මුළු වත්කම්** | | 3,533,270,700 | 3,318,433,400 |
| | | | |
| **අරමුදල් සහ වගකීම්** | | | |
| **යෙදවූ අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | 8 | - | - |
| සෙස් අරමුදල | 9 | 2,789,763,682 | 2,770,944,811 |
| වන්දි අරමුදල | 10 | 461,963,945 | 417,442,556 |
| | | 3,251,727,627 | 3,188,387,367 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන - ප්‍රාග්ධන වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම් | 11 | 81,571,796 | 56,128,573 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වන බැඳීම් | 13 | 43,464,269 | 44,347,652 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | | 33,316,205 | - |
| ණය හිමියෝ සහ උපචිත වියදම් | 14 | 119,841,708 | 26,625,821 |
| පූර්ව ලැබීම් | | 3,349,095 | 2,943,988 |
| **මුළු අරමුදල් හා වගකීම්** | | 3,533,270,700 | 3,318,433,400 |

74 සිට 88 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සමාජිකයන් සතුවේ.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන්**

**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**විරාජ් දයාරත්න - ජනාධිපති නීතිඥ**
සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

**ජී. පී. එන් දිල්හානි**
වැඩබලන අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

කොළඹදී
2020 ජූලි 27 වන දින දීය.

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| තැරැව්කාර බලපත්‍ර ගාස්තු | | 3,171,963 | 3,019,240 |
| පරිපාලන බදු | | 1,531,065 | 2,556,086 |
| අධ්‍යාපන වැඩසටහන් | | 4,033,843 | 4,198,430 |
| පොලී ආදායම් | | 3,728,019 | 268,284 |
| අනෙකුත් ආදායම් | | 2,015,176 | 236,753 |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ) | | - | 32,425 |
| රාජ්‍ය ප්‍රදාන - මු.ක්.න.වැ. | 12 | 81,124,254 | - |
| ප්‍රදාන හඳුනා ගැනීම | 11 | 16,513,523 | 17,585,330 |
| | | 112,117,843 | 27,896,548 |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | (233,214,148) | (231,236,983) |
| පරිපාලන හා ආයතනික පිරිවැය | 16 | (167,180,480) | (153,976,071) |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන පිරිවැය | 17 | (53,736,624) | (85,159,152) |
| මූල්‍ය ගාස්තු | 18 | (64,525) | (30,556) |
| **මුළු වියදම** | | (454,195,777) | (470,402,762) |
| | | | |
| අදායම් බදු වියදම් | 19 | (33,316,205) | - |
| **වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම** | | (375,394,139) | (442,506,214) |
| **මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම්** | | 375,394,139 | 442,506,214 |

74 සිට 88 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# සංචිත වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සෙස් අරමුදල | වන්දි අරමුදල | සමුච්චිත අරමුදල | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 2,702,455,721 | 377,637,604 | - | 3,080,093,325 |
| වර්ෂය තුල ආදායමට වැඩි අතිරික්ත වියදම | - | - | (442,506,214) | (442,506,214) |
| මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම | - | - | - | - |
| එකතු කළා: | | | | |
| වර්ෂය තුළ ලැබූ සෙස් අරමුදල් | 250,704,350 | - | - | 250,704,350 |
| වර්ෂය තුළ ඉපයූ පොලී ආදායම | 265,303,666 | 39,829,392 | - | 305,133,058 |
| | 3,218,463,737 | 417,466,996 | (442,506,214) | 3,193,424,519 |
| අඩුකළා: | | | | |
| ශුද්ධ මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම් | (447,460,218) | - | 442,506,214 | (4,954,004) |
| බැංකු ගාස්තු | (58,708) | (24,440) | - | (83,148) |
| | (447,518,926) | (24,440) | 442,506,214 | (5,037,152) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 2,770,944,811 | 417,442,556 | - | 3,188,387,367 |
| | | | | |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | 2,770,944,811 | 417,442,556 | - | 3,188,387,367 |
| වර්ෂය තුළ ආදායමට වැඩි අතිරික්ත වියදම් | - | - | (375,394,139) | (375,394,139) |
| එකතු කළා: වර්ෂය තුළ ලැබූ සෙස් අරමුදල් | 223,020,518 | - | - | 223,020,518 |
| වර්ෂය තුළ ඉපයූ පොලි ආදායම | 265,815,787 | 44,537,379 | - | 310,353,166 |
| | 3,259,781,116 | 461,979,935 | (375,394,139) | 3,346,366,912 |
| අඩුකළා: | | | | |
| ශුද්ධ මෙහෙයුම් හා ප්‍රාග්ධන වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | (417,350,885) | - | 375,394,139 | (41,956,746) |
| ඒකාබද්ධ අරමුදලට අරමුදල් මාරු කිරීම | (52,616,373) | - | - | (52,616,373) |
| බැංකු ගාස්තු | (50,176) | (15,990) | - | 66,166 |
| | (470,017,434) | (15,990) | 375,394,139 | 94,639,285 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 2,789,763,682 | 461,963,945 | - | 3,251,727,627 |

74 සිට 88 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ශ්‍රී ලංකා සු.වි.කො.ස හි ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | - | - |
| සෙස් අරමුදලෙහි ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | 18,818,871 | 68,489,090 |
| වන්දි අරමුදලෙහි ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | 44,521,389 | 39,804,952 |
| | | 63,340,260 | 108,294,042 |
| **ගැලපීම්** | | | |
| ක්ෂය වීම | 1 | 16,513,523 | 17,585,330 |
| දේපළ පිරියත හා උපකරණ විකිණීමෙන් ලද (ලාභ)/අලාභ | | - | (32,425) |
| ප්‍රදානයන් හඳුනාගැනීම | 11 | (16,513,523) | (17,585,330) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 13 | 5,558,515 | 13,045,173 |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස් වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | 5,558,515 | 13,012,748 |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස් වීම - ශ්‍රී.ල.සු.වි.කො.ස** | | | |
| තොග (වැඩිවීම)/අඩුවීම | | (156,492) | 144,555 |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 13,703,665 | (18,842,437) |
| තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | | (175,087) | (7,820,889) |
| පූර්ව ලැබීම් වැඩිවීම/(අඩුවීම) | | 405,111 | (471,920) |
| ණය හිමියන් හා උපචිති වියදම් වැඩිවීම/(අඩුවීම) | | 81,860,967 | 7,958,856 |
| ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 33,316,205 | - |
| | | 128,954,369 | (19,031,835) |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස් වීම - සෙස් අරමුදල** | | | |
| කාර්ය මණ්ඩල ණය (වැඩිවීම)/අඩුවීම | | 713,208 | 3,304,852 |
| ලැබිය යුතු සෙස් අරමුදල් (වැඩිවීම)/අඩුවීම | | (1,822,794) | (174,610) |
| සම්පත් බැංකුවෙන් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | 4,611 | 26,427 |
| ශ්‍රී ලංකා සු.වි. කො. ස. ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (84,150,977) | 7,247,079 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත ලැබිය යුතු පොලී (වැඩිවීම)/අඩුවීම | | (31,291,094) | (961,180) |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොලී (වැඩිවීම)/අඩුවීම | | 1,904,008 | (1,904,008) |
| ප්‍රතිමිලදී ගැනීම් මත ලැබිය යුතු පොලී (වැඩිවීම)/අඩුවීම | | (318,424) | 1,249,998 |
| කුලී තැන්පතු (වැඩිවීම)/අඩුවීම | | (2,475,444) | (4,843,260) |
| උපචිත වියදම් (වැඩිවීම)/අඩුවීම | | (23,756,398) | 23,756,398 |
| | | (141,193,304) | 27,701,696 |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස් වීම - වන්දි අරමුදල** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර මත ලැබිය යුතු පොලී (වැඩිවීම)/අඩුවීම | | (5,026,281) | (2,095,765) |
| ප්‍රතිමිලදී ගැනීම් මත ලැබිය යුතු පොලී (වැඩිවීම)/අඩුවීම | | (71,939) | 165,295 |
| | | (5,098,220) | (1,930,470) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට භාවිතා වූ මුදල්** | | 51,561,620 | 128,046,181 |
| වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂික | | (6,441,900) | (1,119,434) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිතා වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | 45,119,720 | 126,926,747 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ - ශ්‍රී.ල.සු.වි.කො.ස** | | | |
| දේපල පිරියත හා උපකරණ මිල දී ගැනීම් | 1 | (30,601,826) | (4,954,004) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | | | 33,493 |
| | | (30,601,826) | (4,920,511) |

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ - සෙස් අරමුදල** | | | |
| රාජ්‍ය ආයතනය තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි ආයෝජන | | (18,055,738) | (16,915,870) |
| භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය | | 295,456,866 | (67,495,152) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | | 134,892,100 | (134,892,100) |
| | | 412,293,228 | (219,303,122) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ - වන්දි අරමුදල** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය | | 29,045,670 | (64,423,057) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 29,045,670 | (64,423,057) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 410,737,072 | (288,646,690) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ - ශ්‍රී.ල.සු.වි.කො.ස** | | | |
| **ප්‍රාග්ධන අරමුදල සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම** | 11 | 41,956,746 | 4,954,004 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 41,956,746 | 4,954,004 |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 497,813,538 | (156,765,939) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | | 95,490,986 | 252,256,925 |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ)** | | 593,304,524 | 95,490,986 |
| **සටහන (අ)** | | | |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය - ශ්‍රී.ල.සු.වි.කො.ස | | 40,000,000 | - |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය - සෙස් අරමුදල | | 57,420,000 | 187,245,617 |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය - වන්දි අරමුදල | | 1,458,573 | - |
| බැංකුවේ ඇති මුදල් - ශ්‍රී.ල.සු.වි.කො.ස | | (10,752,829) | 36,352,199 |
| බැංකුවේ ඇති මුදල් - සෙස් අරමුදල | | 7,217,192 | 503,911 |
| බැංකුවේ ඇති මුදල් - වන්දි අරමුදල | | 108,050 | 28,115,198 |
| අතැති මුදල් - ශ්‍රී.ල.සු.වි.කො.ස | | 40,000 | 40,000 |
| | | 95,490,986 | 252,256,925 |
| **සටහන (ආ)** | | | |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය - ශ්‍රී.ල.සු.වි.කො.ස | | 167,595,926 | 40,000,000 |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය - සෙස් අරමුදල | | 350,000,000 | 57,420,000 |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය - වන්දි අරමුදල | | 69,852,733 | 1,458,573 |
| බැංකුවේ ඇති මුදල් - ශ්‍රී.ල.සු.වි.කො.ස | | 1,077,150 | (10,752,829) |
| බැංකුවේ ඇති මුදල් - සෙස් අරමුදල | | 4,555,987 | 7,217,192 |
| බැංකුවේ ඇති මුදල් - වන්දි අරමුදල | | 182,728 | 108,050 |
| අතැති මුදල් - ශ්‍රී.ල.සු.වි.කො.ස | | 40,000 | 40,000 |
| | | 593,304,524 | 95,490,986 |

74 සිට 88 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## 1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (ශ්‍රී.ල.සු.වි.කො.ස) ලාභ නොලබන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා සු.වි.කො.ස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරස්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 28 සහ 29 වන මහලයන් හි පිහිටුවා ඇත.

### 1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 12 වන වගන්තියට අනුකූලව, ශ්‍රී ලංකා සු.වි.කො.ස හි අරමුණු;

(අ) පිළිවෙලට සහ සාධාරණ ආකාරයට සුරැකුම්පත් නිකුත් කිරීම හා වෙළඳම් කිරීම කලහැකි වෙළඳපොළක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම;

(ආ) ආයෝජකයන්ගේ උනන්දුව ආරක්ෂා කර ගැනීම;

(ඇ) බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් හා වෙළෙන්දන් විසින් ගිවිසුම්ගත වගකීම් ඉටුකිරීමට නොහැකිවීම හේතුවෙන් සිදුවන මූල්‍යමය අලාභයන්ගෙන් ආයෝජකයන් ආරක්ෂා කර ගැනීම සඳහා වන්දි අරමුදලක් පවත්වාගෙන යාම;

(ඈ) සුරැකුම්පත් වෙළඳපොළ නියාමනය කිරීම සහ එම වෙළඳපොළ තුල වෘත්තීමය තත්වයන් පවත්වාගෙන යාම සහතික කිරීම;

සලකාබලන මූල්‍යමය කාලපරිච්ඡේදය තුල ශ්‍රී ලංකා සු.වි.කො.ස හි අරමුණු වල වෙනසක් වී නොමැත.

### 1.3 අඛණ්ඩ පැවැත්ම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන සකසා තිබේ. මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් වලින් සමන්විත වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සමාජිකයන් වගකිව යුතු වේ.

### 1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සැලකිය යුතු අනාගත කාලයක් සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කළ හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙහෙයුම් කටයුතු ඈවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කිරීම සිදු කරයි.

### 1.6 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ උපචිත පදනම මත සහ නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි වර්තමාන වටිනාකමට හඳුනානොගත් ආයුගණක තක්සේරුවෙහි ලාභය එකතු කර අතීත සේවා පිරිවැය සහ හඳුනානොගත් ආයුගණක තක්සේරුවෙහි අලාභය අඩු කර ලැබෙන නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි ශුද්ධ වගකීම හැරුණු විට ඓතිහාසික පිරිවැය පදනම මතය. එසේම යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් මඟින් හෙළිදරව් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කිරීම සිදුකර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාලපරිච්ඡේදය පුරා ඒකාකාරීව යොදාගෙන ඇත.

### 1.7 ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම් වල හෙළිදරව් කිරීම් වලට බලපාන්නා වූ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන හා ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතභාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන් වලට අනාගත කාලපරිච්ඡේද වලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු හා ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පැනමක් මත සමාලෝචනය කරනු ලැබූ ඇස්තමේන්තු වල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සටහන මඟින් පැහැදිලි කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි පිරිවැය ආයුගණක ඇගයීම් මත තීරණය කරනු ලැබේ. අයුගණක ඇගයීමකදී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම, මරණ අනුපාතිකය පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන්

එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණක ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 13 හි දැක්වේ.

**1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය**

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ශ්‍රී ලංකා සු.වි.කො.ස හි ක්‍රියාකාරී හා වර්තා කරන මුදල් ඒකකයන්හී කිසිඳු වෙනසක් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගණුදෙනු වලදී ගණුදෙණුව සිදු වන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරුව අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබයි.

**1.9 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය**

ප්‍රමාණාත්මක කාණ්ඩයන්හි සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශයන්හි වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.ප්‍රමාණාත්මභාවය අඩු අයිතමයින් හැර අසමාන ස්වභාවයක් හා කාර්යයන් සහිත අයිතමයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

**1.10 හිලව් කිරීම**

හිලව් කිරීම ශ්‍රී ලංකා රා. ගි. ප්‍ර. මගින් අවශ්‍ය කරන හෝ අවසර දී ඇති විටකදී හෝ එම හිලව් කිරීම මගින් එම ගණුදෙණුවේ හෝ වෙනත් සිදුවීමක සාරය පිළිබිඹු වීමකදී, පරිශීලකයන්ට වෙනත් සිදුවීමක තත්වය අවබෝධ කර ගැනීමට සහ සු. වි. කො. ස හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කර ගැනීම යන අවස්ථාවන්හිදී හැර වත්කම් හා වගකීම් සහ අදායම් හා වියදම් හිලව් කිරීම සිදු නොකරයි.

**1.11 සංසන්ධනාත්මක තොරතුරු**

සංසන්දනාත්මක අගයන් ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ ඉදිරිපත් වන ආකාරයෙන් වෙනස්කම් වලට යෝග්‍ය පරිදි ගැලපීම සිදුකර ඇත.

**1.12 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනට පසු වූ ප්‍රමාණාත්මක සිදු වීම් වල කරුණු සම්බන්ධව වර්තමාන මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් හා හෙළිදරව් කිරීම් අවශ්‍ය තැන්හිදි යෝග්‍ය පරිදි සිදුකරනු ඇත.

**1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්**

යොදා ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමග සංගත වේ.

## 2 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

**2.1 දේපළ පිරියත හා උපකරණ හිමිකම් සහිත දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්**

ඒවායෙහි අනෙකුත් ආනුෂාංගික වියදම් සමඟ පිරිවැයට වාර්තා කර එම වත්කම්, ඒවායෙහි ඵලදායී ජීවකාලය පුරා ක්ෂය කිරීම හෝ ක්‍රමාක්ෂය කිරීම සිදු කරයි. ප්‍රදානයන් ලෙස ලැබුණු මෙම වත්කම් පිරිවැයට වාර්තා කර ක්ෂය වීම්/ ක්‍රම ක්ෂය වීම් අදාළ සංචිත ගිණුම්වලට ගලපනු ලැබේ. ක්ෂය වීම/ ක්‍රම ක්ෂය වීම සරල මාර්ග ක්‍රමය යොදාගනිමින් ගණනය කරනු ලැබේ. මෝටර් වාහන කාර්යාල උපකරණ හා විද්‍යුත් දත්ත සැකසීමේ උපකරණ සහ පුහුණු කිරීමේ උපකරණ ඒවයේ ඵලදායී ජීවකාලය පුරා පහත සඳහන් අනුපාතයන් අදාළ කරගනිමින් ක්ෂය වීම්/ ක්‍රම ක්ෂය වීම් සිදුකර ඇත.

| | |
|---|---|
| මෝටර් වාහන | 10.00% |
| ගෘහ භාණ්ඩ, සවි කිරීම් හා උපකරණ | 12.50% |
| කාර්යාලයීය උපකරණ හා විද්‍යුත් දත්ත සැකසීමේ උපකරණ | 20.00% |
| පුහුණු කිරීමේ උපකරණ | 20.00% |

සියලුම මිලට ගත් වත්කම් භාවිතයට ගත් දිනයේ සිට විකුණනු ලබන දිනය දක්වා ක්ෂය කිරීම සිදු කෙරේ. වත්කම විකුණන වර්ෂයේදි එය ඉවත් කළ දිනය තෙක් අදාළ ක්ෂය වෙන් කිරීම සිදු කෙරේ.

දේපළ පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් සඳහා වන පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය සම්බන්ධිත නිශ්චිත වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලුම වියදම් ඒවා දරණු ලබන අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

*පරිගනක දෘඩාංග සමඟ අත්‍යවශ්‍ය නොවන පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස පෙන්වන අතර පිරිවැයට හඳුනා ගැනේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව මෙම අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සම්මුචිත ක්‍රම ක්ෂය අඩුකර ඉදිරියට ගෙන යනු ලැබේ.

**2.2 ආයෝජන**

බලපත්‍රලාභි රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු හා කෙටිකාලීන ආයෝජනවලත් රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවලත් ආයෝජන සිදුකර ඇත. සියළුම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොළී උපචිත පදනමින් සටහන් කර ඇත.

**2.3 තොග**

තොගවල අගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකින් අඩු අගය යටතේය. තොග පිරිවැය ගණනය කිරීම, පෙර පිවිසුම්, පෙර නිකුත් කිරීම FIFO පදනම යටතේ සිදු කෙරේ.

ලෝකයේ වේගයෙන් වෙනස් වෙමින් පවතින වෙළෙඳපොළ තත්ත්වයන් හේතු කොට ගෙන ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ නීති රීති ද වේගයෙන් වෙනස් වීමට භාජනය වන බැවින් ප්‍රතිපත්තියක් ලෙස පුස්තකාල පොත් වලට අදාළ අගයන් කපා හැර තිබේ.

**2.4 ලැබිය යුතු දෑ**

ඇස්තමේන්තු ගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

## 3. වගකීම් හා ප්‍රතිපාදන

**3.1.1 නිශ්චිත දායකත්ව සැලසුම - සේ.අ.අ/ සේ.භා.අ**

ආයතනයේ සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

ලබන අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සේවකයාගේ වාහන දීමනාව හැර පාරිශ්‍රමිකයෙන් 12% හා 3% ක් මේ සඳහා දායක කරනු ලැබේ.

3.1.2 **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂිකය**

පාරිතෝෂිකය පසු සේවා නියුක්ති ප්‍රතිලාභයකි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පසු සේවා නියුක්ති ප්‍රතිලාභ ගෙවීම් සඳහා බැඳී සිටී. සේවකයකු සඳහා වගකීම පැන නගින්නේ වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර සිටිනම් පමණි. කෙසේවෙතත් 2018 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක ශ්‍රී.ල.රා.ගි.ප්‍ර.19 - සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි නිර්දේශයන්ට අනුකූලව වාර්තා කරන දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලසුමෙහි වර්තමාන අගය මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වගකීමක් ලෙස හඳුනාගෙන ඇත. මෙම වගකීම බාහිරින් අරමුදල් සැපයීමක් නොවේ. හඳුනානොගත් ආයු ගණන ලාභ හෝ අලාභ හඳුනානොගත් අතීත හෝ වර්තමාන ප්‍රවර්තන සේවා පිරිවැය මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයෙහි එසැනින් හඳුනාගනු ලැබේ.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම - 2019 දෙසැම්බර් 31 දිනට සුදුසුකම්ලත් ආයුගනකඥයකු, විසින් ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 19 - නිර්දේශයන්ට අනුකූලව ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදාගනිමින් ගණනය කර ඇත.

3.2 **වගකීම්**

වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුළ හෝ ඉල්ලූ විට ගෙවිය යුතු ගෙවීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දින සිට වර්ෂයකට පසු ගෙවිය යුතු ගෙවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සටහන් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී සියළුම වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

3.3 **ප්‍රදාන**

සෙස් අරමුදල මගින් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදානයන් වශයෙන් සලකා ක්‍රමවත් පදනමක් මත අදාළ වත්කමෙහි ප්‍රයෝජනවත් ආයු කාලය තුළ දී මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

## 4. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

4.1 **ආදායම් හඳුනා ගැනීම**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි ආදායම, තැරැව්කරුවන්ගේ බලපත්‍ර ගාස්තු, පරිපාලන අයබදු, ප්‍රකාශන අලෙවි කිරීම්, අධ්‍යාපන වැඩසටහන් වලට අදාළ සම්මන්ත්‍රණ ආදායම් යනාදියෙන් සමන්විත වේ. ඉහත සඳහන් සේවාවන්/ ගාස්තු වලින් වන ආදායම අදාළ සේවාවන් ඉටුකරනු ලබන කාළ පරිච්ඡේදය තුළදීම හඳුනා ගැනේ.

4.2 **පොළී ආදායම හා වියදම**

ආයෝජන මත පොළී ආදයම හා පොළී වියදම උපචිත පදනම මත මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇත.

4.3 **අනෙකුත් ආදායම්**

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.4 **දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමෙන් ලද ලාභ හෝ අලාභ**

දේපළ පිරියත හා උපකරණ බැහැර කිරීමේදී ලැබෙන ආදයමෙන් ලියා හල අගය හා අදාල විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන ලාභ හෝ අලාභ අදාල වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කෙරේ.

## 5. වියදම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියළුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්නා අතර, එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

## 6. මුදල් ප්‍රවාහ ප්‍රකාශ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල් සහ මාස 3 ට අඩු කාලයකින් කල් පිරෙන ඒක්ෂණ තැන්පතු වලින් සමන්විත වේ.

| 2019 දෙසැම්බර් 31 දිනට | මෝටර් වාහන | ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ උපකරණ | කාර්යාල උපකරණ (විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ සහ අනෙකුත්) | පුහුණු කිරීමේ උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **1. දේපල, පිරියත හා උපකරණ** | | | | | |
| **පිරිවැය** | | | | | |
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 45,165,786 | 42,956,643 | 116,150,261 | 4,351,098 | 208,623,789 |
| වර්ෂය තුළ එකතුවීම් | - | 49,319 | 41,907,428 | - | 41,956,746 |
| වර්ෂය තුළ විකුණුම් | - | - | - | - | - |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | 45,165,786 | 43,005,962 | 158,057,690 | 4,351,098 | 250,580,535 |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 19,830,593 | 28,064,540 | 94,588,251 | 3,662,130 | 146,145,515 |
| වර්ෂය සඳහා ක්ෂය | 4,529,982 | 2,235,107 | 9,475,193 | 273,241 | 16,513,523 |
| විකුණන ලද වත්කම් වල සමුච්චිත ක්ෂය | - | - | - | - | - |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | 24,360,575 | 30,299,647 | 104,063,444 | 3,935,371 | 162,659,038 |
| **2019 දෙසැම්බර් 31 දිනය ලියා හල අගය** | 20,805,211 | 12,706,315 | 53,994,245 | 415,727 | 87,921,497 |
| **2018 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය** | 25,335,193 | 14,892,103 | 21,562,010 | 688,968 | 62,478,274 |
| **2018 දෙසැම්බර් 31 වනවිට පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද වත්කම් වල පිරිවැය (ඉහත සඳහන් පිරිවැයට ඇතුලත් කර ඇත)** | - | 19,201,459 | 78,714,962 | 3,600,533 | 101,516,953 |
| **ප්‍රයෝජනවත් ආයු කාලය (වසර ගණන)** | 10 | 8 | 5 | 5 | |
| **ක්ෂය අනුපාතය** | 10% | 12.5% | 20% | 20% | |

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| | 2019 දෙසැම්බර් 31 දිනට | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|
| 2 | **සෙස් අරමුදල** | | | |
| | **ජංගම නොවන වත්කම්** | | | |
| | ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | | 16,257,393 | 16,779,625 |
| | කුලී තැන්පතු | | 42,985,944 | 40,510,500 |
| | භාණ්ඩාගාර බැදුම්කරවල ආයෝජනය | | 1,913,008,878 | 2,208,465,744 |
| | | | 1,972,252,215 | 2,265,755,869 |
| | **ජංගම වත්කම්** | | | |
| | රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලේ ආයෝජනය | | 306,607,487 | 288,551,749 |
| | භාණ්ඩාර බිල්පත් වල ආයෝජනය | | - | 134,892,100 |
| | | | 306,607,487 | 423,443,849 |
| | මාස 12 තුළ ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | | 5,089,937 | 5,280,913 |
| | භාණ්ඩාගාර බැදුම්කර මත ලැබිය යුතු පොලිය | | 63,504,429 | 32,213,335 |
| | භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොලිය | | - | 1,904,008 |
| | ප්‍රති මිලදී ගැනීම් මත ලැබිය යුතු පොලිය | | 371,575 | 53,151 |
| | ලැබිය යුතු සෙස් අරමුදල | | 3,231,075 | 1,408,281 |
| | ලැබිය යුතු දෑ - සම්පත් බැංකුව | | - | 4,611 |
| | ලැබිය යුතු දෑ - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | | 84,150,979 | - |
| | ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනය | | 350,000,000 | 57,420,000 |
| | දෛනික ප්‍රති මිලදී ගැනීම් අතුළුව බැංකුවේ ශේෂය | | 4,555,987 | 7,217,192 |
| | | | 510,903,980 | 105,501,491 |
| | **මුළු වත්කම්** | | 817,511,467 | 528,945,340 |
| | | | 2,789,763,682 | 2,794,701,209 |
| | **වගකීම්** | | | |
| | ගෙවිය යුතු බදු කුලී තැන්පතු | | - | 4,843,261 |
| | ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙහෙයුම් වියදම් සඳහා ගෙවිය යුතු සෙස් අරමුදල | | - | 18,913,137 |
| | | | - | 23,756,398 |
| | **මුළු ශුද්ධ ජංගම වත්කම්** | | 817,511,467 | 505,188,942 |
| | **ශුද්ධ වත්කම්** | | 2,789,763,682 | 2,770,944,811 |
| 3 | **වන්දි අරමුදල** | | | |
| | **ජංගම නොවන වත්කම්** | | | |
| | භාණ්ඩාර බැදුම්කර වල ආයෝජනය | | 381,455,159 | 410,500,829 |
| | | | 381,455,159 | 410,500,829 |
| | **ජංගම වත්කම්** | | | |
| | භාණ්ඩාගාර බැදුම්කර මත ලැබිය යුතු පොලිය | | 10,399,835 | 5,373,554 |
| | ප්‍රති මිලදී ගැනීම් මත ලැබිය යුතු පොලිය | | 73,489 | 1,550 |
| | ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනය | | 69,852,733 | 1,458,573 |
| | බැංකුවේ ඇති ශේෂය | | 182,728 | 108,050 |
| | | | 80,508,785 | 6,941,727 |
| | **මුළු වත්කම්** | | 461,963,944 | 417,442,556 |

| 2019 දෙසැම්බර් 31 දිනට | | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|
| | **වගකීම්** | | - | - |
| | **ශුද්ධ වත්කම්** | | 461,963,944 | 417,442,556 |
| 4 | **තොග** | | | |
| | ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ සහ විද්‍යුත් දත්ත සැකසුම | | 1,480,653 | 1,324,161 |
| | | | 1,480,653 | 1,324,161 |
| 5 | **ලැබිය යුතු දෑ** | | | |
| | විවිධ ණයගැතියෝ | | 391,268 | 491,601 |
| | උත්සව අත්තිකාරම් | | 2,200,000 | 2,130,000 |
| | ලැබිය යුතු පොලී | | 71,114 | - |
| | දුරකථන අත්තිකාරම් | | 2,500 | 75,000 |
| | ලැබිය යුතු රක්ෂණ වන්දි | | 16,375 | |
| | සෙස් අරමුදලෙන් ලැබිය යුතු දෑ | | - | 18,913,137 |
| | සේවක අර්ථසාධක අරමුදලින් ලැබිය යුතු දෑ | | 12,000 | |
| | වැඩ තහනම් කරන ලද සේවකයකුගෙන් ලැබිය යුතු දෑ | | 5,212,816 | |
| | | | 7,906,073 | 21,609,738 |
| 6 | **තැන්පතු , අත්තිකාරම් හා පූර්ව ගෙවීම්** | | | |
| | සුරක්ෂිතාගාර තැන්පතු - ලංකා බැංකුව | | 66,843 | 61,525 |
| | ඉන්ධන තැන්පතු | | 78,000 | 78,000 |
| | ටෙලිකොම් සමාගම වෙත ඇති තැන්පතු | | 23,125 | 23,125 |
| | ඩයලොග් සමාගම වෙත ඇති තැන්පතු | | 8,500 | 8,500 |
| | උණු සහ ශීත ජලය ලැබෙන ස්වයංක්‍රීය යන්ත්‍රය | | 12,899 | 12,899 |
| | උසස් අධ්‍යාපන දායකත්වය කොළඹ විශ්ව විද්‍යාලය | | 10,000 | 10,000 |
| | ශ්‍රී ලංකා සේවා යෝජකයන්ගේ සංගමය | | 62,500 | 62,500 |
| | සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | | 15,259,908 | 15,090,140 |
| | | | 15,521,715 | 15,346,689 |
| 7 | **මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| | ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනය | | 167,595,926 | 40,000,000 |
| | බැංකුවේ ඇති මුදල් | | 1,077,150 | (10,752,829) |
| | අතැති මුදල් | | 40,000 | 40,000 |
| | | | 168,713,076 | 29,287,171 |
| 8 | **සමුච්චිත අරමුදල** | | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | | - | - |
| | වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම | | (375,394,139) | (442,506,214) |
| | සෙස් අරමුදලෙන් මාරු කිරීම් | | 375,394,139 | 442,506,214 |
| | වර්ෂය අවසානයේ ශේෂය | 8 | - | - |

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| | 2019 දෙසැම්බර් 31 දිනට | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|
| 9 | **සෙස් අරමුදල** | | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | | 2,770,944,811 | 2,702,455,721 |
| | **එකතු කළා** | | | |
| | වර්ෂය තුල ලැබූ සෙස් අරමුදල් | | 223,020,518 | 250,704,350 |
| | භාණ්ඩාගාර බිල්පත් මත පොළිය | | 31,259,630 | 18,819,878 |
| | ස්ථාවර තැන්පතු මත පොළිය | | - | - |
| | භාණ්ඩාගාර බැඳුම්කර මත පොළිය | | 223,049,955 | 239,302,298 |
| | ප්‍රති මිලදී ගැනීම් මත පොළිය | | 10,656,818 | 6,284,246 |
| | කාර්ය මණ්ඩල ණය මත පොළිය | | 849,384 | 897,244 |
| | | | 3,259,781,116 | 3,218,463,737 |
| | **අඩුකලා** | | | |
| | ශ්‍රී ලංකා සු.වි.කො. සභාවේ මෙහෙයුම් හා ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් මාරුකිරීම් | | 417,350,885 | 447,460,218 |
| | ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම | | 52,616,373 | - |
| | සෙස් අරමුදලෙන් මාරු කළ මුදල් සඳහා කල ගැලපීම | | - | - |
| | ස්ථාවර තැන්පතු මත අඩුකළ රඳවා ගැනීමේ බදු | | - | - |
| | බැංකු ගාස්තු | | 50,176 | 58,708 |
| | | | 470,017,434 | 447,518,926 |
| | **වර්ෂය අවසානයේ ප්‍රතිස්ථාපිත ශේෂය** | | 2,789,763,682 | 2,770,944,811 |

**සෙස් අරමුදල**

සෙස් අරමුදල එයට බැරවන සෙස් බද්දෙන් සහ එය මත උපයන පොළියෙන් සමන්විත වේ.

| | 2019 දෙසැම්බර් 31 දිනට | | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|---|
| 10 | **වන්දි අරමුදල** | | | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | | | 417,442,556 | 377,637,604 |
| | **එකතු කලා:** | ආයෝජන මත පොලිය ස්ථාවර තැන්පතු | | - | - |
| | | ආයෝජන මත පොලිය - භාණ්ඩාගාර බැඳුම්කර | | 42,191,522 | 37,900,412 |
| | | ආයෝජන මත පොලිය - ප්‍රති මිලදී ගැනීම් | | 2,345,856 | 1,928,980 |
| | | | | 461,979,935 | 417,466,996 |
| | **අඩුකළා:** | ස්ථාවර තැන්පතු පොලී මත රඳවා ගැනීමේ බදු | | - | - |
| | | බැංකු ගාස්තු | | 15,990 | 24,440 |
| | | | | 15,990 | 24,440 |
| | වර්ෂය අවසාසයේ ශේෂය | | | 461,963,945 | 417,442,556 |

| | | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| 11 | **ප්‍රදානයන් සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම්** | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 56,128,573 | 68,759,899 |
| | වර්ෂය තුළ සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම් | 41,956,746 | 4,954,004 |
| | ප්‍රදානයන් හඳුනා ගැනීම | (16,513,523) | (17,585,330) |
| | වර්ෂය අවසානයේ ශේෂය | 81,571,796 | 56,128,573 |
| | | | |
| | **සටහන** | | |
| | **ප්‍රදානයන් හඳුනා ගැනීම** | | |
| | පහත සඳහන් අනුපාතයන් යටතේ ප්‍රදානයන් හඳුනා ගැනේ. | | |
| | මෝටර් වාහන | 10.0 0% | 10.00% |
| | ගෘහ භාණ්ඩ සවිකිරීම් හා උපකරණ | 12.50% | 12.50% |
| | කාර්යාල උපකරණ, විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ හා අනෙකුත් | 20.00% | 20.00% |
| | පුහුණු කිරීමේ උපකරණ | 20.00% | 20.00% |

12 **ලෝක බැංකුවේ මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ වැඩසටහන (මූ.ක්.න.වැ)**

ලොක බැංකුවේ මූ.ක්.නැ.වැ. සිය ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගනු ලබන්නේ මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් නවීකරණය, මූල්‍ය ක්‍රමයේ නෛතික හා නියාමන රාමුව ඉහළ නැංවීම හා ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යන මූල්‍ය ක්ෂේත්‍රය නියාමන ආයතනවල ආයතනික හැකියාව ශක්තිමත් කිරීම තුළිනි. මෙයට අමතරව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශය ව්‍යාපෘති කළමණාකරණ ඒකකයක් පිහිටුවීම මඟින් සමස්ථ ව්‍යාපෘති සම්බන්ධීකරණයට සහය විය. මූ.ක්.න.වැ හි කොටසක් ලෙස සු.වි.කො.ස. ප්‍රධාන මුලපිරීම් ගණනාවක් සඳහා තාක්ෂණික සහය සහ ආයෝජන අරමුදල් සහය ලබා ගන්නා ලදී. ඒ අනුව නම් කරන ලද ව්‍යාපෘති 11 ක් සඳහා මෙම ව්‍යාපෘති යටතේ දළ වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 21 ක් ලබා ගැනීමට සු.වි.කො.ස කටයුතු කරයි.

2019 දෙසැම්බර් 31 වන විට මූ.ක්.න.වැ. හි ප්‍රතිඵල පාදක මූල්‍ය අංශයෙහි කොටසක් ලෙස සු.වි.කො.ස. ට රු. 81,124,254 ක මුදලක් ලැබී ඇත. මෙයට අමතරව මූ.ක්.න.වැ හි ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණයේ කොටසක් ලෙස ලෝක බැංකුව විසින් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යංශයට ලබා දී ඇති ඇමෙරිකානු ඩොලර් 367,000 (රු. 66,659,678 ට සමාන මුදලක්) සු.වි.කො.ස මගින් 2019 දෙසැම්බර් 31 දිනට මෙතෙක් ඉල්ලා අස්කරගෙන නොමැත.

| | | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|---|
| 13 | **විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වන බැඳීම** | | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | | 44,347,652 | 32,421,913 |
| | පොළී පිරිවැය | | 4,878,242 | 9,254,698 |
| | ප්‍රවර්ධන සේවා පිරිවැය | | 3,863,868 | 3,790,475 |
| | ආයු ගණක (ලාභ)/අලාභ | | (3,183,594) | - |
| | වර්ෂය තුළ ගෙවීම් | | (6,441,899) | (1,119,434) |
| | වර්ෂය අවසානයේ ශේෂය | | 43,464,269 | 44,347,652 |

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

සේවක ප්‍රතිලාභ වගකීම, ස්වාධීන ආයුගණක තක්සේරු කරනයේ විශේෂඥයින් විසින් කරන ලද ආයුගණක තක්සේරුව මත පදනම් වී ඇත. ආයු ගණන තක්සේරුව වට්ටම් අනුපාතිකය සහ වැටුප් වර්ධන අනුපාතිකය යන උපකල්පනයන් සමග සම්බන්ධ වේ. සැලැස්මෙහි ඇති දිගුකාලීන ස්වාභාවය හේතුකොටගෙන යොදාගත් උපකල්පන සැලකිය යුතු අවිනිශ්චිතතාවයන්ට යටත්වේ. සියළුම උපකල්පන සෑම වාර්තා දිනකදීම නැවත විමර්ෂණය කෙරේ.

සේවක ප්‍රතිලාභ පිරිවැය නිර්ණයේදී යොදාගත් මූලික උපකල්පනයන්,

| | 2019 | 2018 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | 10% p.a. | 11% p.a. |
| වැටුප් වර්ධක අනුපාතිකය | 8% p.a. | 8% p.a. |

13.1 **යොදාගත් උපකල්පන වල සංවේදීතාවය**

උපකල්පනයන්ගේ එක් ප්‍රතිශතයක් වෙනස් වීමෙන් පහත සඳහන් බලපෑම් ඇතිවනු ලැබේ.

| | වට්ටම් අනුපාතිකය | අනාගත වේතන ඉහළයාම |
|---|---|---|
| 1% ඉහළ යාම | රු. 40,464,635 | රු. 46,727,089 |
| 1% පහළ යාම | රු. 46,852,610 | රු. 40,541,654 |

2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා වූ ආයුගණක තක්සේරුව වෘත්තීමය ආයුගණඥයකු විසින් සිදුකරනු ලදී. ආයුගණඥයන් විසින් වගකීම තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්හි ශ්‍රී.ල.රා.අ.ගි.සු. 19 - සේවක ප්‍රතිලාභ හි නිර්දේශයන්ට අනුකූලව "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කර ඇත.

| | | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| 14 | **ණය හිමියන් සහ උපචිත වියදම්** | | |
| | දුරකථන, අන්තර්ජාල වියදම් | 630,661 | 643,644 |
| | විදුලිය | 324,872 | 340,706 |
| | කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය | 664,249 | 758,541 |
| | නිවාඩු වෙනුවට ගෙවන මුදල් | 2,533,700 | 2,434,225 |
| | විශේෂ ගෙවීම | 8,068,275 | - |
| | අතිකාල | 120,604 | 190,444 |
| | භාහිර විගණන ගාස්තු | 1,450,000 | 1,800,000 |
| | අභ්‍යන්තර විගණන ගාස්තු | 650,000 | 857,432 |
| | වෘත්තීය ගාස්තු | 1,519,430 | 300,000 |
| | මහජන දැනුවත් කිරීම් | 5,900,127 | 5,259,290 |
| | කුරියර් ගාස්තු | 12,290 | 11,786 |
| | ගෙවිය යුතු එකතුකල අගය මත බදු | - | 15,212 |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 65,700 | 46,050 |
| | තැපැල් හා මුද්දර | 575 | 475 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 1,219 | 10,740 |
| | සම්මන්ත්‍රණ වියදම් | - | 108,451 |
| | ගමන් වියදම් - දේශීය | - | 67,545 |
| | විධායක යැපුම | 42,500 | 65,000 |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | 153,130 | 146,480 |
| | නඩත්තු වියදම් - කාර්යාලීය විද්‍යුත් සැකසුම් උපකරණ සහ අනෙකුත් | 160,460 | 750 |
| | ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි සංවර්ධනය | 1,583,333 | 11,288,975 |
| | මෝටර් රථ නඩත්තු වියදම් | - | 4,500 |

| | | | 2019 | 2018 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| | අනෙකුත් ගෙවිය යුතු දෑ | | 27,794 | 42,794 |
| | සෙස් අරමුදලට කලයුතු ගෙවීම් | | 84,150,977 | - |
| | දේපල, පිරියත හා උපකරණ | | 11,354,920 | - |
| | සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දෑ | | - | 2,232,781 |
| | වෙළඳ බදු | | 5,000 | - |
| | නත්තල් උත්සව වියදම් | | 12,600 | |
| | ණය පොළී සහනාධාර | | 31,627 | |
| | නීති වියදම් | | 377,665 | |
| | | | 119,841,708 | 26,625,821 |
| 15 | **කාර්ය මණ්ඩල පිරිවැය** | | | |
| | කාර්ය මණ්ඩල වැටුප් | | 128,380,689 | 130,974,645 |
| | සභාපතිවරයාගේ දීමනා | | 1,110,000 | 826,025 |
| | අතිකාල දීමනා | | 2,500,861 | 1,994,931 |
| | සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල | | 19,625,808 | 19,964,301 |
| | කාර්ය මණ්ඩල පාරිතෝෂික | 13 | 5,558,516 | 13,045,173 |
| | ප්‍රසාද දීමනා | | 16,812,135 | 15,882,863 |
| | නිවාඩු වෙනුවට ගෙවන මුදල් | | 3,076,896 | 2,598,294 |
| | කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් හා රක්ෂණ | | 6,962,971 | 7,148,920 |
| | කාර්ය මණ්ඩල හදිසි රක්ෂණ ආවරණය | | 753,949 | 577,315 |
| | කාර්ය මණ්ඩල නිවාස ණය පොළී සහනාධාර | | 1,650,315 | 1,249,221 |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | | 5,896,137 | 4,936,970 |
| | විධායක යැපුම් | | 497,500 | 618,000 |
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉන්ධන ප්‍රතිපූර්ණ පිරිවැය 2018 පෙබරවාරි 01 දක්වා | | - | 416,120 |
| | කාර්ය මණ්ඩල වාහන දීමනා | | 22,344,097 | 19,735,833 |
| | විදෙස් ගමන් වියදම් හා පුහුණු වියදම් | | 13,547,075 | 8,417,392 |
| | කාර්ය මණ්ඩල පුහුණු වියදම් - දේශීය | | 1,530,890 | 1,071,199 |
| | සාමාජික දායක මුදල් | | 1,610,956 | 1,295,203 |
| | අධ්‍යයන සඳහා අනුග්‍රහකත්වය* | | 526,342 | 221,515 |
| | බඳවා ගැනීම් සඳහා දැන්වීම් ගාස්තු | | 786,936 | 263,063 |
| | ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා | | 42,075 | - |
| | | | 233,214,148 | 231,236,983 |

*ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා රු. 250,000/- ක උපරිමයකට යටත් වූ මුදලක් වසර තුනකට වරක් ආයතනයේ විධිවිධානවලට යටත්ව ලබාදෙන අතර, එසේ ලබාගත් සේවකයින් අදාළ පාඨමාලාව සහ විභාග සාර්ථකව සම්පූර්ණ කළ පසු අවුරුදු 2 ක කාලයක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කිරීමට බැඳී සිටී. වෙනයම් හේතුවක් හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් පාඨමාලාව සම්පූර්ණ කිරීමට නොහැකි වූ සේවකයින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දරන ලද සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතුවේ. තවද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළද, එකඟ වූ සම්පූර්ණ කාලය ආයතනයට සේවය කිරීමට අසමත් වූ සේවකයින් සම්පූර්ණ කළ යුතු ඉතිරි සේවා කාලය සඳහා ගෙවිය යුතු මුදල සමානුපාතිකව ගණනය කර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ආපසු ගෙවිය යුතුවේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| | | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|---|
| 16 | **පරිපාලන හා ආයතනික වියදම්** | | | |
| | කුලී හා රථවාහන ගාල්කුලී | | 88,188,786 | 81,979,640 |
| | විදුලි ගාස්තු | | 4,572,278 | 4,301,517 |
| | කාර්යාල නඩත්තු | | 306,062 | 251,916 |
| | කාර්යාල උපකරණ නඩත්තු හා රක්ෂණය | | 9,481,932 | 7,393,980 |
| | දුරකථන, අන්තර්ජාල, ඊ මේල් හා වෙබ් | | 883,451 | 1,044,958 |
| | විද්‍යුත් සන්නිවේදනය දත්ත සැකසුම | | 7,045,516 | 7,211,777 |
| | මෝටර් වාහන ඉන්ධන, නඩත්තු , බලපත්‍ර හා රක්ෂණ | | 4,112,084 | 2,469,207 |
| | වෘත්තීය ගාස්තු | | 3,654,797 | 3,636,994 |
| | සාමාජික ගාස්තු | | 830,000 | 851,250 |
| | රැස්වීම් ගාස්තු | | 709,885 | 591,564 |
| | විනෝදාස්වාද වියදම් | | 12,097 | 20,595 |
| | පුස්තකාල පොත් | | 36,500 | 64,746 |
| | පුවත්පත් හා වාර ප්‍රකාශන | | 666,920 | 308,176 |
| | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | | 3,711,000 | 2,858,515 |
| | දේශීය ගමන් වියදම් | | 1,452,830 | 888,689 |
| | රක්ෂණ සියලු අවදානම්, පොදු වගකීම්, ගිනි, මාර්ගස්ථ මුදල | | 254,844 | 268,590 |
| | තැපැල් හා මුද්දර ගාස්තු | | 727,653 | 53,199 |
| | කුරියර් ගාස්තු | | 179,589 | 141,156 |
| | නීති ගාස්තු | | 561,165 | 889,035 |
| | විගණන ගාස්තු -අභ්‍යන්තර | | 1,330,830 | 1,177,202 |
| | විගණන ගාස්තු -බාහිර | | 2,008,900 | 510,225 |
| | පොදු වියදම් | | 1,618,519 | 12,110 |
| | වෙළඳ බදු | | 5,000 | 5,000 |
| | එකතුකළ අගය මත බදු | | 18,147,438 | 19,283,102 |
| | ජාතිය ගොඩනැගීමේ බදු | | 168,881 | 177,598 |
| | ක්ෂය වීම් | 1 | 16,513,523 | 17,585,330 |
| | | | 167,180,480 | 153,976,071 |
| 17 | **ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වියදම්** | | | |
| | ප්‍රාග්ධන වෙළෙඳපොළ හා නිෂ්පාදිත සංවර්ධනය | | 24,669,537 | 48,933,373 |
| | මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් | | 13,407,274 | 20,632,925 |
| | සම්මන්ත්‍රණ වියදම් | | 3,480,812 | 3,636,294 |
| | අන්තර්ජාතික සාමාජික ගාස්තු | | 3,730,324 | 3,529,660 |
| | ප්‍රචාරණ හා දැන්වීම් ගාස්තු | | 482,114 | 233,800 |
| | වෙළෙඳපොළ ආවේක්ෂණ පිරිවැය | | 7,878,105 | 8,167,459 |
| | විමර්ෂණ හා පරීක්ෂණ වියදම් | | 88,458 | 25,641 |
| | | | 53,736,624 | 85,159,152 |

| | සටහන | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය වියදම්** | 18 | | |
| බැංකු ගාස්තු | | 64,525 | 30,556 |
| | | 64,525 | 30,556 |
| **ආදායම් බදු** | 19 | | |
| ආදායම් බදු වගකීම 2017 අංක 24 දරණ සංශෝධිත දේශීය අදායම් බදු පනත ප්‍රකාරව ගණනය කර ඇත. | | | |
| ආදායම් බදු වියදම 2018/2019 තක්සේරු වර්ෂය සඳහා | | 12,751,933 | - |
| ආදායම් බදු වියදම 2019/2020 තක්සේරු වර්ෂය සඳහා | | 20,564,272 | - |
| | | 33,316,205 | - |

20 තථ්‍ය ආදායම හා වියදම අයවැය ලේඛනය සමග සැසඳීම

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තථ්‍ය අදායම් හා වියදම් අයවැය ලේඛනය සමඟ සැසඳීම**

| | තථ්‍ය 2019 රු. | අයවැය 2019 රු. | විචලනය වූ යහපත/ (අයහපත්) 2019 රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| තැරැව්කාර බලපත්‍ර ගාස්තු | 3,171,963 | 3,145,000 | 26,963 |
| පරිපාලන බදු | 1,531,065 | 2,700,000 | (1,168,935) |
| අධ්‍යාපන වැඩසටහන් | 4,033,843 | 6,362,000 | (2,328,157) |
| පොලී ආදායම | 3,728,019 | - | 3,728,019 |
| අනෙකුත් ආදායම් | 2,015,176 | 350,000 | 1,665,176 |
| රාජ්‍ය ප්‍රදාන - මු.ක්.න.වැ | 81,124,254 | - | 81,124,254 |
| **ශ්‍රී ලංකා සු.වි.කො.ස.මගින් උපයාගත් මුළු ආදායම** | 95,604,320 | 12,557,000 | 83,047,320 |
| | | | |
| **අඩුකලා - වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 233,214,148 | 227,900,000 | (5,314,148) |
| පරිපාලන හා ආයතනික පිරිවැය | 150,666,957 | 174,635,605 | 23,968,648 |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය | 53,736,624 | 105,224,395 | 51,487,771 |
| මූල්‍ය ගාස්තු | 64,525 | 35,000 | (29,525) |
| **මුළු අයභාර වියදම්** | 437,682,254 | 507,795,000 | 70,112,746 |
| **අඩුකලා:** ආදායම් බදු වියදම් | 33,316,205 | - | (33,316,205) |
| **ආදායමට වැඩි අයභාර වියදම** | (375,394,139) | (495,238,000) | 46,250,719 |

74 සිට 88 දක්වා පිටුවල අඩංගු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසක් වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## 21. ප්‍රාග්ධන බැඳීම්

2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නැත.

## 22. අසම්භාව්‍ය බැරකම්

2019 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය බැරකම් කිසිවක් නැත.

## 23. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම සිදු කිරීමට අවශ්‍ය කරනු ලබන ආකාරයේ සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනට පසුව සිදුව නොමැත.

## 24. සම්බන්ධිත පාර්ශ්වයන් අනාවරණය කිරීම

රනේල් ටී. විජේසිංහ මහතා 2018 මැයි 24 දින සිට බලපැවැත්වෙන පරිදි සභාපතිවරයා ලෙස පත්කරන ලද අතර 2019 දෙසැම්බර් 02 දින ධූරකාලය අවසන් කරන ලදී. ඒ මහතා කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස 2000 ජනවාරි මස සිට 2001 දෙසැම්බර් 19 වන දින දක්වා දෙවතාවක් සහ 2015 ජනවාරි 02 දින සිට 2018 පෙබරවාරි 01 වන දින දක්වා තුන් අවුරුදු පූර්ණ ධූරකාලයක්ද හොබවා ඇත.

පහත දැක්වෙන කොමිෂන් සභා සාමාජිකයින් 2019 වර්ෂය තුළ දී පහත පරිදි ධූරයන් හොබවන ලදී.

- ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධූරය හේතුවෙන් නිල බලයෙන් පත් වූ සාමාජික
- එච්. ඒ කරුණාරත්න මහතා - මහ බැංකු නියෝජ්‍ය අධිපති ධූරයට පත්වීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ සාමාජික
- ජගත් පෙරේරා මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධූරයට පත් වීම හේතුවෙන් 2018 ජනවාරි 04 වන දින සිට බල පැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික

වර්ෂය තුළදී පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධූරකාලය අවසන් කරන ලදී.

- රජීව් අමරසූරිය මහතා 2018 මැයි මස 24 දින කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් වූ අතර 2019 දෙසැම්බර් 01 දින ධූරකාලය අවසන් කරන ලදී. ඔහු 2015 පෙබරවාරි මස 02 දින සිට කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස තුන් අවුරුදු පූර්ණ ධූර කාලයක් ද හොබවන ලදී.
- අර්ජුන හේරත් මහතා 2018 මැයි මස 24 දින කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් වූ අතර 2019 දෙසැම්බර් 03 දින ධූර කාලය අවසන් කරන ලදීග ඔහු නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයකු ලෙස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධූරයටපත් පත් වීම හේතුවෙන් 2013 දෙසැම්බර් 20 වන දින සිට 2015 දෙසැම්බර් 18 දින දක්වා අවුරුදු කාලසීමාවක් මෙම තනතුරු හොබවා ඇත.
- මංජුල ද සිල්වා මහතා 2018 මැයි මස 24 වන දින කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් වූ අතර 2019 දෙසැම්බර් 01 දින ධූර කාලය අවසන් කරන ලදී.
- ජයන්ත ප්‍රනාන්දු මහතා 2018 මැයි මස 24 වන දින කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් වූ අතර 2019 දෙසැම්බර් 01 දින ධූර කාලය අවසන් කරන ලදී.
- දේශාල් ද මෙල් මහතා 2018 ජුනි මස 28 වන දින කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් වූ අතර 2019 නොවැම්බර් 16 දින ධූර කාලය අවසන් කරන ලදී.

වර්ෂය තුළ දී පහත සඳහන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සාමාජිකයින් ධූර කාලය අවසන් කරන ලදී.

- ඒ. කේ. සෙනෙවිරත්න මහතා මහා භාණ්ඩාගාරයේ ලේකම් ධූරය හේතුවෙන් නිල බලයෙන් පත් වූ කොමිෂන් සභා සමාජිකයෙකු ලෙස 2019 පෙබරවාරි 28 දින සිට පත් වූ අතර, 2019 දෙසැම්බර් 02 දින ධූර කාලය අවසන් කරන ලදී.

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුළදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා | • ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය<br>• ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | සාමාජික (නිල බලයෙන් පත් වූ<br>සාමාජික (නිල බලයෙන් පත් වූ) |
| එච්. ඒ. කරුණාරත්න | • ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාශය<br>• ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය<br>• වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම<br>• ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව<br>• කලම්බු ඩොක්යාඩ් පී. එල්. සී | සභාපති<br>සභාපති (2019.03.01 සිට)<br>සභාපති (2019.03.01 සිට)<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක |
| ජගත් පෙරේරා මහතා | • කේ.පී. එම්. ජී.<br>• ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය<br>• ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය | හවුල්කරු<br>සභාපති<br>කළමණාකරණ මණ්ඩල සාමාජික |

කොමිෂන් සභාවේ ධූර කාලය අවසන් කළ කොමිෂන් සභා සභාපති සහ සාමාජිකයන් විසින් වසර තුළදී දරණ ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| රනේල් ටී. විජේසිංහ මහතා | - | - |
| රජීව් අමරසූරිය මහතා | • පැන්තෙරා ලියෝ කන්සල්ටන්ට් ගෲප් පුද්ගලික සමාගම<br>• ආදී උපාධිධාරීන්ගේ සංගමය - කොළඹ විශ්ව විද්‍යාලය. | අධ්‍යක්ෂක<br>සභාපති |
| අර්ජුන හේරත් මහතා | • එස්. ඩබ්ලිව්. ආර් ඩී බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම<br>• අර්න්ස්ට් සහ යංග් | කළමණාකරණ මණ්ඩල සාමාජික<br>හවුල්කරු |
| මංජුල ද සිල්වා මහතා | • ජාතික රක්ෂණ භාර අරමුදල<br>• බී. පි. පී. එල් හෝල්ඩින්ස් පී.එල්.සී සමාගම<br>• ටී. ස්මෝල් හෝල්ඩින්ස් ෆැක්ටර්ස් පී.එල්.සී සමාගම | සභාපති (2019 නොවැම්බර් 25 දක්වා)<br>අධ්‍යක්ෂක<br>අධ්‍යක්ෂක |
| ජයන්ත ප්‍රනාන්දු මහතා | • ශ්‍රී ලංකා සර්ට් (පරිගනක හදිසි සූදානම් කණ්ඩයම/ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය) | මණ්ඩල සාමාජික සහ සභාපති |
| ඒ. කේ. සෙනෙවිරත්න මහතා | - | - |
| දේශාල් ද මෙල් මහතා | • සම්පත් බැංකුව | විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂක (2019 සැප්තැම්බර් 26 දින සිට) |

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

වෙළෙඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගණුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශවයන් අතර වර්ෂය තුළදී වෙනත් කිසිදු ගණුදෙණුවක් සිදු නොවීය.

2019 වර්ෂය තුළදි පහත දැක්වෙන ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදුවිය. දේශාල් ද මෙල් මහතා සම්පත් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2019 වර්ෂය තුලදී කටයුතු කරන ලදී.

| සෙස් අරමුදල | Rs. |
|---|---|
| දිනපතා චික් රැයකින් පරිණත වන ඒක්ෂණ තැන්පතු | 422,451,000.00 |

රථවාහන, හදිසි අනතුරු, ගිනි, විදුලි උපකරණ, මාර්ගස්ථ මුදල් සහ පොදු වගකීම් යන රක්ෂණ ඔප්පු ලබා ගැනීම වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත රුපියල් 1,522,674.81 ක මුදලක් ගෙවන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභාවෙහි ප්‍රග්ධන වෙළඳපොළ සංවර්ධනය සහ පුහුණු කිරීම් අංශය මඟින් පවත්වන සම්මාන ප්‍රදානෝත්සවයයෙහි ශාලා පහසුකම් වෙනුවෙන් එස්. ඩබ්ලිව්. ආර්. ඩී බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම වෙත රු. 58,673 ක මුදලක් ගෙවන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභාවෙහි තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය සාමාලෝචනය කිරීම සඳහා 50% වන රු. 75,000 ක අත්තිකාරම් මුදලක් සහ කළමණාකරණ සේවා ගිවිසුම වෙනුවෙන් වෘත්තීය ගාස්තු ලෙස රු. 480,930 ක අත්තිකාරම් මුදලක් ශ්‍රී ලංකා සර්ට් ආයතනයට ගෙවා ඇත.

ශ්‍රවණාගාර කුලී වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත රුපියල් 147,123.74 ක මුදලක් ගෙවා ඇත.

# විගණකාධිපති වාර්තාව

පියවීම් සහතික කිරීමේ අරමුදල

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | බීඒෆ්/එච්/එස්ඊඑෆ්/1/19/4 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2020 අගෝස්තු 24 දින |

RECEIVED 2 7 AUG 2020 Chairman's Office 52

සභාපති

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ ("අරමුදල") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1998 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ලෙස අරමුදල පිහිටුවීමට සම්බන්ධ 1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 11 (ඩී) ඡේදයෙහි විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# විගණකාධිපති වාර්තාව

පියවීම් සහතික කිරීමේ අරමුදල

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇති.

වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුයි මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකියි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇති.

අංක: **ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පියවීම් සහතික කිරීමේ අරමුදල

| 2019 දෙසැම්බර් 31 දිනට | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය | | 846,311,105 | 806,068,020 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු දෑ | 5 | 21,994,316 | 17,446,315 |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනය | | 75,100,000 | 29,000,000 |
| බැංකුවේ ඇති මුදල් | | 430,853 | 479,487 |
| **මුළු වත්කම්** | | 943,836,274 | 852,993,822 |
| | | | |
| **සංකේත සහ වගේ වගකීම්** | | | |
| **සංචිත** | | | |
| ප්‍රදානයන් - භාණ්ඩාගාරය | | 50,000,000 | 50,000,000 |
| ප්‍රදානයන් - සෙස් අරමුදල | | 100,000,000 | 100,000,000 |
| ප්‍රදානයන් - කොළඹ කොටස් හුවමාරුව | | 100,000,000 | 100,000,000 |
| සමුච්චිත අරමුදල | | 657,864,114 | 602,683,822 |
| | | 907,864,114 | 852,683,822 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | | 35,822,160 | - |
| ගෙවිය යුතු දෑ | 6 | 150,000 | 310,000 |
| | | 35,972,160 | 310,000 |
| **මුළු සංචිත හා වගකීම්** | | 943,836,274 | 852,993,822 |

95 සිට 96 දක්වා පිටු වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකරුවන් සතු වගකීමකි.

**පියවීම් සහතික කිරීමේ අරමුදල වෙනුවෙන්**

**චින්තක මෙන්ඩිස්**
භාරකරු- පියවීම් සහතික කිරීමේ අරමුදල

**විරාජ් දයාරත්න - ජනාධිපති නීතිඥ**
භාරකරු- ගෙවීම් සහතික කිරීමේ අරමුදල

කොළඹදී
**2020 ජූලි 27 වන දින**

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

පියවීම් සහතික කිරීමේ අරමුදල

| 2019 දෙසැම්බර් 01 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| ආයෝජන මත පොලිය - ප්‍රතිමිලදී ගැනීම් | | 4,728,020 | 11,482,000 |
| ආයෝජන මත පොලිය භාණ්ඩාගාර බැඳුම්කර | | 86,456,672 | 65,580,842 |
| | | 91,184,692 | 77,062,842 |
| අඩු කළා; | | | |
| **වියදම්** | | | |
| විගණන ගාස්තු | | (166,370) | (15,000) |
| බැංකු ගාස්තු | | (15,870) | (17,325) |
| මුළු වියදම | | (182,240) | (32,325) |
| ආදායම් බදු වියදම | 7 | (35,822,160) | - |
| **වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම** | | 55,180,292 | 77,030,517 |

95 සිට 96 දක්වා පිටු වල අඩංගු සටහන මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

# ශුද්ධ වත්කම් වෙන්ස්වීම පිළිබඳ ප්‍රකාශය

පියවීම් සහතික කිරීමේ අරමුදල

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2019 Rs. | 2018 Rs. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 602,683,822 | 525,653,305 |
| වර්ෂය සඳහා ශුද්ධ ආදායම | 55,180,292 | 77,030,517 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 657,864,114 | 602,683,822 |

95 සිට 96 දක්වා පිටු වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පියවීම් සහතික කිරීමේ අරමුදල

| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය ගැලපීම | | 55,180,292 | 77,030,517 |
| | | | |
| **ගැලපීම්** | | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්** | | | |
| අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම | 5 | (4,548,001) | (5,492,908) |
| අනෙකුත් ගෙවිය යුතුද (වැඩිවීම)/ අඩුවීම | 6 | 35,662,160 | 15,000 |
| | | 31,114,159 | (5,477,908) |
| **මෙහෙයුම් ක්‍රියා ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | 86,294,451 | 71,552,609 |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය | | (40,243,085) | (259,380,300) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (40,243,085) | (259,380,300) |
| | | | |
| මුදල් හා සමානදෑ දැහි ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | | 46,051,366 | (187,827,691) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 29,479,487 | 217,307,178 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)** | | 75,530,853 | 29,479,487 |
| | | | |
| **සටහන (අ)** | | | |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ප්‍රතිමිල දී ගැනීම් මත ආයෝජනය | | 75,100,000 | 29,000,000 |
| බැංකුවේ ඇති මුදල් | | 430,853 | 479,487 |
| | | 75,530,853 | 29,479,487 |

95 සිට 96 දක්වා පිටු වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

පියවීම් සහතික කිරීමේ අරමුදල

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදල යන ලාභ උපයන නොලබන ආයතනයක් වන අතර ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශනයන් සකස් කර ඇත.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම් සඳහා පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකාර මණ්ඩලය වගකිව යුතුවේ.

### 1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පියවීම සහතික කිරීමේ අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව භාරකාර මණ්ඩලය විසින් තක්සේරු කර තිබේ. අවිනිශ්චිත අනාගතයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස පියවීම් සහතික කිරීමේ අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට භාරකාර මණ්ඩලයට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් භාරකාර මණ්ඩලය මෙහෙයුම් ඇවර කිරීමෙන් හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බවට ප්‍රවේක්ෂණයක් නොකරයි.

### 1.4 පිළියෙල කිරීමේ පදනම

පියවීම් සහතික කිරීමේ අරමුදල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය උපචිත පදනම මතය. යෝග්‍ය අවස්ථාවන්හිදී ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන් වල දක්වා ඇත.

### 1.5 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

භාරකරුවන් විසින් සිදුවීම් සම්පව අධීක්ෂණය කරන අතර යෝග්‍ය පරිදි ශේෂ පත්‍ර දිනට පසු ප්‍රමාණවත් සිදුවීම් වල කරුණු සම්බන්ධව වර්තමාන මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් හා හෙළිදරව් කිරීම් සිදු කරනු ඇත.

### 1.6 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස් වීම්

යොදාගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ සංගත වේ.

### 1.7 සංසන්දනාත්මක අගයන්

සංසන්දනාත්මක අගයන් ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ ඉදිරිපත් වන ආකාරයන් වෙනස්කම් වලට යෝග්‍ය පරිදි ගැලපීම් සිදු කර තිබේ.

## 2. වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකුවල ප්‍රති මිලදී ගැනීම් ආයෝජන මත සහ රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් වල පමණක් ආයෝජන සිදු කර ඇති අතර පිරිවැය යටතේ සඳහන් කර ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධිය අගයට ලැබිය යුතු අගයන් සඳහන් කර ඇත.

## 3. වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාමික ප්‍රතිලාභ

සියළුම සහතික කිරීමේ අරමුදලේ පරිපාලනමය කටයුතු භාරකරුවෙකු හරහා සිදු කරන බැවින් සහ අරමුදලේ සේවය නියුක්ත පූර්ණ කාලීන සේවක මඩුල්ලක් නොමැති බැවින් 1983 අංක 12 දරණ පාර්තෝෂික ගෙවීම් පනත ප්‍රකාරව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොගනී.

### 3.2 ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ පිරිවැය යටතේ ගණනය කෙරේ.

## 4. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආයෝජන මත පොලිය උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.2 වියදම් හඳුනා ගැනීම

අරමුදල් පවත්වාගෙන යාම සඳහා දැරූ සියළු වියදම්, වියදමට වැඩි අතිරික්ත අදායම ගණනය කිරීමේදී ආදයමෙන් අඩු කර පෙන්වා ඇත.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත්තේ පත්‍ර ක්‍රමය භාවිතා කරමිනි. මුදල් ප්‍රවාහා ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් සහ මුදල් සම්මාන දේ අතැති මුදල් හා බැංකු ඒක්ෂණ තැන්පතු වලින් සමන්විත වේ.

## 5. ලැබිය යුතු දෑ

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| ලැබිය යුතු පොලිය | | |
| - භාණ්ඩාර බැඳුම්කර | 20,915,306 | 17,238,230 |
| - ප්‍රති මිලදී ගැනීම් | 79,010 | 208,086 |
| | 21,994,316 | 17,446,316 |

## 6. ගෙවිය යුතු දෑ

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| **විගණන ගාස්තු** | 150,000 | 310,000 |
| | 150,000 | 310,000 |

## 7. ආදායම් බදු වියදම

2017 අංක 24 දරණ සංශෝධිත දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව ආදායම් බදු වගකීම ගණනය කර ඇත.

| | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| ආදායම් බදු වියදම 2018/2019 | 14,205,587 | - |
| ආදායම් බදු වියදම 2019/2020 | 21,616,573 | - |
| | 35,822,160 | - |

## 8. ප්‍රාග්ධන බැඳීම්

2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

# ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

පියවීම් සහතික කිරීමේ අරමුදල

**9. අසම්භාව්‍ය වගකීම්**

2019 දෙසැම්බර් 31 දිනට සම්භාව්‍ය වගකීම් කිසිවක් නොවීය.

**10. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

භාරකරුවන් විසින් සිදුවීම් සමීපව අධීක්ෂණය කරන අතර යෝග්‍ය පරිදි ශේෂ පත්‍ර දිනට පසු ප්‍රමාණවත් සිදුවීම් වල කරුණු සම්බන්ධව වර්තමාන මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත.

**11. සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය කිරීම.**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද කොළඹ කොටස් හුවමාරුව සභාපති සහ ප්‍රධාන නිලධාරීවරයාද මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ද පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවන් ලෙස කටයුතු කර ඇත.

පහත සඳහන් තැරැව්කරුවන් 2019 වර්ෂය තුළදී ධුරයන් දරන ලදී;

- රේ. අබේවර්ධන මහතා, කොළඹ කොටස් හුවමාරුව සභාපති
- රජීව බණ්ඩාරනායක මහතා, කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන විධායක නිලධාරි
- වජිර විජේගුණවර්ධන මහතා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අධ්‍යක්ෂ ජනරාල් (2020 පෙබරවාරි 28 දින සිට භාරකාර ධුරය අවසන් කරන් ලදී)

රනෙල් ටී විජේසිංහ මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ධුරයට පත්වීමත් සමඟ නිල බලය පදනම් කරගෙන 2018 මැයි මස 24 දින සිට බලපැවැත්වෙන පරිදි පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවෙකු ලෙස පත් කරන ලද අතර 2019 දෙසැම්බර් 2 දින ධුර කාලය අවසන් කරන ලදී.

ඒ. කේ. සෙනෙවිරත්න මහතා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තනතුරට පත් වීමත් සමඟ නිල බලය පදනම් කරගෙන 2019 පෙබරවාරි 28 දින සිට පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවකු ලෙස පත් කරන ලද අතර 2019 දෙසැම්බර් 2 දින ධුර කාලය අවසන් කරන ලදී.

වර්ෂය තුළ අරමුදලේ භාරකරුවන් විසින් දරණ ලද සම්බන්තාවය පහත වගුවෙහි දක්වා ඇත.

| භාරකරුගේ නම් | ආයතනයේ නම් | සම්බන්ධතාවය |
|---|---|---|
| රනෙල් ටී විජේසිංහ මහතා | • ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | සභාපති (2019 දෙසැම්බර් 2 දක්වා) |
| රේ අබේවර්ධන මහතා | • කොළඹ කොටස් වෙළඳපොළ | සභාපති |
| | • මධ්‍යම තැන්පතු ක්‍රම (පුද්ගලික) සමාගම | සභාපති |
| | • ලංකා වෙන්ඩර්ස් පී එල් සී | අධ්‍යක්ෂ |
| | • එල් වී එල් එනර්ජි අරමුදල් සමාගම | අධ්‍යක්ෂ |
| | • සොෆ්ට්ලොජික් ලයිෆ් පී එල් සී | අධ්‍යක්ෂ |
| | • ඇක්විටි පාර්ට්නර්ස් (පුද්ගලික) සමාගම | කළමනාකරණ අධ්‍යක්ෂ |
| | • ඇක්විටි සෙකියුරිටීස් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගම | සභාපති |
| | • ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගම | සභාපති |
| | • ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | අධ්‍යක්ෂ |
| රජීව බණ්ඩාරණායක මහතා | • කොළඹ කොටස් හුවමාරුව | ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ |
| | • ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් | අධ්‍යක්ෂ |
| ඒ කේ සෙනෙවිරත්න මහතා | • ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | කොමිෂන් සභා සාමාජික (2019 දෙසැම්බර් 2 දක්වා) |
| වජිර විජේගුණවර්ධන මහතා | • ශ්‍රී ලංකා විගණන හා ගිණුම්කරණ ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් සාමාජික |
| | • ඉදිකිරීම් ආරක්ෂක මණ්ඩලය | නිල බලයෙන් පත් සාමාජික |
| | • ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂ ජනරාල් (2020 පෙබරවාරි 28 දක්වා) |

# සාංගමික තොරතුරු

**කාර්යාලීය ලිපිනය**
28 සහ 29 වන මහළ,
නැගෙනහිර කුළුණ,
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
එච්ිලන් චතුරශ්‍රය,
කොළඹ 01,
ශ්‍රී ලංකා.

**දුරකථන**
+94 11 2143843

**ෆැක්ස්**
+94 11 2439149

**ඊ-මේල්**
mail@sec.gov.lk

**වෙබ් අඩවිය**
www.sec.gov.lk

**ගිණුම්කරණ වර්ෂය**
2019 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

**විගණකවරු**
විගණකාධිපති

**බැංකු කරුවන්**
ලංකා බැංකුව
සම්පත් බැංකුව
කොමර්ෂල් බැංකුව

This Annual Report is conceptualised, designed and produced by Redworks.

REDWORKS
Member of the Ogilvy Group

www.sec.gov.lk